

# ඵලදායී වගාවක් සමෘද්ධිමත් හෙට දිනක්

වාර්ෂික වාර්තාව - 2014

කුරුණෑගල වැවිලි සමාගම
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය



# ඵලදායී වගාවක්
# සමෘද්ධිමත් හෙට දිනක්

සමාජීය වගකීමකින් යුත් කීර්තිමත් සමාගමක් වශයෙන් මතු පරම්පරාවන්හි අනාගත සුභ සිද්ධිය උදෙසා ආයෝජනයන්හි නිරත කුරුණෑගල වැවිලි සමාගම සෑම විටම නව්‍යතාවයකින් යුතුව කටයුතු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

මෙම වසරේදී ඉතිහාසයේ ස්වර්ණමය වසර සනිටුහන් කරන අප සමාගම අව්‍යාජ ව්‍යවසායකත්වය තුලින් තිරසාර ලාභදායීත්වයක් ලබා ගැනීමට අඛණ්ඩව ක්‍රියාත්මක වේ. 'ඵලදායී වගාවක් - සමෘද්ධිමත් හෙට දිනක්' යන නව දැක්ම තුලින් අනාගත සාර්ථකත්වය තහවුරු කර ඇති අප ඵලදායී වගාවක් තුල වඩා යහපත් අනාගතයක් ඇති බව විශ්වාස කරමු.

# පටුන


අප ගැන 2

අපගේ දැක්ම, මෙහෙවර සහ මූලික සාරධර්ම 3

මූල්‍යමය උද්ධෘතයන් 4

සන්ධිස්ථාන 7

ජයග්‍රහණයන් 9

ගරු සභාපතිතුමන්ගේ සමාලෝචනය 12

ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය 16

අධ්‍යක්ෂ මණ්ඩලය 20

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය 24

පළාත් වතු අධිකාරීවරු 25

කළමනාකරණ සංවාදය සහ විශ්ලේෂණය 30

තිරසාරත්වය පිළිබඳ විමසුම 36

අවදානම් කළමනාකරණය 41

සාමූහික පාලන ප්‍රකාශය 43


# මූල්‍ය වාර්තා


අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 46

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය 49

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 50

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 51

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 52

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය 53

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 54

ගිණුම්කරණ ප්‍රතිපත්ති 56

ගිණුම්කරණ සටහන් 66

දස වසරක සාරාංශය 86

වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය 88

පෙරකලාසි අයදුම්පත 89

# අප ගැන

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව ජනතා වතු සංවර්ධන මණ්ඩලය මඟින් පාලනය වූ වතු සමූහයක කර්තව්‍ය බාරගෙන ව්‍යාපාර කටයුතු කරගෙනයාම සඳහා පිහිටුවන ලදී. 1992 ජූනි 18 වන දින සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත පොදු සමාගමක් ලෙස සංස්ථාපනය කර ඇත. පූර්ණ රාජ්‍ය අයිතිය යටතේ ඇති සමාගමක් ලෙස ක්‍රියාත්මක වන සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ සියළු කොටස් අයිතිය ස්වර්ණමය කොටස්කරුවන මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් දරණු ලබයි.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1992 ජූනි 18 වැනි දින සිට පෞද්ගලික අංශය මඟින් කළමනාකරණය කරන ලදී. වසර 13ක පමණ කාලයක් පුරා ක්‍රියාත්මක වූ පෞද්ගලික කළමනාකරණයේ පැවති දුර්වලතා තුල සමාගම ආර්ථිකමය වශයෙන් ඵලදායි නොවූ අතර සමස්ථ පසු බෑමකට ලක් විය. ඒ අනුව සමාගමේ කළමනාකාරිත්වය 2005 ජනවාරි 01 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ රජයට පවරා ගන්නා ලදි. ඉන්පසු, අමාත්‍යාංශ කිහිපයක අධීක්ෂණ යටතේ ක්‍රියාත්මක වූ සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම නව රජය යටතේ සිදුවූ නව ප්‍රතිසංස්කරණ සමඟ 2015 ජනවාරි 18 දින සිට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වේ.

සමාගම විවිධාංගීකරණයෙන් යුත් කෘෂි බෝග, එනම් පොල්, රබර් සහ වෙනත් අතුරු බෝග නිෂ්පාදනය කිරීම, සැකසුම් කිරීම සහ අලෙවිකරණය යන ක්‍රියාදාමයන් තුල යෙදී සිටි.

පලාත් වතු යායන් 08 කින් සමන්විත සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සතුව හෙක්ටයාර 5,244.58 ක භූමි ප්‍රමාණයක් ඇති අතර එය කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්ක තුනෙහි වූ විවිධ කෘෂි දේශගුණික කලාප තුල පැතිරී ඇත. සෑම පලාත් වතුයායක්ම ප්‍රාදේශිය ලේකම් කෙට්ඨාශ දෙකක් හෝ තුනක් ආවරණය වන පරිදි විහිදුණු කුඩා වතු කොටස් සමූහයකින් සමන්විත වේ.

# අපගේ දැක්ම

අග්නිදිග ආසියානු කලාපයේ ආදර්ශමත්ම වැවිලි සහ කෘෂිව්‍යාපාර කළමනාකාරිත්ව සමාගම බවට පත්වීම.

# අපගේ මෙහෙවර

ස්වාභාවික, භෞතික සහ මානව සම්පත් සමාජ වගකීමකින් යුතුව උකහා ගෙන වැවිලි සහ අනෙකුත් කෘෂිව්‍යාපාර ඵලදායී ලෙසත් ලාභදායී ලෙසත් තිරසාර ලෙසත් කළමනාකරණය කරමින් සියලු ප්‍රතිලාභීන්ගේ උන්නතිය උදෙසා කටයුතු කිරීම.


# මූලික සාරධර්ම

| | |
|---|---|
| **හොඳම සේව්‍යයා:** | ගුණාත්මකභාවය, ඵලදායීතාවය, ව්‍යවසායකත්වය, වටිනාකම් නැංවීම, ලාභදායීත්වය, පරිසර හිතකාමීභාවය සහ සාමූහික සමාජීය වගකීම යන කාරණා කෙරෙහි යොමුවූ අවංක කැපවීමෙන් යුත් සුදුසුකම්ලත් සේවක මඬුල්ලක් ගොඩනැංවීම |
| **ගුණාත්මක ප්‍රතිපාදකයා:** | අප සිදු කරන්නා වූ සියළුම කර්තව්‍යයයන්හිදී ඉහළම පාරිභෝගික තෘප්තිය සහ අඛණ්ඩ උන්නතියක් ළඟාකරගැනීමට කටයුතු කිරීම |
| **ඵලදායීතාවය:** | යොදවන සෑම සම්පත් ඒකකයකින්ම ඉහළම ඵලදායීතාවයක් ලබාගැනීම, බිම් ඒකකයකින් උපරිම අස්වැන්නක් ලබාගැනීම, තිරසාර අන්දමින් භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීම හා නාස්තිය අවම කිරීමට කටයුතු කිරීම |
| **ව්‍යවසායකත්වය:** | සියලුම අවස්ථාවන්හිදී පූර්ව ක්‍රියාකාරීත්වයන් තුළ නව ප්‍රවේශයන්ට යොමුවීම |
| **වටිනාකම නිර්මානය:** | ව්‍යාපාරික ලෝකයේ නිරන්තරයෙන් වෙනස්වන අවශ්‍යතාවයන් සඳහා යහපත් ලෙස ප්‍රතිචාර දැක්වීම |
| **ලාභදායී බව:** | ප්‍රාථමික නිෂ්පාදනයන් සහ අගය එකතු කළ නිෂ්පාදනයන් සඳහා ප්‍රශස්ත විකුණුම් මිලක් ලබාගැනීම සහ නිෂ්පාදන පිරිවැය හැකි අවම මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කිරීම |
| **පරිසර හිතකාමීබව:** | පරිසරයට හානියක් නොවන අයුරින් හෝ අවම බලපෑමක් සහිතව සම්පත් උපරිමයෙන් යොදා ගැනීම |
| **සමාජයීය වගකීම:** | යහපාලනයට ගරු කරමින් මිනිසා සහ පරිසරය රැක බලා ගැනීම |


# මූල්‍යමය උද්ධෘතයන්

| | | 2014 | 2013 | විචලනය% |
|---|---|---|---|---|
| **මෙහෙයුම් උද්ධෘතයන්** | | | | |
| පොල් අංශය | | | | |
| නිෂ්පාදනය | පොල්ගෙඩි | **16,701,797** | 13,000,150 | 28.47 |
| විකුණුම් | පොල්ගෙඩි | **16,777,304** | 13,010,454 | 28.95 |
| ශුද්ධ විකුණුම් සාමාන්‍ය (පොල් ගෙඩි 1000කට) | රු. | **30,647.16** | 30,926 | (0.90) |
| නිෂ්පාදන වියදම් (පොල් ගෙඩි 1000කට) | රු. | **15,984** | 16,386 | (2.45) |
| රබර් අංශය | | | | |
| නිෂ්පාදනය | කි.ග්‍රෑ. | **157,474** | 188,934 | (16.65) |
| විකුණුම් | කි.ග්‍රෑ. | **161,376** | 186,118 | (13.29) |
| ශුද්ධ විකුණුම් සාමාන්‍ය (කි.ග්‍රෑ. 1ට) | රු. | **252** | 330 | (23.64) |
| නිෂ්පාදන වියදම් (කි.ග්‍රෑ.1ට) | රු. | **267** | 256 | 4.30 |
| **ඉපයීම් උද්ධෘතයන්** | | | | |
| මුළු ආදායම | රු. | **576,790,774** | 475,890,175 | 21.20 |
| දළ ලාභය | රු. | **250,800,095** | 207,093,357 | 21.10 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | රු. | **103,029,740** | 95,827,085 | 7.52 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ලාභය | රු. | **222,679,652** | 193,669,763 | 14.98 |
| බදු පෙර ලාභය | රු. | **228,014,933** | 213,628,985 | 6.73 |
| බදු පසු ලාභය/ වසරේ ලාභය | රු. | **214,238,022** | 208,145,938 | 2.93 |
| දළ ලාභ ආන්තිකය | % | **43.48** | 43.52 | (0.09) |
| ශුද්ධ ලාභ ආන්තිකය | % | **37.14** | 43.74 | (15.09) |
| කොටසක ඉපැයුම | රු. | **10.71** | 10.41 | 2.88 |
| **ශේෂ පත්‍ර උද්ධෘතයන්** | | | | |
| මුළු වත්කම් | රු. | **1,794,186,896** | 1,616,447,736 | 11.00 |
| මුළු ස්කන්ධය | රු. | **1,453,569,595** | 1,280,014,666 | 13.56 |
| නිකුත් කළ කොටස් ගණන | සංඛ්‍යාව | **20,000,001** | 20,000,001 | - |
| මුදල් හා කෙටිකාලීන ආයෝජන | රු. | **409,709,538** | 335,741,661 | 22.03 |
| කොටසක ශුද්ධ වත්කම | රු. | **72.68** | 64.00 | 13.56 |
| ජංගම අනුපාතය | වාර ගණන | **6.52** | 5.61 | 16.22 |
| ක්ෂණික වත්කම් අනුපාතය | වාර ගණන | **5.69** | 4.84 | 17.56 |
| **වෙනත් තොරතුරු** | | | | |
| සේවක සංඛ්‍යාව | සංඛ්‍යාව | **1,421** | 1,400 | 1.50 |
| අර්ථ සාධක සහ භාර අරමුදල් සඳහා දායකත්වය | | | | |
| ඇතුළුව වැටුප් හා වේතන | රු. | **229,054,334** | 206,683,002 | 10.82 |
| කාර්යසාධන දිරිදීමනා | රු. | **28,779,734** | 27,429,989 | 4.92 |
| ප්‍රසාද දීමනා | රු. | **12,319,147** | 8,614,940 | 43.00 |


### මුළු ආදායම





### බදු පෙර ලාභය




### මුළු වත්කම්




### කොටසක ශුද්ධ වත්කම




රු. මි. 577

2014 මුළු ආදායම

*2013 - රු. මි. 476* + 21%

රු. මි. 1794

2014 මුළු වත්කම්

*2013 - රු. මි. 1616* + 11%

රු. මි. 228

2014 බදු පෙර ලාභය

*2013 - රු. මි. 214* + 7%

රු. 73

2014 කොටසක ශුද්ධ වත්කම

*2013 - රු. 64* + 14%


2015 පෙබරවාරි 18 දින
2010 නොවැම්බර් 16 දින
2010 ජූනි 18 දින
2007 අප්‍රේල් 18 දින
2006 ජූනි 06 දින
2005 ජනවාරි 01 දින
1992 ජූනි 18 දින

# සන්ධිස්ථාන

**2015 පෙබරවාරි 18 දින** | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත්වීම.

**2010 නොවැම්බර් 16 දින** | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම.

**2010 ජූනි 18 දින** | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම.

**2007 අප්‍රේල් 18 දින** | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය වතු කළමනාකරණ සහ සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම.

**2006 ජූනි 06 දින** | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම.


**2005 ජනවාරි 01 දින** | වසර 13 කට ආසන්න කාලයක් පැවති අකාර්යක්ෂම පෞද්ගලික කළමනාකරණය හේතු කොට ගෙන, එවකට පැවති රජය විසින් 2005 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමේ කළමනාකාරිත්වය රාජ්‍ය අංශය යටතට පවරා ගෙන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට පත් කිරීම.

**1992 ජූනි 18 දින** | එවකට පැවති රජයේ පුද්ගලීකරණ ප්‍රතිපත්තිය යටතේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ මණ්ඩල අංක (V) යටතේ පාලනය වූ වතු සමූහයක් ඒකාබද්ධ කොට 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත පොදු සමාගමක් ලෙස කුරුණෑගල වැවිලි සමාගම ස්ථාපිත කිරීම.

1992 ජූනි 18 වන දින සිට 2004 දෙසැම්බර් 31 දින දක්වා කුරුණෑගල වැවිලි සමාගමේ කළමනාකාරිත්වය පුද්ගලික අංශයේ කළමනාකරණ නියෝජිත සමාගමක් විසින් සිදු කරන ලදී.



## කාර්ය සාධනය




| රු.මි. | මුළු ආදායම | බදු පෙර ලාභය | මුදල් සහ මුදල් සමාන දෑ |
|---|---|---|---|
| 2005 | 154 | 20 | 8 |
| 2006 | 197 | 23 | 26 |
| 2007 | 294 | 82 | 48 |
| 2008 | 360 | 100 | 75 |
| 2009 | 337 | 103 | 162 |
| 2010 | 431 | 155 | 275 |
| 2011 | 510 | 225 | 321 |
| 2012 | 492 | 193 | 326 |
| 2013 | 476 | 214 | 336 |
| **2014** | **577** | **228** | **410** |

# ජයග්‍රහණයන්

## 2014

කෘෂිව්‍යාපාර සඳහා පිරිනමන ජාතික රන් සම්මානය අඛණ්ඩව 3 වරටත් හා මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා පිරිනමන රන් සම්මානය අඛණ්ඩව 4 වන වරටත් දිනාගනිමින් කුරුණෑගල වැවිලි සමාගම කෘෂිව්‍යාපාර ක්ෂේත්‍රයේ මෙන්ම වැවිලි අංශයේ ඉතිහාසය තුල නව වාර්තාවක් සනිටුහන් කරන ලදී.

## 2013

කෘෂිව්‍යාපාර සඳහා පිරිනමන ජාතික රන් සම්මානය 2 වන වරටත් දිනා ගැනීම සහ මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා පිරිනමන රන් සම්මානය අඛණ්ඩව 3 වන වරටත් දිනා ගැනීම.

## 2012


කෘෂිව්‍යාපාර සඳහා පිරිනමන ජාතික රන් සම්මානය දිනා ගනිමින් ජාතික මට්ටමේ රන් සම්මාන ලාභියෙකු බවට පත් වූ කුරුණෑගල වැවිලි සමාගම මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා පිරිනමන රන් සම්මානය නැවත වරක් දිනා ගන්නා ලදී.

## 2011


සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) කාණ්ඩයේ රන් සම්මානයෙන් පිදුම් ලැබූ අතර ජාතික මට්ටමේ කෘෂිව්‍යාපාර අතර තෙවැන්නා බවට පත්විම.

## 2005

1992 සිට 2004 දක්වා පුද්ගලික කළමනාකරණය යටතේ සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම විටින් විට බැංකු අයිරා මත ක්‍රියාත්මක වූ අතර, 1997 සිට වසර 08ක කාලසීමාවක් අඛණ්ඩව දුර්වල මුදල් ප්‍රවාහ තත්ත්වයක් යටතේ බැංකු අයිරා මත ක්‍රියාත්මක විය. 2005.01.01 දින රජය විසින් සමාගමේ කළමනාකාරිත්වය පවරා ගත් අවස්ථාවේදී රුපියල් මිලියන 7.9ක බැංකු අයිරාවක් පැවතිනි. රජයට පවරා ගැනීමත් සමඟ මෙම බැංකු අයිරාව සම්පූර්ණයෙන් පියවා දැමීමට සමාගමට හැකිවූ අතර ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් සඳහා වූ අඩිතාලම දමමින් රුපියල් මිලියන 8.2ක ධනාත්මක බැංකු ශේෂයක් 2005 වසර අවසානයේදී වාර්තා කිරීමට හැකි විය.



# කළමනාකරණ වාර්තා



# ගරු සභාපතිතුමන්ගේ සමාලෝචනය



**2013 වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 213.63 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2014 වර්ෂයේදී රු. මිලියන 228.01 ක බදු පෙර ලාභයක් වාර්තාකර ඇත. එය 6% ක වර්ධනයක් වන අතර මෙතෙක් ඉතිහාසයේ සමාගම ඉපයූ ඉහළම බදු පෙර ලාභයද වේ.**

2014 වර්ෂය සඳහා කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ලැබීම සම්බන්ධයෙන් මම ඉතා සතුටට පත්වෙමි. 2014 වර්ෂය, සමාගම විශිෂ්ඨ ප්‍රගතියක් අත්පත් කරගත් වර්ෂයකි. 2013 වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 213.63 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2014 වර්ෂයේදී රු. මිලියන 228.01 ක බදු පෙර ලාභයක් වාර්තාකර ඇත. එය 6% ක වර්ධනයක් වන අතර මෙතෙක් ඉතිහාසයේ සමාගම ඉපයූ ඉහළම බදු පෙර ලාභයද වේ.

2005 වර්ෂයේ කුරුණෑගල වැවිලි සමාගමේ කලමනාකරණය රජයට පවරා ගැනීමේ සිට පොල්, රබර් සහ අතුරුබෝග වගා වලින් යුත් සමබර බෝග විවිධාංගීකරණයක් ඇති කිරීමට ඉමහත් වෙහෙසක් ගන්නා ලදී.

අනෙකුත් වැවිලි සමාගම් සහ රාජ්‍ය ව්‍යවසායන් මෙන් නොව 2007 සිට මහා භාණ්ඩාගාරයට අඛණ්ඩව ලාභාංශ ගෙවීමට

**2014 කෘෂිව්‍යාපාර සම්මාන උළෙලේදී ජාතික කෘෂිව්‍යාපාර සඳහා වූ රන් සම්මානය තුන් වන වරටත් මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා වූ රන් සම්මානය හතර වන වරටත් දිනා ගැනීමට කුරුණෑගල වැවිලි සමාගමට හැකි විය. ඉහත සම්මාන වලට පාත්‍ර වූ කුරුණෑගල වැවිලි සමාගම කලාපීය හා අන්තර්ජාතික වශයෙන් ආදර්ශමත්ම වැවිලි සමාගම බවට පත් කිරීම අපගේ අරමුණයි.**

කුරුණෑගල වැවිලි සමාගමට හැකිවීම සම්බන්ධයෙන් මම සැබවින්ම සතුටට පත්වෙමි. 2014 වර්ෂය සඳහා යෝජිත රු. මිලියන 45 ක ලාභාංශයද ඇතුළුව 2007 වර්ෂයේ සිට මේ දක්වා රු. මිලියන 275 ක් මහා භාණ්ඩාගාරයට ලාභාංශ වශයෙන් ගෙවා ඇත.

ජාතික අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇති ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත අංශය කුඩා වතු හිමියන්ගෙන් හා මහා පරිමාණ වැවිලිකරුවන්ගෙන් සමන්විත වේ. එයට රජයේ විවිධ සහනාධාර සහ දිරි ගැන්වීම් වල සහයෝගයද ලැබී ඇත. වැවිලි කර්මාන්තය ඉහළ ශ්‍රම අවශ්‍යතාවයක් හා ඒ අනුව ඉහළ ශ්‍රම පිරිවැයක් සහිත එමෙන්ම ශක්තිමත් සේවක වෘත්තීය සමිති වලින් සැදුම්ලත් ශ්‍රමය මූලික කරගත් කර්මාන්තයකි. ඉදිරි පරම්පරාවේ ජීවන රටාවේ වෙනස් වීම් සමඟම ඉදිරියේදී මෙම කර්මාන්තයට ශ්‍රමය සපයා ගැනීම ඉතා තීරණාත්මක ගැටළුවක් වනු ඇත. තවද ඌණ ඵලදායීතාවය හා වගා නැවත ස්ථාපනය කිරීමේ පසුබෑම හේතුවෙන් වැවිලි සමාගම් තිරසාරත්ත්වය පිළිබඳ තීරණාත්මක ගැටළුවකට මුහුණ දී සිටී. අපගේ ප්‍රධාන බෝගය වන පොල් ශ්‍රී ලංකාවේ ආහාර රටාව තුල වැදගත් තැනක් හිමිකර ගෙන ඇති අතර බොහෝමයක් ආහාර පිලියෙල කිරීමේදී අත්‍යවශ්‍ය ද්‍රව්‍යක් වී ඇත. රටෙහි අඩු ආදායම් ලබන පංතිය තුල ප්‍රධාන මේදමය ආහාර ප්‍රභවය වී ඇත්තේ පොල් සහ පොල් තෙල්ය. වාර්ෂිකව මිලියන ගණනක පොල් අපනයනය කරන අතර පොල් ගෙඩි මිලියන 2000 ක් පමණ දේශීය වශයෙන් නැවුම් පොල්, පොල් තෙල් හා වෙනත් අතුරු ආහාරමය නිෂ්පාදන ලෙස පරිභෝජනය කරයි. පොල් වලින් ලබා ගන්නා තවත් වැදගත් වාණිජ නිෂ්පාදිතයක් වන්නේ පොල් තෙල්ය. එය සෘජුවම පොල් මදය සැකසීමෙන් හෝ ගුණාත්මයෙන් යුත් කොප්පරා ඇඹරීමෙන් ලබා ගත හැක. සංඛ්‍යා දත්ත වලට අනුව පසුගිය වර්ෂ 15 ක කාලය තුල ආසියානු කලාපයේ ඒක පුද්ගල තෙල් සහ මේද පරිභෝජනය කිලෝග්‍රෑම් 6.8 සිට 11 දක්වා දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩි වී ඇත. විවෘත ආර්ථික ක්‍රමය තුල පසුගිය දශක දෙක තුල පරිභෝජනයට සුදුසු තෙල් වර්ග ශ්‍රී ලංකාවට ආනයනය කිරීම ඉතා සීග්‍රයෙන් වර්ධනය වී ඇත. පරිමාව අනුව, ආනයන අතර ප්‍රධානම ස්ථානය හිමිවන්නේ පාම් තෙල් වලටය. පරිභෝජනයට සුදුසු තෙල් ආනයනය, ලෝක වෙළෙඳපොලේ තෙල් මිලට සාපේක්ෂව දේශීය පොල් තෙල් මිල තීරණය වීම සඳහා හේතුවේ. ආදේශක එළවළු තෙල් වල බහුලත්වයත්, පොල් තෙල් පරිභෝජනය හෘද රෝග සඳහා වැඩි ඉඩකඩක් ඇති කරන බවට ඇති බියත් යන කාරණා පොල් තෙල් සඳහා ඇති ඉල්ලුම කෙරෙහි අඛණ්ඩ සෘණාත්මක බලපෑමක් ඇති කර ඇත. පොල් සංවර්ධන අධිකාරියේ සංඛ්‍යා දත්ත වලට අනුව 2014 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සමස්ථ පොල් ආශ්‍රිත නිෂ්පාදිත වල අපනයන වටිනාකම රු බිලියන 72 කි. 2013 වර්ෂයේදී රු. බිලියන 17.5 ක් වූ පොල් මදය ආශ්‍රිත නිෂ්පාදිත අපනයන 2014 වර්ෂයේදී 111% කින් වර්ධනය වූ අතර 2014 වසර සඳහා එම අගය රු. බිලියන 37.1 විය. පොල් කෙඳි හා පොල් කටුව ආශ්‍රිත නිෂ්පාදිත තුලින් ලද අපනයන ආදායම 2013 වර්ෂයට සාපේක්ෂව පිලිවෙළින් 37% කින් හා 10 % කින් වර්ධනය වී ඇත. ශ්‍රී ලංකාව 2013 වර්ෂයේදී පොල් ගෙඩි මිලියන 21.45 ක් අපනයනය කල අතර 2014 වර්ෂයේ දී එය 54% ක වර්ධනයක් අත්පත් කරගනිමින් පොල් ගෙඩි මිලියන 33.07 ක් අපනයනය කර ඇත. 2013 වර්ෂයේදී ඉන් ලැබු අපනයන ආදායම රු. බිලියන 1.2 කි. එය 2014 වර්ෂයේදී 59% කින් වර්ධනය වූ අතර අපනයන ආදායම රු. බිලියන 1.9 ක් විය.

විදේශීය රටවල් මගින් සිදුකල පර්යේෂණ මගින් නැවුම් පොල් තෙල් වල අඩංගු කොලස්ටරෝල් මිනිස් ශරීරයට අහිතකර

# ගරු සභාපතිතුමන්ගේ සමාලෝචනය

නොවන බව සොයා ගැනීම තුල පොල් තෙල් සම්බන්ධයෙන් පැවතෙන වැරදි මතය මිත්‍යාවක් බවට තහවුරු වී ඇත. එය නැවුම් පොල් තෙල් සඳහා වූ ඉල්ලුම සීග්‍රයෙන් වර්ධනය වීමට හේතු විය. ලොව විශාලතම නැවුම් පොල් තෙල් සහ පිටි කල පොල් නිෂ්පාදකයා සහ අපනයනකරු වන්නේ පිලිපීනයයි. ඔවුන්ගේ ගෝලීය වෙළෙඳ පොළ දායකත්වය 80% කි. පිලිපීනය හා සසඳන කල ශ්‍රී ලංකාවේ ගෝලීය සැපයුම සැලකිය නොහැකි තරම් කුඩා ප්‍රමාණයක් වුවත් ශ්‍රී ලංකාව දෙවන විශාලම අපනයනකරු වේ. මේ වන විට පිලිපීනයේ සැපයුම ප්‍රමාණවත් නොවන තත්ත්වයක් තුල නැවුම් පොල්තෙල් මිලදී ගනු ලබන රටවල් වෙනත් විකල්ප ප්‍රභවයන් සෙවීම ආරම්භ කිරීම නිසා අපගේ වෙළෙඳපොල කොටස ඉහළ නංවා ගැනීමට අවස්ථාව උදා වී ඇත. ජපානය, යුරෝපීය රටවල් හා කොරියාව වැනි රටවලින් නැවුම් පොල් තෙල් සඳහා ඉල්ලුම වැඩි වී ඇත. ශ්‍රී ලංකාවේ පොල් වල පවතින විශේෂිත රසය හා සුවඳ හේතුවෙන් ශ්‍රී ලංකාවේ පොල් සඳහා ඉහළ පිළිගැනීමක් පවතී. ඉහත හේතූන් මෙම ක්ෂේත්‍රය වර්ධනය කිරීම සඳහා අනර්ඝ අවස්ථාවක් උදා කර ඇති අතර පොල් කර්මාන්තයෙන් ලැබෙන ආදායම වර්ධනය කරගැනීමට ද එය උපකාරී වේ. කෙසේ වෙතත් අනෙකුත් රටවල් පොල් නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් අපනයනය සඳහා යොදා ගන්නා අතර අපගේ නිෂ්පාදනයෙන් 70% ක්ම දේශීය පරිභෝජනය සඳහා භාවිතා වේ. අනෙකුත් තරගකාරී රටවල පවතින අඩු ශ්‍රම පිරිවැයද ඔවුන් සමඟ තරඟ කිරීමේ හැකියාව දුර්වල කරන තවත් එක් සාධකයක් වී ඇත.

පොල් වතුර සඳහා ගෝලීය වශයෙන් ඉහළ ඉල්ලුමක් පවතී. එම නිසා දේශීය හා විදේශීය ආයෝජකයින්ගේ ද සහයෝගය ඇතිව ශ්‍රී ලංකාව රටක් වශයෙන් පොල් වතුර වලට අදාල අපනයන මට්ටමේ ප්‍රමිතීන් උසස් කිරීම සඳහා කඩිනමින් කටයුතු කල යුතුය.

2014 කෘෂිව්‍යාපාර සම්මාන උළෙලේදී ජාතික කෘෂිව්‍යාපාර සඳහා වූ රන් සම්මානය තුන් වන වරටත් මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා වූ රන් සම්මානය හතර වන වරටත් දිනා ගැනීමට කුරුණෑගල වැවිලි සමාගමට හැකි විය. ඉහත සම්මාන වලට පාත්‍ර වූ කුරුණෑගල වැවිලි සමාගම කලාපීය හා අන්තර්ජාතික වශයෙන් ආදර්ශමත්ම වැවිලි සමාගම බවට පත් කිරීම අපගේ අරමුණයි.

ඉහත ජයග්‍රහණයන් හා ගෝලීය තත්ත්වයන් අපගේ අඛණ්ඩ වර්ධනයට හේතුවක් වී ඇති නමුදු මා විසින් සඳහන් කල යුතු තවත් කරුණක් වන්නේ සමාගම ස්ථාපිත කල දින සිට මේ දක්වා සමාගමට බාරදුන් ඉඩම් වලින් 20% පමණ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් හා ජාතික අවශ්‍යතාවයන් සඳහා නිදහස් කිරීම් තුල සමාගමේ තිරසාර අඛණ්ඩ පැවැත්මට තර්ජනයක් වී ඇති බවයි. අප සතුව ඇති ඵලදායී ඉඩම් සඳහා ඉල්ලුම දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. 2013 වර්ෂයේදී හෙක්ටයාර 5261.7 ක් අප සමාගමේ පාලනය යටතේ පැවති අතර ඉහත අවශ්‍යතාවයන් මත හෙක්ටයාර 16.59 නිදහස් කිරීම නිසා මේ වන විට හෙක්ටයාර 5244.58 ක් දක්වා එම ප්‍රමාණය අඩු වී ඇත. 1992 දී සමාගම ස්ථාපිත කරන විට සමාගම සතුව හෙක්ටයාර 6555.03 ක් පැවතුනි. එම නිසා මෙම ඵලදායී ඉඩම් වෙනුවට එම අවශ්‍යතාවය සඳහා ඵලදයී නොවන හා වගා නොකල ඉඩම් ලබා දීමට අදාල අධිකාරීන් ක්‍රියා මාර්ග දියත් කරනු ඇතැයි මා විශ්වාස කරමි.

කුරුණෑගල වැවිලි සමාගම නිරන්තරයෙන් ආයෝජන හා මෙහෙයුම් පුළුල් කිරීමේ අවස්ථා නිරීක්ෂණය කරමින් සිටින අතර ජාතික ආර්ථිකයේ උන්නතිය සඳහා අප සතු සම්පත් නිරන්තරයෙන්ම සංවර්ධනය කිරීමට අප විසින් කටයුතු කරනු ලැබේ. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමන්ටත්, ගරු වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය කේ. වේලායුදන් මැතිතුමන්ටත්, ගරු නියෝජ්‍ය අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමන්ටත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් අනුර ජයවික්‍රම මහතා ඇතුළු අමාත්‍යාංශ නිලධාරී මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කර සිටිමි. හිටපු සභාපතිවරයාට හා අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ ප්‍රණාමය පිරිනමන අතර වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලයට හා මෙම ඓතිහාසික කාර්යසාධන වාර්තා අත්පත් කරගැනීමට කැප වූ කළමනාකරණ මඩුල්ල ඇතුළු සියළුම සේවක මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුද කර සිටිමි. එමෙන්ම ඉදිරියේදී සමාගමේ උන්නතිය උදෙසා මාගේ උපරිමයෙන් ක්‍රියාකරන බවට මෙයින් සහතික වෙමි.



**පියසෝම උපාලි**


NAC
NAC
National
Agribusiness
Awards
2014
Kurunegala Plantations Limited
National
Gold Award

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි ලෙස සමාගමේ ඉතිහාසය තුල මෙතෙක් ඉපයූ වැඩිම වාර්ෂික ලාභය වාර්තා කළ 2014 වර්ෂය වෙනුවෙන් පිළියෙළ කළ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරන්නේ ඉමහත් වූ සතුටකින් හා ආඩම්බරයෙනි. 2014 වර්ෂය වැවිලි ක්ෂේත්‍රයට අභියෝගාත්මක වසරක් වුවද අප සමාගම ඉතා දුෂ්කර වූ කාලවකවානු පසු කරමින් සාර්ථක ගමනක යෙදී සිටී. ලංකා වැවිලිකරුවන්ගේ සමිතියේ වාර්තා අනුව තේ සහ රබර් වල මිල සීඝ්‍ර ලෙස පහළ යාම හා නිෂ්පාදන පිරිවැය ඉහළ යාම හේතු කොටගෙන ප්‍රාදේශීය වැවිලි සමාගම් 19 ක් 2014 වසර තුල අලාභදායී තත්ත්වයට පත්ව ඇති අතර එම සමාගම් වල ඒකාබද්ධ අලාභය රුපියල් බිලියන 2.8 ක් ලෙස වාර්තා වී ඇත.

මූලික වශයෙන් පොල් හා රබර් නිෂ්පාදන සමාගමක් වන සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 2014 වසර තුලදී සමාගමේ ඉතිහාසය තුල ලබාගත් ඉහළම ලාභය වාර්තා කිරීමට සමත්වූවා පමණක් නොව කෘෂිව්‍යාපාර සඳහා පිරිනමන ජාතික රන් සම්මානය අඛණ්ඩව 3 න් වන වරට හා මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා පිරිනමන රන් සම්මානය අඛණ්ඩව 4 වන වරටත් දිනා ගනිමින් ශ්‍රී ලංකාවේ කෘෂිව්‍යාපාර ඉතිහාසය තුල නව පරිච්ඡේදයක් සනිටුහන් කිරීමට කටයුතු කර ඇත.

## මූල්‍ය කාර්යසාධනයන්

2014 වර්ෂයේදී සමාගම අත්කරගත් මූල්‍ය කාර්යසාධනයන් පහත පරිදි වේ.

- රු. මිලියන 576.8 ක ඉහළම ආදායම
- රු. මිලියන 514.2 ක පොල් වලින් ලද ඉහළම ආදායම
- රු. මිලියන 22.9 ක අතුරුබෝග වලින් ලද ඉහළම ආදායම
- වැඩිම වෙනත් මෙහෙයුම් ආදායම ලෙස රු. මිලියන 103
- වැඩිම බදු පෙර ලාභය වන රු. මිලියන 228
- වැඩිම බදු පසු ලාභය වන රු. මිලියන 213.55
- ඉහළම කොටසක ඉපැයුම වන රු. 10.71
- වැඩිම මුදල් හා මුදල් සමාන දෑ වන රු. මිලියන 409.70

**2014 වසර තුල ජාතික මට්ටමේ පොල් නිෂ්පාදනයේ වර්ධනය පසුගිය වසරට සාපේක්ෂව 14.2% ක් වූ අතර සමාගමේ පොල් නිෂ්පාදනයේ වර්ධනය 28.5% ක් ලෙස වාර්තා විය.**

## නිෂ්පාදන හා වැවිලි කලමනාකරණ කාර්යසාධනය

### පොල් අංශය

2014 වර්ෂයේ සමාගමේ පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 16.7 ක් විය. 2014 වසර තුල ජාතික මට්ටමේ පොල් නිෂ්පාදනයේ වර්ධනය පසුගිය වසරට සාපේක්ෂව 14.2% ක් වූ අතර සමාගමේ පොල් නිෂ්පාදනයේ වර්ධනය 28.5% ක් ලෙස වාර්තා විය.

සමාගම එහි යහපත් කෘෂිකාර්මික පිළිවෙත් තවදුරටත් සාර්ථකව ඉදිරියට ක්‍රියාත්මක කරනු ලබන අතර එමගින් අයහපත් කාලගුණික විපර්යාස තුලින් නිෂ්පාදනයට ඇති කරන අහිතකර බලපෑම අවම කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

වෙළෙඳ පොලේ පොහොර හිඟයක් පැවති තත්ත්වක් තුල වුවද අස්වනු නෙලන පොල් වපසරියෙන් 65% ක ප්‍රමාණයක් සඳහා පොහොර යෙදීමට 2014 වසර තුලදී සමාගමට හැකිවිය. අප අනුගමනය කරනු ලබන යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වලට අමතරව කාබනික පොහොර යෙදීම පෙර වර්ෂයට සාපේක්ෂව 2014 වසර තුලදී 70% කින් පමණ ඉහළ නංවා ඇත. කාබනික කෘෂි නිෂ්පාදන සඳහා පවතින ඉහළ ඉල්ලුම තුල අක්කර 1952 ක වපසරියක් කාබනික පොල් වගාවක් බවට පරිවර්තනය කිරීමේ අරමුණට සමගාමීව උක්ත වැඩ පිළිවෙල සමාගම විසින් ආරම්භ කර ඇත.

අක්කරයකට ඇති පොල් ගස් සංඛ්‍යාව උපරිම කිරීමේ අපගේ අරමුණ කරා යන ගමන මනාව සංකේතවත් කරමින් 2013 වර්ෂය අවසානයේදී මුළු පොල් වගා වපසරියෙන් 19.90% ක්



වූ යටි වගා ප්‍රමාණය 2014 වසර අවසානය වන විට 20.32% ක් දක්වා වර්ධනය කිරීමට සමාගම කටයුතු කළ අතර මේරූ පොල් වගා වපසරිය තුල පාළු සිටුවීම් ලෙස පැළ 10,647 ක් ස්ථාපනය කරන ලදී. මේ වන විට සමාගමේ පොල් අක්කරයට ඇති ගස් සංඛ්‍යාව 56 ක මට්ටමේ පවතී.

වැටෙන පොල් ප්‍රමාණය අවම කිරීම තුලින් පොල් සොරකම් කිරීමට ඇති අවස්ථාව අවම කිරීමේ උපායමාර්ගයක් ලෙස මාසික පොල් කැඩුම් වපසරිය වැඩිකිරීමට සමාගම කටයුතු කර ඇත. මේ වන විට මාසික පොල් කැඩුම් වපසරිය සමස්ථ පොල් කැඩුම් වපසරියෙන් 90% ක් දක්වා වර්ධනය කර ඇත. මීට අමතරව මෙය අස්වැන්න වැඩි කර ගත හැකි විද්‍යාත්මක ක්‍රමවේදයක්ද වේ. කුරුණෑගල වැවිලි සමාගම දේශීය පරිභෝජනයට හා පොල් කර්මාන්තයට ඉතා උසස් තත්ත්වයේ පොල් සපයන්නෙකු ලෙස ක්‍රියා කරයි. උසස් ගුණාත්මයෙන් යුත් පොල් නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම හා ඉහළ පාරිභෝගික සුරක්ෂිතතාවය තුල 2014 වසරේ බොහෝ අවස්ථාවලදී ප්‍රසිද්ධ පොල් වෙන්දේසියේ සාමාන්‍ය විකුණුම් මිල අභිබවා යෑමට කුරුණෑගල වැවිලි සමාගමට හැකිවිය.

## රබර් අංශය සහ වෙනත් බෝග

මෙම වර්ෂය රබර් සඳහා ඉතා අහිතකර වර්ෂයක් වූ අතර සමාගමේ නිෂ්පාදනය 2013 වර්ෂයට සාපේක්ෂව 17% කින් පහළ බසින ලදී. කෙසේ වෙතත් ජාතික රබර් නිෂ්පාදනයේ පහළ යාම 24.4% ක් ලෙස වාර්තා විය. වසරේ මුල් භාගය තුල පැවති දැඩි නියගයත් කිරි කැපීමට බාධාවන අයුරින් තෙවන කාර්තුවේදී ඇදහැලුනු දැඩි වර්ෂාපතනයත් රබර් නිෂ්පාදනයේ පහළ යාමට හේතු විය. මීට අමතරව ස්වාභාවික රබර් සඳහා ඇති අන්තර්ජාතික ඉල්ලුම පහළයාම හේතුවෙන් ඉතා අඩු මිලක් ලැබීමද රබර් ආදායම පහළ යාම සඳහා හේතු විය.

2013 වසරේදී රුපියල් 330/- ක් වූ රබර් කිලෝවක සාමාන්‍ය විකුණුම් මිල 2014 වසරේදී රුපියල් 252/- ක් දක්වා පහත

වැටුනි. ප්‍රධාන බෝග කීපයක් මත යැපීමේ අවදානම අවම කිරීම, ඉඩම් ඒකකයකින් ලබන ආදායම උපරිම කිරීම සහ භූමියේ ඵලදායීතාවය හැකි උපරිම අයුරින් උකහා ගැනීම යන කාරණා පදනම්ව කුරුණෑගල වැවිලි සමාගම පොල් යටතේ අතුරු බෝග වගා කිරීම තව දුරටත් පුළුල් කල අතර වර්තමානය වන විට එය අක්කර 1047.55 ක් පමණ වේ. 2013 වසරේදී රුපියල් මිලියන 11.1 ක් වූ අතුරු බෝග වලින් ලද ආදායම 2014 වසර වනවිට රුපියල් මිලියන 22.9 ක් දක්වා 106% කින් වර්ධනය විය. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගයද ඇතිව සමාගම කුරුඳු පැළ 53000 ක් ද ටී.ඊ.ජේ.සී. අඹ පැළ 1500 ක් ද ඩ්‍රැගන් පෘට් පැළ 2250 ක් ද රඹුටන් පැළ 272 ක් ද පුවක් පැළ 200 ක් ද 2014 වසර තුල ස්ථාපනය කරන ලදී.

> **2013 වසරේදී රුපියල් මිලියන 11.1 ක් වූ අතුරු බෝග වලින් ලද ආදායම 2014 වසර වනවිට රුපියල් මිලියන 22.9 ක් දක්වා 106% කින් වර්ධනය විය.**

වර්තමාන හා අනාගත ඉල්ලුම සලකා බලා සමාගම සාම්ප්‍රදායික නොවන බෝග සඳහා යොමු වී ඇත. අතුරු බෝග වගාව තුලින් භූමියේ ඵලදායීතාවය වැඩි කිරීම සඳහා සමාගම ගනු ලැබූ නිවැරදි හා කාලීන ප්‍රතිපත්තිමය තීරණයේ ප්‍රතිඵල අනාගතයේදී නිසැකවම සමාගමට ලබා ගැනීමට හැකිවනු ඇත.

## ජාතික මට්ටමින් ඇගයීමට ලක්වීම

කුරුණෑගල වැවිලි සමාගමේ කළමනාකාරිත්වය රජයට පවරා ගැනීමේ සිට අප අපගේ උපරිම හැකියාවෙන් යුක්තව සමාගමේ මෙහෙයුම් කටයුතු සිදු කරන ලදී. 2014 ඔක්තෝබර් 24 වන දින අතිගරු ජනාධිපතිතුමන් විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අයවැය කථාවේදී කුරුණෑගල වැවිලි සමාගම ඇගයීමට ලක් කිරීම සැබවින්ම කුරුණෑගල වැවිලි සමාගම විශේෂ ගෞරවයට පාත්‍ර වූ අවස්ථාවක් ලෙස සැළකිය යුතුය. පහත දක්වා ඇත්තේ 2014 ඔක්තෝබර් 24 දිනැති පාර්ලිමේන්තු විවාද - 230 වන කාණ්ඩය - 1 වන කලාපය යටතේ නිකුත් කරන ලද හැන්සාඩ් වාර්තාවේ උපුටා ගැනීමකි.

**"රජය සතු කුරුණෑගල හා හලාවත වැවිලි සමාගම් ඉතා හොඳින් ක්‍රියාත්මක වී තිබෙන අතර භාණ්ඩාගාරයටද ලාභාංශ ගෙවා තිබෙනවා. මෙම සාර්ථකත්වය මත ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ හා ලංකා වැවිලි සමාගම් සතු වැවිලි ඉඩම් සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 1000 ක ප්‍රාග්ධනය යොදා රජය සතු වැවිලි සමාගමක් පිහිටුවීමටද යෝජනා කරනවා"**

ඉහත ප්‍රකාශයෙන් වඩාත් පැහැදිලි වන්නේ අයිතිය හා කළමනාකරණය රජය සතු ව්‍යාපාරයක් ලෙස කුරුණෑගල වැවිලි සමාගම ඉහළම මට්ටමේ පිලිගැනීමකට පාත්‍ර වී ඇති බවත්, එය සමාගමට ගෞරවාන්විත අනන්‍යතාවයක් හා ඉතා උසස් නිර්ණායකයක් ලබා දී ඇති බවත්ය. දේශීය හා ගෝලීය වශයෙන් පවතින අහිතකර වෙළෙඳ පොළ තත්ත්වයක් හා අභියෝගාත්මක පරිසරයක් තුල මෙන්ම කෘෂිව්‍යාපාර තුල නියැලී සිටින බොහෝ ශ්‍රී ලාංකීය සමාගම් ඌන කාර්ය සාධනයක් පෙන්නුම් කරන අවස්ථාවක මෙවැනි වූ ජයග්‍රහණයන් අත්පත් කර ගැනීමට කුරුණෑගල වැවිලි සමාගමට හැකිවීම සැබවින්ම අති විශිෂ්ඨ ජයග්‍රහණයකි. කෘෂිව්‍යාපාර තුල නියැලී සිටින අනෙකුත් ආයතන අතර ඉහළින් සිටීමට කුරුණෑගල වැවිලි සමාගමට හැකි වී ඇත්තේ මේ හේතුවෙනි. කුරුණෑගල වැවිලි සමාගම 1992 වසරේ ස්ථාපිත කළ දින සිට 2005 වර්ෂයේ සමාගමේ කළමනාකාරිත්වය රජයට පවරා ගන්නා තුරු සමාගමේ ක්‍රියාකාරිත්වය ඉතාමත්ම දුර්වල තත්ත්වයක පැවතිනි. කෙසේ වෙතත් කළමනාකාරිත්වය රජයට පවරා ගැනීමෙන් අනතුරුව අභිප්‍රේරණය වූ, අවංක මෙන්ම වෘත්තීමය විශේෂඥතාවය හා විශේෂීකරණයකින් යුත් ජ්‍යෂ්ඨ කළමනාකාරීත්වයේ කැපවීම තුල කුරුණෑගල වැවිලි සමාගම වඩාත් පැහැදිලි අනාගතයක් සහිත කෘෂිව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමට හැකි විය. වාර්ෂිකව වාර්තාගත කාර්ය සාධනයන් සනිටුහන් කරමින් කෘෂි ව්‍යවසායන් ලෙස ක්‍රියාත්මක වීම ශ්‍රී ලංකා කෘෂිව්‍යාපාර ක්ෂේත්‍රයේ ඉතා දුලභ අවස්ථාවක් ලෙස ගෙනහැර දැක්විය හැකිය.

## අනාගත දැක්ම

සාපේක්ෂව පහළ ශ්‍රම ඵලදායීතාවයක් හා ඉහළ ශ්‍රම පිරිවැයක් පැවතීම හේතුවෙන් වැවිලි අංශය ලාභදායී නොවන අංශයක් බවට සීග්‍රයෙන් පත්වෙමින් පවතී. තත්ත්වයෙන් උසස් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා අගය එකතු කිරීම තුලින් ඉහළ මිලක් ලබා ගැනීම අත්‍යවශ්‍ය උපායමාර්ගයක් වී ඇත.

ඵලදායිතාවය ඉහළ දැමීම සඳහා යාන්ත්‍රික අස්වනු නෙලීම වැනි ක්‍රමෝපායන් භාවිතය මෙන්ම වතු කම්කරුවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම ඉතා වැදගත් වන අතර එය ජාතික මට්ටමින් ස්ථාපිත කිරීමේ වගකීම හා කාර්යභාරය රජය සතුව


පවතී. මෑත කාලයේදී අත්විඳි කාලගුණ රටාවේ සැලකිය යුතු වෙනස්වීම් කෘෂිකාර්මික කටයුතු වල නියැලීමේ හා අස්වනු නෙලීමේ කාල නිර්ණයන් සඳහා බලපා ඇත. මෙම සියළු තත්ත්වයන් හේතුවෙන් වැවිලි කර්මාන්ත අංශය ආයෝජනය සඳහා සාපේක්ෂව වැඩි විචලනයක් සහිත අංශයක් බවට පත්වී ඇත. වැවිලි අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා වඩාත් ගැලපෙන සාර්ව ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම තුලින් පාර්ශවකරුවන් සඳහා විශ්වාසනීය හා තිරසාර තත්ත්වයක් උදාවනු ඇත.

මෙහිදී ඵලදායිතාවය ප්‍රධාන ගැටළුවක් වන අතර ශ්‍රී ලංකාවේ වැවිලි ක්ෂේත්‍රයේ පැවැත්ම සඳහා ශ්‍රම ඵලදායිතාවය සැලකිය යුතු ලෙස ඉහළ දැමීම කළයුතු හා කළහැකි අංගයක් ලෙස හඳුනාගත යුතුය. මෙහිදී වතු කම්කරු වෘත්තිය සමිතිද ඵලදායිතාවය ඉහළ දැමීම යන කාරණය හඳුනාගෙන ඇත. එම තත්ත්වය ක්ෂේත්‍රයේ පැවත්මට ඉතා වැදගත් පදනමක් වනු ඇත. කෙසේ වෙතත් මෙම අභියෝග හමුවේ වුවද කුරුණෑගල වැවිලි සමාගම අග්නිදිග ආසියාතික කලාපයේ ආදර්ශමත්ම වැවිලි සමාගම බවට පත්කිරීමේ අභිලාශයෙන් යුතුව අප ඉදිරියට පියවර තබන්නෙමු.

දේශීය හා විදේශීය වශයෙන් පවතින ඉහළ ඉල්ලුම හේතුවෙන් නැවුම් පොල් තෙල් කර්මාන්තයට පිවිසීමේ දැඩි උනන්දුවෙන් යුතුව අප කටයුතු කරමු. අනෙකුත් අගය එකතු කල පොල් ආශ්‍රිත නිෂ්පාදිත වලට සාපේක්ෂව නැවුම් පොල් තෙල් සඳහා දේශීය හා විදේශීය වෙළෙඳපොලේ ඉහළ මිලක් පවතී. 2015 වර්ෂයේ දී පෞද්ගලික අංශය සමග ඒකාබද්ධ වී අගය එකතුකිරීමේ ක්‍රියාදාමයට යොමුවීමට කුරුණෑගල වැවිලි සමාගම සැලසුම් කර ඇත. සාර්ථක රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයක් තුලින් සමාගමේ ලාභදායිත්වය ඉහළ දැමීමට මින් බලාපොරොත්තු වේ.

## ඇගයීම

නව රජය යටතේ ඇති වූ අලුත් ප්‍රතිසංස්කරණ තුල කුරුණෑගල වැවිලි සමාගම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. 2014 වර්ෂය තුල කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාටද, ගරු වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය කේ. වෙලායුදන් මැතිතුමන්ට සහ ගරු නියෝජ්‍ය අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමන්ට මාගේ ගෞරවාන්විත ස්තුතිය පුද කර සිටීමට කැමැත්තෙමි. තවද හිටපු පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමාගේ මාර්ගෝපදේශකත්වය හා සහයෝගය වෙනුවෙන් විශේෂ ස්තුතියක් පුද කර සිටීමට කැමැත්තෙමි. එසේම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් අනුර ජයවික්‍රම මැතිතුමන්ටද, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමන්ටද ඔවුන්ගේ මඟ පෙන්වීම හා දිරි ගැන්වීම් වෙනුවෙන් මාගේ ස්තුතිය පුද කරන අතර වර්තමාන සභාපති පියසෝම උපාලි මහතා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට ද, හිටපු සභාපති ආචාර්ය සුනිල් ජයසේකර මහතා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයටද ඔවුන් විසින් ලබා දුන් වටිනා දායකත්වය වෙනුවෙන් මාගේ ගෞරවාන්විත ස්තුතිය පුද කරමි. එමෙන්ම සමාගම මෙම තත්ත්වයට රැගෙන ඒමට දායක වූ සියලුම පාර්ශවකරුවන්ට මාගේ ස්තුතිය පුද කරමි. කුරුණෑගල වැවිලි සමාගමට මෙතරම් සාර්ථකත්වයක් ලබාගැනීමට හැකි වූයේ එහි කාර්යක්ෂම ජ්‍යෙෂ්ඨ කලමනාකරණ කණ්ඩායමේ, පලාත් වතු අධිකාරීවරුන්ගේ සහ සියලුම සේවකයින්ගේ දැඩි පරිශ්‍රමය, කැපවීම හා පක්ෂපාතිත්වය නිසාය. එම නිසා ඔවුන්ගේ සේවය වෙනුවෙන් මාගේ ස්තුතිය පුද කර සිටිමි. අප විසින් දිගු කාලීනවූත් තිරසාරවූත් සංවර්ධන හා විවිධාංගීකරණ වැඩ සටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබයි. සමාගමේ උපායමාර්ගික තලයේ දිගු කාලීන දැක්ම වනුයේ වැවිලි ක්ෂේත්‍රයේ අඛණ්ඩ සංවර්ධනයට සමගාමීව බෝග විවිධාංගීකරණය හා අගය එකතු කිරීමයි. ඒ තුලින් දිගුකාලීන තිරසාරත්වය තහවුරු කරමින් ප්‍රාථමික නිෂ්පාදකයෙකු ලෙස ක්‍රියාකරන කුරුණෑගල වැවිලි සමාගම වටිනාකම් එකතු කිරීමේ නිෂ්පාදන සමාගමක් බවට පරිවර්තනය කිරීමට අපි බලාපොරොත්තු වෙමු.



සුනිල් නිල්ලේගොඩ

# අධ්‍යක්ෂ මණ්ඩලය



ඩබ්. ඒ. ඩී. ඩී. එම්.
ප්‍රියන්ත මහතා
අධ්‍යක්ෂ

ඩී. පී.
විජේසිංහ මහතා
අධ්‍යක්ෂ

එච්. ඒ. එන්.
සමන් කුමාර මහතා
අධ්‍යක්ෂ / මහා භාණ්ඩාගාර නියෝජිත

ඩබ්. එම්. ඩී. බී.
අබේරත්න මහතා
අධ්‍යක්ෂ



ඒ. එම්.
**පියසෝම උපාලි මහතා**
සභාපති

ඩී. එම්.
**බණ්ඩාරනායක මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

සුනිල් එස්.
**අලස් මහතා**
අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩලය

### ඒ. එම්. පියසෝම උපාලි මහතා
සභාපති

2015.01.29 දින කුරුණෑගල වැවිලි සමාගමේ සභාපති ලෙස පත්වූ පියසෝම උපාලි මහතා සතු අති විශාල දැනුම සහ වසර ගණනාවක පළපුරුද්ද අපගේ සමාගමට වඩාත් ඉහළ ජයග්‍රහනයන් ලඟාකර ගැනීම සඳහා නිසැකවම දායකවනු ඇත. ඔහුගේ කීර්තිමත් වෘත්තීමය ගමන 1980 සිට ආරම්භ වූ අතර, ඉතිහාසයේ පළමු වරට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ප්‍රථම සභාපති බවට පත් විය. එමෙන්ම ඔහු 1988 දී වයඹ පළාත් සභාව ආරම්භයේ වයඹ පළාත් සභාවේ පළමු නියෝජ්‍ය සභාපතිවරයා ලෙසද කටයුතු කළේය. ඔහුගේ දේශපාලන දිවියට පෙර උපාලි මහතා 1980 දී ප්‍රථම කුරුණෑගල දිස්ත්‍රික් සංවර්ධන සභාවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කර ඇත. එමෙන්ම ඔහු කුලියාපිටිය විවිධ සේවා සමූපාකාර සමිතියේ සභාපතිවරයකු වශයෙන්ද ජාතික සමූපාකාර සභාවේ අධ්‍යක්ෂවරයෙක් වශයෙන්ද කටයුතු කර ඇත.

ඉන් පසු පියසෝම උපාලි මහතා 1988දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස කුලියාපිටිය මැතිවරණ කොට්ඨාසය නියෝජනය කළ අතර, කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් 1989-2004 දක්වා අඛණ්ඩව වසර 16ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කරන ලදී. ඔහු 2002-2004 දක්වා ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කටයුතු කළ දිගු කාලය තුළදී ආණ්ඩු පක්ෂයේ සහකාර සංවිධායක සහ නියෝජ්‍ය සංවිධායක වැනි විවිධ තනතුරු ඔහු විසින් හෙබවීය. ජපානයේ කෘෂිකාර්මික සහ සමූපාකාර වැඩසටහන, රුසියාවේ තරුණ කටයුතු වැඩසටහන සහ එක්සත් රාජධානියේ සහ ස්පාඤ්ඤයේ පැවති බලය බෙදීමේ වැඩසටහන ඇතුළුව විවිධ විදේශීය වැඩසටහන් රාශියකට ඔහු සහභාගි වී ඇත. ඊට අමතරව, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළට විශාල වශයෙන් කේන්ද්‍රගත වෙමින් දිවයින පුරා ක්‍රියාත්මක වූ සංවර්ධන වැඩසටහන්වලදී ඔහු සක්‍රීයව දායක වී ඇත. වසර ගණනාවක් පුරා දේශිය හා ජාත්‍යන්තර වශයෙන් පියසෝම උපාලි මහතා විසින් රැස්කර ගත් දැනුම සහ පළපුරුද්ද, කුරුණෑගල වැවිලි සමාගම තිරසාර සංවර්ධනයක් සහ අභිවෘද්ධිය කරා යන ගමනේදී නිසැකවම වත්කමක් වනු ඇත.

### ඩී. එම් . බණ්ඩාරනායක
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

2015.03.26 දින සිට කුරුණෑගල වැවිලි සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස පත් වූ ඩී.එම්.බණ්ඩාරනායක මහතා මහව විජයබා ජාතික පාසලේ ආදි ශිෂ්‍යයෙක් වන අතර කෘෂිකාර්මික, ගොවිපල සහ පුද්ගලික ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ වසර ගණනාවක පළපුරුද්ද ඔහු සතුය. ඔහු දේශපාලඥයෙක් ලෙස ජනතාව සමඟ වැඩ කිරීමෙන් සහ පුද්ගලික මෙන්ම රාජ්‍ය අංශයේ වෘත්තිකයන් සමඟ කටයුතු කිරීමෙන් ලබා ඇති අත්දැකීම් සමුදාය අතිමහත්ය. කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් 1989-2004 දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කරන ලද අතර කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ වූ හිටපු වී සංවර්ධන අමාත්‍යවරයාද වේ. ඩී.එම්.බණ්ඩාරනායක මහතා 1985 සිට 1986 දක්වා
ගල්ගමුව පෞද්ගලික බස්රථ සංගමයේ භාණ්ඩාගාරික වශයෙන්ද, විලව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය සාධන බලකායේ සක්‍රීය සාමාජිකයෙක් සහ සභාපති වශයෙන්ද කරයුතු කරමින් 1985 සිට 1989 දක්වා විලව ග්‍රාමෝදය සංවර්ධන සභාවේ සභාපති ලෙසද කටයුතු කරන ලදී. එමෙන්ම 1985 සිට 1989 දක්වා යාපහුව කිරි ගොවීන්ගේ සංගමයේ සභාපති වශයෙන්ද 1989 සිට 2003 දක්වා යාපහුව පන්සලේ පෙරහැර සංවිධාන කමිටුවේ සභාපති ලෙසද සේවය කරමින් යාපහුව තුළ ආගමික සිද්ධස්ථාන සහ ආයතන සංවර්ධනය කිරීම සඳහා විශාල වශයෙන් දායක වී ඇත.

### ඩී. පී. විජේසිංහ මහතා
අධ්‍යක්ෂ

2015.03.13 දින සිට කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ ලෙස පත් වූ විජේසිංහ මහතා සතුව 1980 දශකයේ සිට රාජ්‍ය සහ පුද්ගලික අංශයේ බොහෝ ආයතනවල කටයුතු කරමින් ලබාගත් හසල අත්දැකීම් සම්භාරයක් පවතී. ඔහු සීකෝ කන්ෆෙක්ෂනරි පුද්ගලික සමාගමේ ජ්‍යේෂ්ඨ තනතුරු කිහිපයක් හොබවා ඇති අතර, 559 රෙස්ටුරන්ට් සහ ගොඩනැගිලි සංකීර්ණයේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා ද වේ. දැනට ඔහු මිල්කෝ පුද්ගලික සමාගමේ සහ කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙස කටයුතු කරයි. හරංකාව මහා විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍යයෙක් වන ඔහු මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකාරවරයෙකි.

### එච්. ඒ. එන්. සමන් කුමාර මහතා
අධ්‍යක්ෂ / මහා භාණ්ඩාගාර නියෝජිත

2015.03.26 දින සිට කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ/ මහා භාණ්ඩාගාර නියෝජිත ලෙස පත් වූ සමන් කුමාර මහතා 2015.04.07 දින සිට කුරුණෑගල වැවිලි සමාගමේ විගණන කමිටුවේ සභාපති ලෙසද කටයුතු කරයි. සමන් කුමාර මහතාට ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ආයතනවල වසර ගණනාවක පළපුරුද්ද ඇති අතර. ඔහු එම ආයතනවල ජ්‍යෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම් සාමාජිකයෙක් ලෙස සහ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කර ඇත. ඔහු 2002 මැයි සිට 2005 අගෝස්තු දක්වා කාලගුණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (මුදල්) වශයෙන්ද, 2005 අගෝස්තු සිට 2010 දෙසැම්බර් දක්වා රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද, 2010 දෙසැම්බර් සිට 2013 ජූලි දක්වා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද. 2013 ජූලි සිට 2013 සැප්තැම්බර් දක්වා රාජ්‍ය

ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙන්ද සේවය කර ඇති අතර, 2013 සැප්තැම්බර් සිට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයකු වශයෙන්ද කටයුතු කරයි.

මීට අමතරව සමන් කුමාර මහතා දැරූ අධ්‍යක්ෂක තනතුරු පහත පරිදි වේ. 2006 සිට 2010 දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ අධ්‍යක්ෂ, 2008 සිට 2011 දක්වා සීමිත ගල්ඔය වැවිලි සමාගමේ අධ්‍යක්ෂ, 2009 සිට 2011 දක්වා ගල්ඔය හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ, 2010 සිට 2011 දක්වා රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂ, 2013 සිට 2015 දක්වා පරන්තන් කෙමිකල්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ. දැනට ඔහු 2015 මුල සිට වෙස්ට් කෝස්ට් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ වරයෙක් ලෙස සේවය කරයි. ඔහු 2001 වසරේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධිය ලබා ගත් අතර, 2009 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යවහාර මූල්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ගන්නා ලදී. එමෙන්ම 2013 දී ජපාන අන්තර් ජාතික විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ගන්නා ලදී.

### සුනිල් එස්. අලස් මහතා

අධ්‍යක්ෂ

2015.03.26 දින සිට කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ ලෙස පත් වූ අලස් මහතා රාජ්‍ය සහ පුද්ගලික අංශයේ විවිධ ආයතන රාශියක කටයුතු කරමින් ලබාගත් වසර ගණනාවක පළපුරුද්දක් ඇති මහත්මයෙකි. එමෙන්ම, 2015.04.07 දින සිට කුරුණෑගල වැවිලි සමාගමේ විගණන කමිටුවේ සාමාජිකයෙක් ලෙසද කටයුතු කරයි. ඔහු ව්‍යාපෘති සැලසුම් කිරීමේ උපදේශකයෙක් වන අතර, 2002 සිට 2004 දක්වා කැන්ඩි හොටෙල්ස් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ලෙසද, 2004 සිට 2005 දක්වා මුන්දි ගෑස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙසද සේවය කර ඇත. අලස් මහතා 1994 සිට 2002 දක්වා ගෑස් ඔටෝ ලංකා පුද්ගලික සමාගමේ (ලාෆ්ස් ගෲප්) සම නිර්මාතෘ සහ කළමනාකාර අධ්‍යක්ෂවරයාද විය. ඔහු ඔහුගේ වෘත්තීය ජීවිතය ආරම්භ කරනු ලැබුවේ 1973 වසරේදී ඔබරෝයි හෝටලයෙහි කළමනාකරණ අභ්‍යාසලාභියෙකු වශයෙන් වන අතර ඉන්පසු 1977 සිට 1980 දක්වා ලංකා හෝටල් සංස්ථාවේ ආහාරපාන පිලිබඳ කළමනාකරු ලෙස පත් වූ අතර, 1980 සිට 1985 දක්වා මවුන්ට් ලැවිනියා හෝටලයේ ආහාරපාන පිලිබඳ උපදේශක ලෙස සේවය කරන ලදී. එමෙන්ම ඔහු 1985 සිට 1989 දක්වා මීගමුව සීසෙල්ස් හෝටලයෙහි සාමාන්‍යාධිකාරී වූ අතර සියරා ට්‍රැවල්ස් සහ සියරා ට්‍රේඩින් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයාද විය.

අලස් මහතා කොළඹ ආනන්දයෙන් බිහිවූ කීර්තිමත් ආදි ශිෂ්‍යයෙක් වන අතර, එක්සත් රාජධානියේ කෝර්න්වෝල් තාක්ෂණික විදුහලෙන් හෝටල් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබාගෙන ඇති අතර කළමනාකරණ උපාධිධාරියෙකි.

### ඩබ්. එම්. ඩී. බී. අබේරත්න මහතා

අධ්‍යක්ෂ

2015.03.13 දින සිට කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ ලෙස පත් වූ අබේරත්න මහතාට ගිණුම්කරණ සහ විගණන ක්ෂේත්‍රය තුළ වසර ගණනාවක පළපුරුද්දක් සතු වේ. එමෙන්ම, 2015.04.07 දින සිට කුරුණෑගල වැවිලි සමාගමේ විගණන කමිටුවේ සාමාජිකයෙක් ලෙසද කටයුතු කරයි. ඔහු ඔහුගේ වෘත්තීමය දිවිය ආරම්භ කලේ තොර්න්ටන් පණ්ඩිතරත්න පුද්ගලික සමාගමෙන් වන අතර, පසුව ලංකා කිරි කර්මාන්ත සමාගම, මාලදිවයිනේ හොලිඩේ අයිලන්ඩ් රිසෝර්ට්, ඩී.බී. අබේරත්න සහ සමාගම සහ රාජ්‍ය දැව සංස්ථාව යන ආයතනවල සේවය කරන ලදී. දැනට ඔහු රාජ්‍ය දැව සංස්ථාවේ සේවය කරමින් ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ සභාවේද සේවය කරමින් සිටී. එමෙන්ම රාජ්‍ය දැව සංස්ථාවේ දැනට භාවිතා කරනු ලබන අභ්‍යන්තර විගණක අත්පොත සහ වැඩසටහන වසර පහලොවකට පසු සකස් කිරීමේදී සහ සංශෝධනය කිරීමේදී ඔහු මූලික විය.

ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ගිණුම්කරණ සහ මූල්‍ය කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ ශ්‍රී ලංකාවේ පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමාව ඇතුළුව වෘත්තීමය සුදුසුකම් රාශියක් ඔහු සතුය.

ගිණුම්කරණය සහ විගණනය පිළිබඳ මනා සුදුසුකම් සහිත වෘත්තිකයෙක් වන අබේරත්න මහතා ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ ආයතනයේ, එක්සත් රාජධානියේ මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ, එක්සත් රාජධානියේ පොත් තබන්නන්ගේ අන්තර් ජාතික සංගමයේ, වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ (ශ්‍රී ලංකා ශාඛාවේ ආරම්භක සාමාජික), වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ සාමාජිකයෙක් වන අතර, රොටරි හෙරිටේජ් - මහනුවර අධිකාරී සාමාජිකවරයෙක් මෙන්ම මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකාරවරයෙක්ද වේ.

### ඩබ්. ඒ. ඩී. ඩී. එම්. ප්‍රියන්ත මහතා

අධ්‍යක්ෂ

2015.03.13 දින සිට කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ ලෙස පත් වූ ප්‍රියන්ත මහතා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාය. ඔහු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවාවට 1992 වසරේදී බැඳුණු අතර, වසර 13ක කාලයක් පුරා ගණකාධිකාරිවරයෙක් ලෙස වයඹ පළාත් සභාවේ විවිධ දෙපාර්තමේන්තු කිහිපයක සේවය කර ඇත. ඔහු වෙන්නප්පුව ජෝෂප් වාස් විදුහලේ ශිෂ්‍යයෙක් වන අතර, කොළඹ විශ්ව විද්‍යාලයෙන් වාණිජ උපාධිය ලබාගෙන ඇත.

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය



එන්. එම්. එස්. කේ. නිල්ලේගොඩ මහතා
ප්‍රධාන විධායක නිලධාරි



එස්. එම්. එම්. සමරකෝන් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි



පී. එම්. ඩී. ජී. ප්‍රේමතිලක මහතා
කළමනාකරු - මූල්‍ය



එම්. එම්. ජේ. කුරේ මහතා
කළමනාකරු - විගණන



අයි. ඒ. ගුණවර්ධන මහතා
කළමනාකරු - මානව සම්පත් සහ පාරිපාලන



එස්. එම්. ආර්. පී. සත්කුමාර මහතා
කළමනාකරු - වතු අධීක්ෂණ හා සම්බන්ධීකරණ



ජේ. කේ. ජේ. පී. ජයවර්ධන මහතා
කළමනාකරු - අලෙවි

# පලාත් වතු අධිකාරීවරු



එම්. එල්. ඒ. පී. පෙරේරා මහතා



ජී. කේ. ඒ. ජයවර්ධන මහතා



කේ. එල්. එච්. සී. පෙරේරා මහතා



ඒ. එම්. පී. අබේකෝන් මහතා



කේ. පී. ඩී. එන්. කලුගල්ල මහතා




යූ. පී. ආර්. එම්. පතිරණ මහතා



එම්. ටී. ජේ. පෙරේරා මහතා



ජේ. එම්. ඒ. ඒ. මුණසිංහ මහතා










# අපගේ වගාවන්

ප්‍රධාන බෝග
කිහිපයක් මත
ප්‍රමාණයට වඩා
යැපීමේ අවදානම
අවමකිරීමේ
වඩාත් යෝග්‍යම
උපායමාගීය බෝග
විවිධාංගීකරණයයි











# කළමනාකරණ සංවාදය සහ විශ්ලේෂණය

# කළමනාකරණ සංවාදය සහ විශ්ලේෂණය

## මූලික කාර්යයන් සහ ව්‍යාපාරයේ ස්වභාවය

මෙම වසර තුළදී, සමාගමේ මූලික කාර්යයන් වූයේ පොල්. රබර් සහ වෙනත් කෘෂිකාර්මික බෝග වගාකිරීම. නිෂ්පාදනය සහ අලෙවි කිරීමයි.

## මෙහෙයුම් විෂය පථය

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්ක පුරා ව්‍යාප්තව ඇති විවිධ කෘෂි දේශගුණ කලාපයන් ආවරණය කරමින් විහිදුන වතුයාය 08 කින් සමන්විත වන අතර එම වතු යායන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 2 ක් 3 ක් පුරා විහිදුන කුඩා වතු බෙදුම් සමූහයකින් සමන්විත වේ. සමාගම යටතේ ඇති සමස්ථ භූමි ප්‍රමාණය හෙක්ටයාර 5,244.58 ක් වේ.

## ඉඩම් වපසරිය

ජාතික අවශ්‍යතාවයන් සහ ව්‍යවස්ථාපිත නිශ්චයන් සඳහා ඉඩම් නිදහස් කිරීම හේතු කොට ගෙන සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමට විශාල ඉඩම් ප්‍රමාණයක් අහිමි වී ඇත. කුරුණෑගල වැවිලි සමාගම 1992 ආරම්භ කරන අවස්ථාවේදී බාරදුන් මුළු ඉඩම් ප්‍රමාණයෙන් (හෙක්ටයාර 6,555.03) 20% ක පමණ ඉඩම් ප්‍රමාණයක් (හෙක්ටයාර 1310.45) මේ වන විට සමාගමට අහිමි වී ඇත.

| මූල්‍ය වර්ෂය අවසානයේදී | හෙක්ටයාර |
|---|---|
| 1992 | 6,555.03 |
| 2004 | 5,537.28 |
| 2005 | 5,451.41 |
| 2006 | 5,450.28 |
| 2007 | 5,450.28 |
| 2008 | 5,409.70 |
| 2009 | 5,397.51 |
| 2010 | 5,397.51 |
| 2011 | 5,327.77 |
| 2012 | 5,316.43 |
| 2013 | 5,261.17 |
| **2014** | **5,244.58** |

## පලාත් වතුවල ඉඩම් වපසරිය

| | ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|
| අත්තනගල්ල | 703.22 |
| දඹදෙනිය | 462.18 |
| දොඩම්ගස්ලන්ද | 798.83 |
| හිරියාල | 1107.77 |
| කටුගම්පල | 619.13 |
| කුරුණෑගල | 555.80 |
| මහායාය | 446.26 |
| නාරම්මල | 551.39 |
| | 5244.58 |

## නිෂ්පාදන සමූහය

වතුයාය 08 හිම ප්‍රධාන බෝගය පොල් වන අතර රබර් වගාව අත්තනගල්ල, මහායාය, සහ දොඩම්ගස්ලන්ද පලාත් වතුවලට සීමා වී තිබුණි ඉඩම්වල ඵලදායිතාව වැඩිකිරීම සහ ජෛව විවිධත්වය අරමුණු කර ගනිමින් රබර් වගාව ව්‍යාප්ත කිරීමට නව ප්‍රදේශ හඳුනාගෙන ඇති අතර කුරුණෑගල සහ නාරම්මල පලාත් වතුවල අලුතින් රබර් වගාකිරීම ආරම්භ කොට ඇත. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම භූමියේ සහ දේශගුණික යෝග්‍යතාවය අනුව අතුරු බෝග වර්ග රාශියක් වගාකර ඇත.

## ඉඩම් භාවිතය

| | ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|
| පොල් | 4,097.36 |
| රබර් | 250.10 |
| වී | 213.72 |
| වෙනත් බෝග (තනි වගාවන් ලෙස ඇති) | 10.28 |
| වගා කල නොහැකි | 673.12 |
| | 5,244.58 |

* පොල් යටතේ ඇති වෙනත් බෝග - හෙක්ටයාර 413.83

## කළමනාකරණ ප්‍රවීණත්වය

2005 වසරේ සිට සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම මනා කළමනාකරණ ක්‍රමවේදයක් තුල ක්‍රියාත්මක වූ අතර එය ජාතික මට්ටමේදී අත්කරගත් බොහෝ ජයග්‍රහනයන් සඳහා හේතු වී ඇති අතර දේශීය ආර්ථිකයට, පොල් කර්මාන්තයට සහ සමාජයටද විශාල දායකත්වයක් ලබාදීමට හේතු වී ඇත.

මූල්‍ය සහ කෘෂිකාර්මික කාර්යසාධනය තුළින් සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම මෙරට වඩාත් උසස් හා වෘත්තීමය වශයෙන් පාලනය කරනු ලබන කෘෂිව්‍යාපාර ආයතනයක් බව සනාථ කොට ඇත. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ දැක්ම වන්නේ අග්නිදිග ආසියාවේ ආදර්ශමත්ම වැවිලි සහ කෘෂිව්‍යාපාර කළමනාකාරිත්ව සමාගම බවට පත්වීමයි.

කුරුණෑගල වැවිලි සමාගම විසින් ජාතික කෘෂිව්‍යාපාර කවුන්සිලය විසින් පවත්වන ලද 2011 ජාතික කෘෂිව්‍යාපාර සම්මාන ප්‍රදාන උත්සවයේදී මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා වූ රන් සම්මානය දිනාගත් අතර ජාතික මට්ටමේ තෙවැනියා බවට පත්විය.

2012 දී කුරුණෑගල වැවිලි සමාගම කෘෂිව්‍යාපාර සඳහා පිරිනමන ජාතික රන් සම්මානය දිනාගන්නා ලදී. එමෙන්ම කුරුණෑගල වැවිලි සමාගම යලිත් වරක් මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා වූ රන් සම්මානයද දිනාගනිමින් ජාතික මට්ටමේ හිමි ස්ථානය යලිත් තහවුරු කරන ලදී.

2013 දී කුරුණෑගල වැවිලි සමාගම දෙවන වරටත් ජාතික කෘෂිව්‍යාපාර රන් සම්මානයෙන් පිදුම් ලැබූ අතර අඛණ්ඩව තුන්වන වරටත් මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා පිරිනමන රන් සම්මානය හිමිකර ගන්නා ලදී.

2014 දී කුරුණෑගල වැවිලි සමාගම විසින් අඛණ්ඩව තුන්වන වරටත් ජාතික මට්ටමේ රන් සම්මානය සහ මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා වූ රන් සම්මානය අඛණ්ඩව හතරවන වරටත් දිනාගනිමින් කෘෂිව්‍යාපාර ක්ෂේත්‍රයේ ඉතිහාසය තුළ නව පරිච්ඡේදයකට පා තබන ලදී.

## මූල්‍ය සමාලෝචනය

### ආදායම

2013 වසරේ රු.මිලියන 475.89 ක් වූ මුළු ආදායම 2014 දී රු. මිලියන 576.79 දක්වා 21.2% කින් වර්ධනය විය. මෙම වර්ධනයට මුලිකවම හේතු වූයේ පොල් අංශයේ ආදායමේ සිදු වූ වර්ධනයයි.

ආදායමේ සංයුතිය පහත පරිදි වේ.

| | **2014** | 2013 |
|---|---|---|
| පොල් | **514.18** | 402.37 |
| රබර් | **39.70** | 62.41 |
| වෙනත් බෝග | **22.91** | 11.11 |
| | **576.79** | 475.89 |

2014 දී ඉපයූ රුපියල් මිලියන 576.8 ක මුළු ආදායම සමාගමේ ඉතිහාසය තුළ ලබාගත් වැඩිම ආදායම වේ.

**මුළු ආදායම (රු. මිලියන)**




### ලාභය


රු. මිලියන 208.15 වූ 2013 වර්ෂයේ බදු පසු ලාභය 2014 දී රු. මිලියන 214.24 ක් දක්වා රු. මිලියන 6 කින් එනම් 2.9% ප්‍රමාණයකින් වර්ධනය විය. පසුගිය වසරට සාපේක්ෂව 30.5% කින් එනම් රු. මිලියන 57.86 කින් ලාභ වර්ධනයක් වාර්තා කළ පොල් අංශය මේ සඳහා වැඩිම දායකත්වයක් ලබාදී ඇත. (පොල් වලින් ලද ලාභය 2014 - රු. මිලියන 247.21, 2013 රුපියල් මිලියන 189.35)

කෙසේ වෙතත් පෙර වර්ෂයේදී රු මිලියන 13.98 ක ලාභයක් වාර්තා කළ රබර් අංශය රු. මිලියන 2.35 ක අලාභයක් මෙම වසර තුලදී වාර්තා කරන ලදී.

2013 වසරේදී රු. මිලියන 3.76 ක් වූ වෙනත් බෝග වලින් ලත් ලාභය 2014 වන විට රු. මිලියන 5.97 ක් දක්වා 58.25% කින් වර්ධනය වී ඇත.

2014 වසර තුලදී සමාගමේ පරිපාලන හා පොදු වියදම් රු. මිලියන 131.15 කි. පසුගිය වසරේ වියදම වන රු. මිලියන 109.25 සමඟ සසඳා බලන කල එය 20% ක වර්ධනයකි.

**බදු පෙර හා පසු ලාභය (රු. මිලියන)**




### පොල් අංශය

2014 වසර අවසානයේදී කුරුණෑගල වැවිලි සමාගම සතුව ඇති පොල් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 3264.04 ක් වන අතර පොල් යටි වගා ප්‍රමාණය මුළු පොල් ඉඩම් වපසරියෙන් 20% කට

# කළමනාකරණ සංවාදය සහ විශ්ලේෂණය

වඩා වැඩිය. අක්කරයකට පැවතිය යුතු පිළිගත් ප්‍රශස්ථ පොල් ගස් සංඛ්‍යාව 60 ක් වන අතර කුරුණෑගල වැවිලි සමාගමේ පොල්වතුවල අක්කරයකට ඇති පොල් ගස් සංඛ්‍යාව 56 කි. 2005 ජනවාරි 01 දින සමාගමේ කළමනාකාරිත්වය රාජ්‍ය අංශයට පවරා ගන්නා විට අක්කරයකට පැවති පොල් ගස් සංඛ්‍යාව 49 කි.

2005 වසරේ සිට පොල් අස්වැන්නේ වර්ධනයක් පෙන්නුම් කල අතර 2012 වසරේදී මෙතෙක් වාර්තාවූ ඉහළම පොල් අස්වැන්න වාර්තා කෙරිනි. 2013 වසරේදී සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ඇතුලුව සියලුම පොල් වගාකරුවන් පොල් අස්වැන්නේ විශාල පසුබෑමකට ලක්විය.

2013 වර්ෂයේ දී සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ පොල් අස්වැන්න, සමාගමේ ඉතිහාසය තුල වාර්තා වූ වැඩිම පොල් අස්වැන්න වන මිලියන 18.10 (2012) සිට මිලියන 13 ක් දක්වා පහත වැටුනි. කෙසේ වෙතත් 2014 වර්ෂය තුල දී පොල් අස්වැන්න මිලියන 16.7 ක් දක්වා වර්ධනය කර ගැනීමට සමාගමට හැකි විය. ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනයේ සමස්ථ වර්ධනය
පසුගිය වර්ෂයට සාපේක්ෂව 14.2% ක මට්ටමකට පවතින විට සමාගමේ පොල් අස්වැන්න පෙර වර්ෂයට සාපේක්ෂව 28.5% කින් වර්ධනය කර ගැනීමට හැකි වීම කැපී පෙනේ.

**පොල් නිෂ්පාදනය (ගෙඩි මිලියන)**





කුරුණෑගල වැවිලි සමාගමේ පොල් අලෙවිය සිදු කරනු ලබන්නේ ඉතාමත්ම විනිවිදභාවයෙන් හා වගකීමෙන් යුතුවන අතර විකිණීමට ඇති පොල් ප්‍රමාණයන්, පොල් සංවර්ධන අධිකාරිය විසින් පවත්වාගෙනු යනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියට ඉදිරිපත් කරනු ලැබේ.

බොහෝ අවස්ථාවලදී සීමාසහිත කුරුණෑගල වැවිලි සමාග මේ ශුද්ධ විකුණුම් සාමාන්‍ය අගය වෙන්දේසියේ ශුද්ධ විකුණුම් සාමාන්‍ය අගයට වඩා ඉහළ අගයක් ගෙන ඇත. 2013 වසර සඳහා රු. 30.93 ක් වූ පොල් ගෙඩියක ශුද්ධ විකුණුම් සාමාන්‍ය 2014 වසර සඳහා රු. 30.65 ක් ලෙස වාර්තා විය. සමාගම 2014 වසර තුල පොල් තෙල් සහ කොප්පරා සීමිත ප්‍රමාණයකින් නිෂ්පාදනය කර ඇත.

කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන බෝගය පොල් වන අතර ඉන් ලැබෙන ආදායම සමාගමේ සමස්ථ ආදායමින් විශාල කොටසක් නියෝජනය කරයි. 2013 වසරේදී රු.මිලියන 402.37 ක් වූ පොල් ආදායම 2014 වසරේදී රු. මිලියන 514.17 දක්වා 27.79% කින් වර්ධනය විය.


**පොල් ආදායම (රු. මිලියන)**




සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ඵලදායිතාවය ඉහළ නැංවීම හා සොරකම් අවම කිරීම අරමුණු කොටගෙන සාමාන්‍ය පොල් කැඩීම් ක්‍රම වේදය වන මාස 2 කට වරක් පොල් කැඩීම වෙනුවට හැකි සෑම වගා ක්ෂේත්‍රයකම මසකට වරක් පොල් කැඩීම අරඹා ඇත. මෙම ක්‍රමය තුල වැටුනු පොල් ප්‍රමාණය අඩුවන අතර ඒ තුලින් සොරකම් කිරීමට ඇති අවස්ථාවන් අවම වේ. මීට අමතරව මෙම ක්‍රමය තුල පැසුනු පොල් වල්ල ඉක්මණින් ඉවත් කිරීම තුල එම පොල් වල්ල නඩත්තුවට වැයවන ජලය සහ පෝෂක කොටස් ගසේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා යෙදවෙන අතර වර්ෂයක් තුළ අමතර පොල් වල්ලක් නෙලා ගැනීමටද හැකි වී තිබේ.

මාසික පොල් කැඩුම් වපසරිය මේ වන විට මුළු පොල් කැඩුම් වපසරියෙන් 90% ක උපරිමයකට ලඟා වී ඇත. 2004 වසර සඳහා මෙම ප්‍රතිශතය 26% ක තරම් පහළ අගයක් ලෙස වාර්තා විය. මෙම ක්‍රමවේදය තුලද වැටුනු පොල් ප්‍රතිශතය 17% ක් 20% ක් අතර ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට සමාගමට හැකි වී තිබේ. මේ තුලින් මෙම උපායමාර්ගයේ ඇති කාර්යක්ෂමතාව මනාව පැහැදිලි වේ.

**මාසික පොල් කැඩුම් වපසරිය සහ වැටුනු පොල් ප්‍රතිශතය**




2013 වසරේ රු.මිලියන 213.01 වූ පොල්වල නිෂ්පාදන පිරිවැය 2014 වසරේදී රු. මිලියන 266.96 ක් දක්වා 25.3% කින් වර්ධනය වී ඇත. කෙසේ වෙතත් පොල් නිෂ්පාදනයේ වූ වැඩිවීම

හේතුකොටගෙන පොල් ගෙඩියක නිෂ්පාදන පිරිවැය 2013 ට සාපේක්ෂව 2014 වසරේදී පහළ ගොස් ඇත. 2013 වසරේදී පොල් ගෙඩියක නිෂ්පාදන පිරිවැය රු. 16.39 ක් වූ අතර එම අගය 2014 වසර සඳහා රු. 15.98 ක් විය.

නිෂ්පාදන පිරිවැය පහත දැක්වෙන ප්‍රධාන පිරිවැය සංරචක වල එකතුවක් ලෙස ගණනය කරනු ලැබේ.

| | 2014 | 2013 | |
|---|---|---|---|
| පොදු වියදම් | **151.27** | 116.92 | 29% |
| නඩත්තු වියදම් | **69.56** | 58.43 | 19% |
| අස්වනු නෙලීමේ වියදම් | **39.42** | 34.13 | 15% |
| නිෂ්පාදන වියදම් | **6.72** | 3.55 | 89% |
| | **266.96** | 213.02 | 25% |

නාස්තිය අවම කිරීම, ශ්‍රම ඵලදායිතාවය ඉහළ නැංවීම, ශ්‍රම භාවිතය වෙනුවට වෙනත් විකල්ප ක්‍රම භාවිතය වැනි කාරණා නිෂ්පාදන පිරිවැය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට හේතු වී ඇත.

## රබර් අංශය


සමාගම සතුව හෙක්ටයාර් 192.62 ක මේරූ රබර් වපසරියක් ඇති අතර පරිසරය සුරැකීම හා භූමියේ ඵලදායීතාවය ඉහළ නැංවීම යන කාරණා කෙරෙහි අවධානය යොමු කරමින් සමාගම රබර් වගාව තවදුරටත් ව්‍යාප්ත කිරීමට පියවර ගෙන ඇත. ලෝක වෙළෙඳ පොළ තුල රබර් මිල පහත වැටීම හේතුකොට ගෙන රබර් වලින් ලද ආදායම 2011 වසරේ සිට අඛණ්ඩව පහළ වැටෙමින් පවතී. 2014 වසර තුල ලද ආදායම රු. මිලියන 39.69 ක් වූ අතර 2013 වසරේදී ලද ආදායම රු. මිලියන 62.41 කි. 2013 වසරේ රබර් කිලෝවක සාමාන්‍ය විකුණුම් මිල රු. 330 ක් වූ අතර එය 2014 වන විට 24% ක පහළ යාමක් වාර්තා කරමින් රු. 252 ක් දක්වා අඩු විය. 2014 වසරේ මුල් අර්ධ වර්ෂය තුල පැවති දැඩි වියලි කාලගුණයත් රබර් කිරි කැපීමට බාධා පමුණුවමින් තුන්වන කාර්තුව තුල ඇද හැලුනු දැඩි වර්ෂාපතනයත් නිසා ජාතික රබර් නිෂ්පාදනය 24.4% කින් පහත වැටුනි.

2014 වසරේ සමාගමේ රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 157474 ක් වූ අතර එය 2013 වර්ෂයට සාපේක්ෂව 16.65% ක අඩුවීමකි. ඒ අනුව බලන කළ ජාතික මට්ටමේ අඩුවීමට සාපේක්ෂව අවම වූ අඩුවීමක් වාර්තා කිරීමට සමාගමට හැකිවිය. 2013 වර්ෂය තුළදී රබර් පර්යේෂණ ආයතනයේ මග පෙන්වීම යටතේ නව තාක්ෂණය යොදා ගනිමින් දුම් ගැසූ රබර් ෂීට් සෑදීම සඳහා නව කර්මාන්ත ශාලාවක් අත්තනගල්ල වතු යාය තුල ස්ථාපනය කරන ලදී. පරිසර අනුකූලතාවයත් සුරක්ෂිත කරමින් මෙම කර්මාන්ත ශාලාවෙන් පිටවන අපවිත්‍ර ජලය පිරිසිදු කිරීම සඳහා වූ පවිත්‍රාගාරයක් ඉදි කිරීමේ කටයුතු 2014 වසර තුළදී ආරම්භ කළ අතර එහි ප්‍රතිඵල ඉදිරි වර්ෂ වලදී ලැබෙනු ඇතැයි සමාගම විශ්වාස කරයි.

**රබර් නිෂ්පාදනය (කි.ග්‍රෑ.'000)**




**රබර් ආදායම (රු. මිලියන)**




රු. මිලියන 48.4 ක් ලෙස වාර්තාවූ රබර් නිෂ්පාදන පිරිවැය 2014 වසරේදී රු. මිලියන 6.3 කින් පහත බැස ඇත. මෙය 13.1% කටත් වඩා වැඩි අඩුවීමකි. රබර් නිෂ්පාදන පිරිවැය පහත දැක්වෙන ප්‍රධාන පිරිවැය සංරචක වල එකතුවක් ලෙස ගණනය කරනු ලබයි. කැපී පෙනෙන අඩුවීමක් සිදු වී ඇත්තේ රබර් කිරි කැපීමේ පිරිවැයෙහිය. එයට ප්‍රධාන හේතුව වූයේ කිරි කැපීමට බාධාවන අයුරින් පැවති කාලගුණ තත්ත්වය තුල රබර් කිරි කැපීම අඩුවීමය.

| | 2014 | 2013 | |
|---|---|---|---|
| පොදු වියදම් | **20.41** | 22.1 | -8% |
| නඩත්තු වියදම් | **4.26** | 4.39 | -3% |
| කිරි කැපීමේ වියදම් | **15.83** | 20.11 | -21% |
| නිෂ්පාදන වියදම් | **1.56** | 1.81 | -14% |
| | **42.05** | 48.42 | -13% |

## වෙනත් බෝග

2005 වසරේ සිට සමාගම පුළුල් ලෙස අතුරු බෝග විවිධාංගීකරණය සඳහා යොමු වූ අතර එය අද වන විට ඉතාම සාර්ථක මට්ටමකට පැමිණ ඇත. 2005 වසරේදී වෙනත් බෝග වගාකර තිබූ වපසරිය හෙක්ටයාර 71.79 ක් වූ අතර එය 2014 වසර අවසානය වන විට හෙක්ටයාර 425.04 ක් දක්වා 06 ගුණයකින් පමණ වර්ධනය කිරීමට සමාගම කටයුතු කර ඇත. වර්තමානය වන විට සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ගම්මිරිස්, කුරුඳු, රඹුටන්, දූරියන්, ඩ්‍රැගන්ෆෲට්, අඹ, කොකෝවා,

# කළමනාකරණ සංවාදය සහ විශ්ලේෂණය

කජු වැනි අතුරු බෝග රාශියක් වගා කොට ඇත. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ගස් 1040 කින් යුත් ලංකාවේ විශාලතම දූරියන් වගාව මහායාය වතුයාය තුල ස්ථාපනය කර ඇත. කජු, කුරුඳු, බ්‍රැගන්ෆෲට්, අඹ සහ පේර කුරුණෑගල දිස්ත්‍රික්කයේ වියලි කාලගුණික කලාපය තුල වගා කර ඇති අතර රඹුටන් සහ දූරියන් ගම්පහ දිස්ත්‍රික්කයේ තෙත් කලාපය තුල සාර්ථකව වගාකර ඇත.

රඹුටන්, කජු, කොකෝවා සහ ගම්මිරිස් මේ වන විට ඵලදරණ තත්ත්වයට පත්ව ඇති අතර එය සමාගමේ ආදායම් තත්ත්වය ඉහළ දැමීම සඳහා බෙහෙවින් දායකවී ඇත.


2013 වසරේදී අතුරු බෝගවලින් ලද ආදායම රු. මිලියන 11.12 ක් වූ අතර එය 2014 වසරේදී රු. මිලියන 22.92 ක් දක්වා 106% කින් වර්ධනය වී ඇත.

**වෙනත් බෝග ආදායම (රු. මිලියන)**




## ශේෂපත්‍ර ව්‍යුහය

**ශේෂපත්‍ර ව්‍යුහය (රු. මිලියන)**





2014 වසර තුලදී සමාගමේ මුළු වත්කම් රු. මිලියන 177.4 කින් වර්ධනය වූ අතර (2013 රු. මිලියන 1616.45) එයට ප්‍රධානතම හේතුව වූයේ ධාරක ජෛව වත්කම් වල සහ දේපල පිරියත හා උපකරණ සඳහා සිදුකරන ලද ආයෝජනයන්ය.

**ජංගම නොවන වත්කම්**

2014 වසර අවසානයේ මුළු ජංගම නොවන වත්කම් වල වටිනාකම රු. මිලියන 540.33 ක් වූ අතර (2013 රු. මිලියන 473.18) එය පසුගිය වසරට වඩා රු. මිලියන 67.15 ක වර්ධනයකි. ධාරක ජෛව වත්කම්වල සහ දේපල පිරියත හා උපකරණ වල සිදු වූ වර්ධනය ජංගම නොවන වත්කම් වල වර්ධනයට බලපා ඇත. නව යටිවගා ඇති කිරීම සහ පවතින යටි වගාවන් නඩත්තුව සඳහා වඩා වැඩි පිරිවැයක් දැරීම ධාරක ජෛව වත්කම් වල වර්ධනයට හේතු වී ඇත.

**ජංගම නොවන වත්කම්වල ආයෝජන (රු. මිලියන)**




**ද්‍රවශීලතා කළමනාකරණය**


කෙටිකාලීන ආයෝජන වල සිදුවූ වර්ධනයත් සමග සමාගමේ කාරක ප්‍රාග්ධනය රු. මිලියන 457.69 ක් දක්වා වර්ධනය විය. (2013- රු. මිලියන 388.82)

සමාගමේ විචක්ෂණශීලි මූල්‍ය කළමනාකරණ ක්‍රමවේදය තුල 2013 වසර අවසානයේ රු. මිලියන 335.74 ක් ව පැවති මුදල් හා මුදල් සමාන දෑ 2014 වසර අවසානය වන විට රු. මිලියන 409.71 ක් දක්වා වර්ධනය විය. 2014 දෙසැම්බර් 31 දිනට සමාගම සතුව ඇති කෙටිකාලීන ආයෝජන වල වටිනාකම රු. මිලියන 400 කි. (2013- රු. මිලියන 326) මෙම ආයෝජන රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ලෙස පවතී.

2014 වසර අවසානයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව වර්ධනය වී ඇති අතර එම අගයන් පිළිවෙළින් 6.51 ක් (2013 - 5.61) සහ 5.68 ක් (2013 - 4.84) වේ.

| | 2014 | 2013 |
|---|---|---|
| ජංගම අනුපාතය (වාර) | 6.52 | 5.61 |
| ශුද්ධ කාරක ප්‍රාග්ධනය (රුපියල් මිලියන) | 457.69 | 388.82 |
| කොටසක ශුද්ධ වත්කම (රු) | 72.68 | 64.00 |

**ද්‍රවශීලතා කළමනාකරණය (රු. මිලියන)**




### ස්කන්ධ ප්‍රාග්ධනය

ස්කන්ධ ප්‍රාග්ධනය රු. මිලියන 200ක කොටස් ප්‍රාග්ධනයකින් සහ රු. මිලියන 1253.57 ක සංචිත වලින් සමන්විත වේ. සංචිතවල සංයුතිය පහත පරිදි වේ.

| | 2014 | 2013 |
|---|---|---|
| රඳවාගත් ඉපයීම් | 1043.15 | 889,23 |
| දැව සංචිතය | 203.48 | 183.16 |
| වෙනත් සංචිත | 6.94 | 7.62 |
| මුළු සංචිත | 1253.57 | 1080.01 |

### ජංගම නොවන වගකීම්

ජංගම නොවන වගකීම් රු. මිලියන 5.6 කින් වර්ධනය වී ඇති අතර එයට මුලිකවම හේතු වී ඇත්තේ විලම්භිත බදු වගකීමෙහි සිදු වී ඇති වර්ධනයයි. සමාගම, වාර්තා කරන දිනයේදී රු. මිලියන 12.63 ක විලම්භිත බදු වත්කමක් හා රු. මිලියන 77.95 ක විලම්භිත බදු වගකීමක් හඳුනාගෙන ඇත. ඒ අනුව 2014.12.31 දිනට ශුද්ධ විලම්භිත බදු වගකීම රු. මිලියන 65.32 ක් වේ.

### ජංගම වගකීම්

ජංගම වගකීම් රු. මිලියන 1.39 කින් පහළ ගොස් ඇත. (2014 - රු. මිලියන 82.97, 2013 රු. මිලියන 84.36)

## මුදල් ප්‍රවාහ

2014 වසර තුළ මුදල් හා මුදල් සමාන දෑ රු. මිලියන 73.97 කින් වර්ධනය වූ අතර වසර අවසානයේ එහි වටිනාකම රු. මිලියන 409.71 ක් (2013 - රු. මිලියන 335.74) ලෙස වාර්තා විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. මිලියන 264.20 ක් දක්වා (2013-රු. මිලියන 228.93) වර්ධනය වූ අතර එයට හේතු වූයේ කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර ලාභයේ වූ වර්ධනය තුළ මෙහෙයුම් ක්‍රියාවලියෙන් ජනනය වූ මුදල් ප්‍රවාහයන්ගේ වූ වර්ධනයයි.

ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. මිලියන 120.69 කි. (2013 - රු. මිලියන 144.60) මෙම වසර තුල දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීමට හා අත්පත් කර ගැනීමට යෙදූ මූල්‍ය ආයෝජන වල වටිනාකම රු. මිලියන 159.58 කි. (2013 - රු. මිලියන 186.70) ප්‍රාග්ධන ආයෝජන වලින් වැඩි ප්‍රමාණයක් නොමේරූ වගා සංවර්ධනය, ගොඩනැගිලි ඉදිකිරීම සහ වැටවල් සකස් කිරීම සඳහා යොදවන ලද අතර ඒ සඳහා දැරූ ආයෝජනවල වටිනාකම් පිළිවෙලින් රු. මිලියන 82.38 රු. මිලියන 48.68 (කෙරීගෙන යන නොනිමි වැඩ ඇතුලුව) සහ රු. මිලියන 12.14 ක් වේ.

## ලාභාංශ ගෙවීම


බොහෝ රාජ්‍ය ආයතන මහා භාණ්ඩාගාරයට බරක් වී ඇති අවධියක සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ස්වයං මූල්‍යන ආයතනයක් ලෙස සාර්ථකව ක්‍රියාත්මක වීමට අමතරව මහා භාණ්ඩාගාරයට ලාභාංශද ගෙවීම තුලින් තමන්ගේ වගකීම මනා ලෙස ඉටු කොට ඇත.

මෙම වර්ෂය තුල ද රාජ්‍ය කළමනාකාරිත්වය යටතේ ස්වයං මූල්‍යන ආයතනයක් ලෙස සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සාර්ථකව කටයුතු කර ඇති බව අපි ආඩම්බරයෙන් ප්‍රකාශ කරමු.

2005 වසරේදී සමාගමේ කළමනාකාරිත්වය රජයට පවරා ගැනීමෙන් පසුව සමාගමේ ඉතිහාසයේ පළමුවරට ලාභාංශ ගෙවනු ලැබූයේ 2007 වසරේදීය.

2014 වසර සඳහා රු. මිලියන 45 ක ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීමට අප බලාපොරොත්තු වන අතර එය පෙර වර්ෂයේ ලාභාංශය වන රු. මිලියන 40 ට සාපේක්ෂව 12.5% ක වර්ධනයකි. මෙම ප්‍රකාශිත රු. මිලියන 45 ක ලාභාංශයද සමග මේ වන විට රු. මිලියන 275 ක් ලාභාංශ ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවීමට සමාගම කටයුතු කර ඇත.

**ලාභාංශ ගෙවීම (රු. මිලියන)**



# තිරසාරත්වය පිළිබඳ විමසුම

වැවිලි සමාගමක් වශයෙන් අප තිරසාරත්වය ලෙස අර්ථ දක්වන්නේ ආර්ථික, සමාජීය සහ පාරිසරික වශයෙන් එකාබද්ධ වූ ක්‍රියා පිළිවෙලක් මගින් වර්ධනයක් අත්පත්කර ගැනීමයි. ආර්ථික තිරසාරත්වය බවට මූලිකවම පරිවර්තනය වන්නේ සමාගමේ මූල්‍ය තිරසාරත්වයයි. ඒ මගින් ජාතියට රජයට සහ සේවකයන්ට ආර්ථික ප්‍රතිලාභයන් ලැබීම සහතික කරනු ලබයි. කෘෂිකර්මය මත පදනම් වූ ක්‍රියාදාමයක් තුල අපගේ මූල්‍ය තිරසාරත්වය පාරිසරික තිරසාරත්වය සමග බැඳී පවතී. ඒ නිසාවෙන් අපගේ ව්‍යාපාරික ක්‍රියාවන්ට උපකාරීවන ස්වභාවික පරිසරය සහ පාරිසරික පද්ධති සංරක්ෂණය කිරීමට අප බැඳී සිටිමු. මෙය අර්ථ දැක්වෙන්නේ තිරසාර භූමි සහ ජල පරිහරණය සහ ස්වභාවික සම්පත් ආරක්ෂා කරමින් තිරසාර කෘෂිකාර්මික පිළිවෙත් සිදුකිරීම යනුවෙනි.

මෙයට අමතරව සමාජීය තිරසාරත්වය සහතික කරනුවස් අපගේ වතු ආශ්‍රිතව වෙසෙන ජන කණ්ඩායම් සමග අන්‍යෝන්‍ය සම්බන්ධතා පැවැත්වීම මගින් ඔවුන්ද අපගේ ව්‍යාපාරයන්හි වැදගත් පාර්ශවකරුවන් බවට පත්කරගෙන ඇත්තෙමු. රාජ්‍ය ආයතනයක් ලෙස සමස්ථ පොදු ජනතාවට අපගේ ඇති වගකිවයුතු බව පිළිබඳව අප මනාව දැනුවත්ව සිටිමු. විනිවිද භාවයෙන් යුත් ක්‍රියාපිළිවෙත් අනුගමනය කිරීම, නිතිපතා අධීක්ෂණය හා ඇගයීම් කිරීම සහ නිසි වාර්තා කිරීමේ පිළිවෙත් මගින් දූෂණ හා වැරදි ක්‍රියාවන් නැතිකිරීම මඟින් යහපාලනයක් ඇති කිරීමට අපි කැපවී සිටිමු.

## තිරසාර කෘෂිකාර්මික පිළිවෙත්

අපගේ සියලුම වතුයායන් තුල භූමියේ ඵලදායීතාවය වැඩි කිරීම, බෝග විවිධාංගීකරණය සහ යටි වගා ඇති කිරීම තුලින් තිරසාර කෘෂිකාර්මික කළමනාකරණ පිළිවෙතක් ක්‍රියාත්මක කර ඇත. අක්කරයකට වගා කළ හැකි උපරිම පොල් ගස් ප්‍රමාණය ස්ථාපිත කිරීමට අප විසින් අති විශාල ප්‍රයත්නයක් දරා ඇති අතර 2005 වර්ෂයේදී එනම් කුරුණෑගල වැවිලි සමාග මේ කළමනාකරණය රජයට පවරාගත් වර්ෂයේදී 49 ක් වූ අක්කරයකට පැවති පොල් ගස් ප්‍රමාණය අද වන විට 56 දක්වා වැඩි කර ගැනීමට කටයුතු කර ඇත.

යටිවගා ස්ථාපනයට සුදුසු සියළුම ඉඩම් හඳුනාගෙන ක්‍රමානුකූලව හා සැලසුම් සහගතව යටිවගා ස්ථාපනය කල අතර සමහර වතුයායන් තුල මේ වනවිට යටිවගා ඇති කිරීම සඳහා සුදුසු භූමි ප්‍රමාණයක් ඉතිරි වී නොමැති තරම්ය. 2014 වසර අවසානයේ යටිවගා සහිත අක්කර ප්‍රමාණය මුළු පොල් වගා වපසරියෙන් 20% ක් ලෙස වාර්තා වූ අතර 2014 වසර තුලදී රුපියල් මිලියන 64.13 ක් පොල් යටිවගාවන් සඳහා ආයෝජනය කර ඇත. ඊට අමතරව මේරූ පොල් වගා වපසරිය තුල පාළු සිටුවීමේ ක්‍රමානුකූල මෙන්ම ස්ථාපිත වැඩසටහනක් අප සතුව ඇත. 2014 වසරේදී සිදුකළ මුලු පාළු සිටුවීම් ප්‍රමාණය 10,647 කි. මෙම ක්‍රියාවලිය තුලින් වැඩි වූ අක්කරයක් තුල ඇති පොල් ගස් සංඛ්‍යාව කුරුණෑගල වැවිලි සමාගමේ සමස්ථ අනාගත පොල් ඵලදාව සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවීමට හේතුවනු නොඅනුමානය. සී සෑම, රසායනික පොහොර භාවිතය අවම කරමින් කාබනික පොහොර භාවිතය වැඩි කිරීම, බෑවුම් සහිත ඉඩම් සඳහා වගා තාක්ෂණය යොදා ගැනීම, ආවරණ බෝග ව්‍යාප්තිය, සමෝච්ඡ කාණු කැපීම වැනි යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හරහා අපගේ ඉඩම්වල ඵලදායීතාවයේ තිරසාර වර්ධනය සහතික කර ඇත.
පසුගිය වසරට සාපේක්ෂව 2014 වර්ෂය තුල කාබනික පොහොර භාවිතය 70% කින් වැඩිකිරීමට සමාගම කටයුතු කරන ලදී. සියලු පොල් යටි වගාවන්වල පෝෂණ අවශ්‍යතාවයෙන් 50% ක් කාබනික පොහොර තුලින් ලබාදීමට කටයුතු කර ඇත. කාබනික පොහොර, පසේ සාරවත් බව, තෙතමනය රඳාපවත්වා ගැනීමේ හැකියාව, පාංශුවයනය, පසේ ව්‍යුහය සහ ශුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීම සඳහා හේතු වේ. කාබනික කෘෂි නිෂ්පාදන සඳහා පවතින ඉහළ දේශීය හා ගෝලීය ඉල්ලුම තුල අක්කර 1952 ක වපසරියක් කාබනික පොල් වගාවක් බවට පරිවර්තනය කිරීම අරඹා ඇති අතර ඒ තුලින් පොල් ගෙඩියක් සඳහා වඩා වැඩි මිලක් ලබා ගැනීමට සමාගම බලාපොරොත්තු වේ.

## වගාවන් සඳහා කෘතීම රසායන ද්‍රව්‍ය භාවිතය අවම කිරීම

පාරිසරික සුරක්ෂිතතාවය පිළිබඳ සැලකිලිමත් වෙමින් කුරුණෑගල වැවිලි සමාගම රසායනික වල් නාශක, කෘමි නාශක, දිලීර නාශක සහ රසායනික පොහොර භාවිතය අවම කර ඇති අතර ඒ සඳහා විකල්ප ලෙස ජෛව විද්‍යාත්මක හා යාන්ත්‍රික පාලන ක්‍රමයන් යොදාගැනීමට සහ කාබනික පොහොර භාවිතය වැඩි කිරීම වැනි ක්‍රමෝපායන් යොදාගැනීමට පියවර ගෙන ඇත.

### ජෛව විද්‍යාත්මක පාලනය

- පොල් වගාවෙහි මයිටාවන් පාලනය සඳහා විලෝපික මයිටාවන් භාවිතය - විලෝපික මයිටාවන් නිපදවීම සඳහා අප විසින් විද්‍යාගාරයක් ස්ථාපිත කර ඇති අතර 2014 වසර තුලදී විලෝපික මයිටා පැකට් 36,000 ක් සාර්ථකව නිෂ්පාදනය කරන ලදී. එම විලෝපික මයිටා පැකට් මයිටා හානිය බහුලව දක්නට ලැබෙන අපගේ වතුයායන් තුල බෙදාහරිමින් මයිටා උවදුර ජෛව විද්‍යාත්මකව පාලනය කිරීම සඳහා සමාගම කටයුතු කර ඇත.
- පලතුරු වගාවට හානිකරන පලතුරු මැස්සන් සහ පොල් වගාවට තර්ජනයක් වී ඇති රතු කුරුම්ණියන් පාලනය කිරීම සඳහා පෙරමෝන් උගුල් භාවිතය.
- කජු වගාවට හානිකරන හෙලෝපිලිටිස් මදුරුවා පාලනය කිරීම සඳහා දිඹියන් භාවිතය.

### යාන්ත්‍රික පාලනය

වර්තමානයේ විවිධ අවස්ථාවලදී වල්නාශකයක් ලෙස ග්ලයිපොසේට් භාවිතා කිරීම පුළුල්ව විවාදයට ලක් වී ඇති අතර රජය ග්ලයිපොසේට් භාවිතය තහනම් කිරීමට තීරණයක්

ගෙන ඇත. මෙම තත්ත්වය කල්තබා හඳුනාගත් කුරුණෑගල වැවිලි සමාගම වල්නාශකයක් ලෙස ග්ලයිපොසේට් භාවිතය වෙනුවට සී සෑම, යාන්ත්‍රික වල් නෙලීම, ආවරණ බෝග වගා කිරීම, පොහොර කවයන් ආවරණය වන පරිදි වසුන් යෙදීම වැනි ක්‍රියාමාර්ග තුලින් වල් මර්ධනය සඳහා සාර්ථකව කටයුතු කරනු ලබයි.



විලෝපික මයිටා නිෂ්පාදනය

## කාබනික පොහොර භාවිතය

කුරුණෑගල වැවිලි සමාගම කාබනික පොහොර භාවිතා කිරීම මගින් රසායනික පොහොර භාවිතය අඩු කිරීමට පියවර ගෙන ඇත. එමෙන්ම බයෝ ෆිල්ම්, බයෝ ෆර්ටිලයිසර් (ජෛව පොහොර) ක්‍රමය භාවිතා කරමින් පොල් වගාව සඳහා යොදනු ලබන රසායනික පොහොර ප්‍රමාණය 50% කින් අඩු කිරීම සඳහා මූලික පරීක්ෂණයන් මහනුවර, හන්තාන මූලික අධ්‍යයන ආයතනය සමග සහයෝගිතාවයෙන් යුතුව කරගෙන යනු ලබයි.

අපගේ වගාවන් තුල රසායන ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා රසායන ද්‍රව්‍ය භාවිතය හා පරිහරණය කිරීම මනාව අධීක්ෂණය කරනු ලබයි. ක්ෂේත්‍ර මට්ටමේ රසායනික ද්‍රව්‍ය ඉසීම සහ භාවිතා කිරීමේ යෙදී සිටින සේවකයින් එහිදී අනුගමනය කළයුතු ආරක්ෂිත ක්‍රමවේදයන් පිළිබඳ හොඳින් දැනුවත් කිරීමට හා ඒ සම්බන්ධව පුහුණු කිරීමට සමාගම කටයුතු කරනු ලබයි.



සමෝච්ඡ කාණු

## ජෛව විවිධත්වය

සියලු වතුවල ජෛව විවිධත්වය වැඩි කිරීම කෙරෙහි අප සක්‍රීයව කටයුතු කරමු. අතුරු බෝග හෝ දැව හෝ රබර් හෝ වෙනත් බෝගයක් හෝ වගා කළ හැකි භූමි හඳුනා ගැනීම සඳහා අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

අප විසින් මේ වනවිට අක්කර 1049.85 ක අතුරු බෝග ස්ථාපිත



වසුන් යෙදීම

කර ඇත. කුරුණෑගල වැවිලි සමාගමේ රබර් වගාව පසුගිය කාලය තුල අත්තනගල්ල, මහයාය, දොඩම්ගස්ලන්ද යන වතුයායන්ට සීමා වී තිබුණි. ස්වාභාවික වනාන්තර වලට සමාන ජෛව ලක්ෂණයන්ගෙන් යුත් රබර් වගාවන් ව්‍යාප්ත කිරීමේ වැදගත්කම හඳුනාගත් සමාගම, කුරුණෑගල, නාරම්මල වතුයායන්හි හඳුනාගත් කොටස් තුල රබර් වගාව අලුතින් ව්‍යාප්ත කර ඇත.

කුරුණෑගල වැවිලි සමාගම වටිනාකමින් යුත් දැව ගස් පාරිභෝජ්‍ය ජෛව වත්කමක් ලෙස හඳුනාගෙන ඇත. මේරූ දැව ගස් හෙලීම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අදාල අමාත්‍යාංශ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතන වලින් අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් පසුව සිදු කරනු ලබයි. තිරසාරත්වය සුරක්ෂිත කරනු වස් හෙලනු ලබන සෑම දැව ගසක් සඳහාම දැව ගස් 06 ක් ස්ථාපිත කිරීමට කුරුණෑගල වැවිලි සමාගම කටයුතු කර ඇත.

## අපගේ සේවකයන්

### සේවක ප්‍රතිලාභ හා ධෛර්යමත් කිරීම්

අපගේ සේවකයන් සඳහා ආරක්ෂිත ප්‍රසන්න සහ ප්‍රතිඵලදායක පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම අප විසින් මනාව අවබෝධ කරගෙන ඇත. වඩාත් වටිනාම සම්පත සුදුසුකම්, අත්දැකීම් සහ වෘත්තීය නිපුනතාවයන්ගෙන් යුත් අපගේ සේවකයින් බව අප විශ්වාස කරමු. ඉහළ මට්ටමේ වෘත්තිකයන් හා ප්‍රවීනයන් නොමැතිව වැවිලි කර්මාන්තය ලාභදායී අයුරින් මෙහෙයවීම කළ නොහැකි බව පැහැදිලි කරුණකි. ලාභදායීත්වය යන්න යතාර්ථයක් බවට පත්කළ හැකි මානව ප්‍රාග්ධන පදනමක් කුරුණෑගල වැවිලි සමාගම සතුවීම භාග්‍යයකි. කුරුණෑගල වැවිලි සමාගමේ මුළු ශ්‍රම බලකාය 1421 කි.

| ශ්‍රේණිය | ප්‍රධාන කාර්යාලය | වතු | මුළු ගණන |
|---|---|---|---|
| විධායක | 11 | 21 | 32 |
| ලිපිකරු සහ ඒ හා සමාන | 29 | 119 | 148 |
| සුළු සේවක සහ ඒ හා සමාන | 21 | 32 | 53 |
| මුරකරුවන් හා දෛනික වැටුප් ලබන සේවකයින් | - | 1,188 | 1,188 |
| මුළු ගණන | 61 | 1,360 | 1,421 |


### කාර්යසාධනය මත පදනම් වූ දිරිදීමනා ගෙවීම්

2005 වර්ෂයේ සිට ආරම්භ කල කාර්යසාධනය මත පදනම් වූ දිරිදීමනා ගෙවීම අඛණ්ඩව සිදුකරන අතර මෙම යහපත් ඇගයීම් ක්‍රමය අපගේ සේවකයින් ඵලදායී ලෙස රාජකාරි කිරීම සඳහා පොළඹවා ඇත. දළ ලාභයෙන් 11.4%ක් වන රුපියල් මිලියන 28.7ක මුදලක් 2014 වර්ෂය තුල කාර්යසාධනය මත පදනම් වූ දිරි දීමනා ගෙවීම සඳහා වෙන් කර ඇත. මෙම ප්‍රමාණය 2013 වසරේදී රුපියල් මිලියන 27.4ක් විය. මෙම වෙන් කිරීම සිදුකරනු ලැබූවේ මාසික වැටුප් ලබන සේවකයින්ට ඔවුන්ගේ මාසික දළ වැටුප මෙන් 2.5 ක ගුණයක් සහ දෛනික සේවකයන්ට රුපියල් 12,000 ක දිරි දීමනාවක් ගෙවීම සඳහාය.

### සේවකයින්ට අත්වන අනෙකුත් ප්‍රතිලාභ

- අඩුපොළී අනුපාතයක් යටතේ වූ ආපදා ණය
- පාසල් පොත් හා ඇඳුම් සඳහා පොළී රහිත ණය
- රුපියල් 1ක නාමික වටිනාකමකට පරිභෝජනය සඳහා නියමිත පොල් ප්‍රමාණයක්
- වැටුණු පොල් ඇහිලීම මත සහ මුරකරුවන්ගේ මාසික පැමිණීම මත දිරිදීමනා
- විදුලිය නොමැති මුරකරුවන්ට භූමිතෙල් දීමනාව
- සියළුම සේවකයින් සඳහා සේවක වන්දි වෙනුවෙන් රක්ෂණ ආවරණයක්
- විධායක නිලධාරීන් සඳහා රුපියල් මිලියන 01ක පුද්ගල අනතුරු රක්ෂණ ආවරණයක්
- විධායක නිලධාරීන්ගේ පවුල් ඒකකයකට රුපියල් 400,000 ක සෞඛ්‍ය රක්ෂණ ආවරණයක්
- කාර්ය මණ්ඩල සේවකයන්ගේ උසස් අධ්‍යාපනය සඳහා මූල්‍ය ආධාර
- සේවකයින්ගේ ළමුන් සඳහා උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ආධාර
- ලබා නොගත් අසනීප නිවාඩු සඳහා මසක වැටුපක්
- සමාගම සේවකයින්ගේ දළ වැටුපෙන් 12% ක් හා 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක සහ භාරකාර අරමුදලට දායක කරනු ලැබේ. මෙම දායක මුදල් කිසිදු හිඟයකින් තොරව අද දක්වා ගෙවා ඇත.

දිරිදීමනා ගෙවීම (රු. මිලියන)




රබර් කිරිකැපීම පිළිබඳ පුහුණුව


ගස් කප්පාදුව පිළිබඳ පුහුණුව

## නිවාස පහසුකම්

පසුගිය වසර කිහිපය පුරා, අපගේ වතුයායන් තුල ඇති නිවාස වල තත්ත්වය වැඩි දියුණු කිරීමට අප ප්‍රබල උත්සාහයක් ගතිමු. මෙම වසර තුලදී ජලය, විදුලිය සහ සනීපාරක්ෂක පහසුකම් සහිත ස්ථානභාර නිලධාරී නිල නිවාස 10ක් හා මුරකරුවන් සඳහා නිවාස 13ක් රුපියල් මිලියන 46.29ක් ආයෝජනයකර ඉදිකරන ලදී. එමෙන්ම, සමාගම නේවාසික සේවකයින් පිලිබඳ මනා සැලකිල්ලකින් යුතුව කටයුතු කරන අතර ඔවුන් සඳහා විදුලිය සහ සනීපාරක්ෂක පහසුකම් සහිත නිවාස ලබාදීමට කටයුතුකර ඇත.

## සේවක පුහුණුව හා සංවර්ධනය

ඵලදායිතාව වැඩිකිරීම තහවුරු කරනු වස් අපගේ සේවකයින්ට අවශ්‍ය නිපුණතාවය, දැනුම සහ ආකල්ප සංවර්ධනය සඳහා සමාගම අඛන්ඩව ආයෝජනය කරනු ලැබේ.

2014 දී, සේවක පුහුණුව හා සංවර්ධනය සඳහා ආයෝජනය කළ මුදල රුපියල් මිලියන 0.801 වූ අතර මෙම අගය 2013 වසර සඳහා රුපියල් මිලියන 1.02 කි. අඛණ්ඩ අධ්‍යයනය මෙන්ම පුද්ගල සංවර්ධනය ඉලක්කකර ගනිමින් විවිධ ගෘහස්ථ සහ බාහිර පුහුණු වැඩසටහන් රාශියක් ලබා දීමට සමාගම කටයුතු කර ඇත.

අපගේ සේවකයන්ගේ ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන් රාශියකට අනුග්‍රහය ලබා දී ඇත. ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා රැකියාව තුලින්ම වූ පුහුණුව අඛණ්ඩව ලබා දෙන අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වෘත්තීය ප්‍රවීනයන් සමග විශේෂ පුහුණු වැඩ සටහන් කිහිපයක් පසුගිය වසර තුල පවත්වන ලදී.

## සේවකයින් සමග දිගු කාලීන සම්බන්ධතා ගොඩනැගීම

සේවකයින් සමග දිගුකාලීන සම්බන්ධතා ගොඩනැගීම සඳහා සමාගම විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කරන ලද අතර ඒවා පහත දැක්වේ.

- වාර්ෂික සර්ව රාත්‍රික පිරිත් දේශනාව සාර්ථකව 6 වන වරටත් පැවැත්වීම
- නෙළුම් මල් 15000 ක දන්සලක් වෙසක්පුර පසළොස්වක පෝය දින මහනුවර දළදා මාලිගා පරිශ්‍රයේදී පැවැත්වීම
- වාර්ෂික පොසොන් උත්සවය නිමිති කොට ගෙන 8 වන වරටත් කිරිබත් දන්සැල කුරුණෑගල ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී සාර්ථකව පැවැත්වීම
- කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා වාර්ෂික සුහද හමුවක් පැවැත්වීම
- වතු අන්තර් ක්‍රිකට් තරගාවලියක් පැවැත්වීම
- වාර්ෂික විනෝද චාරිකා සංවිධානය කිරීම

අපගේ මානව සම්පත් කළමනාකරණ උපායමාර්ගී සේවක අභිප්‍රේරණය සඳහා විශාල වශයෙන් දායක වී ඇති අතර සමාගමේ ඵලදායිතාවය ඉහළ නැංවීම හා සමාගම කෙරෙහි ඇති බැඳියාව වර්ධනය වීම කෙරෙහි හේතු වී ඇත.

## දේශීය පොල් කර්මාන්තයට කල දායකත්වය

කුරුණෑගල වැවිලි සමාගම 2014 වසර තුල විවිධ ආකාරයෙන් එහි සමාජීය වගකීම සපුරා ඇත. සමාගම පොල් වගා කිරීමේ මණ්ඩලයට උසස් තත්ත්වයේ බීජ පොල් 990,633 ක් නිකුත් කරන ලදී. මෙය ජාතික පොල් සංවර්ධන වැඩ සටහනට සහ අනාගත දේශීය පොල් කර්මාන්තය සඳහා ප්‍රතිලාභ ගෙන එනු ඇත. දේශීය පරිභෝජනයට සහ පොල් කර්මාන්තයට උසස් තත්ත්වයේ පොල් සපයන පිළිගත් සැපයුම්කරුවකු වශයෙන් අපි කටයුතු කරමු.






## කුරුණෑගල වැවිලි සමාගම සහ සමාජීය සම්බන්ධතා

පසුගිය වසර කිහිපය පුරා අසල්වැසි ගොවීන්ගේ කිරි ගවයින්ට තණකොළ උලා කෑම සඳහා පහසුකම් සපයන ලද අතර එය කුරුණෑගල වැවිලි සමාගමට කාබනික පොහොර ලබා ගැනීමට මෙන්ම වගා තුල වල් මර්ධනයට යොදා ගෙන ඇත. මෙම වැඩ පිළිවෙල ජාතික කිරි නිෂ්පාදනය වැඩි කිරීමට හා අවසන් වශයෙන් කිරි ගවයින් ගහනය වැඩිවීම කෙරෙහි දායක වී ඇත.

අසල්වැසි ගොවියන්ට ආර්ථික වටිනාකමකින් යුතු වූ අර්ධ වාර්ෂික බෝග වර්ග වගාකිරීම සඳහා අප පහසුකම් ලබාදුනිමු. මේ තුලින් ඔවුන්ගේ පවුල්වල ආදායම වැඩිවී ඇති අතර ජාතික කෘෂි නිෂ්පාදනය වර්ධනය කිරීමටත් වතුයායවල භූමියේ ජෛව හා පාරිසරික සමබරතාවය වඩාත් දියුණු වීම සඳහාත් හේතු වී ඇත. මෙම යාන්ත්‍රනය තුළින් වගා කිරීම සම්බන්ධ සාම්ප්‍රදායික දැනුම සතු දක්ෂ ශ්‍රමිකයන් හඳුනාගෙන ඔවුන් සමාගමේ සේවක මණ්ඩලය තුලට අවශෝෂණය කර ගැනීමේ අවකාශයද උදාවී ඇත.

සමාගම විසින් වාර්ෂිකව මහනුවර ශ්‍රී දළදා පෙරහැර, විවිධ පන්සල් සහ දේවාල පෙරහැර සඳහා කොප්පරා ලබාදේ. ආගමික ස්ථාන සහ පාසල් ඉදිකිරීම්/ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය දැව ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් සඳහා සමාගම අනුග්‍රාහකත්වය ලබාදීමට කටයුතු කරයි.

තිරසාරත්වයේ වටිනාකම් අපගේ මෙහෙයුම් ක්‍රියාවලිය සමග බැඳී පවතී. නිසි කළමනාකාරිත්වයෙන් යුත් ව්‍යාපාරයක් සතුව ආර්ථික, සමාජීය හා පාරිසරික තිරසාරත්වයක් තිබිය යුතුය. කුරුණෑගල වැවිලි සමාගම, වැවිලි සමාගමක් ලෙස ආර්ථික වශයෙන් ලාභදායී කෘෂිකාර්මික කටයුතුවල නියැලී සිටිමින් පරිසරය ආරක්ෂා කරමින්, ජෛව විවිධත්වය වර්ධනයට දායක වෙමින් සහ සේවකයින්ගේත් සමස්ථයක් ලෙස ජාතියේත් යහපැවැත්ම සහතික කරමින් තම ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබේ.



# අවදානම් කළමනාකරණය

කුරුණෑගල වැවිලි සමාගම සිය මෙහෙයුම් සිදු කෙරෙන සමාජ - දේශපාලනික පරිසරය තුළ පොල්, රබර් සහ වෙනත් බෝග වගා කිරීම, සැකසීම සහ අලෙවිය සම්බන්ධ අවදානම් කිහිපයකට නිරාවරණය වේ. මෙම අවදානම් කළමනාකරණය සඳහා මූල්‍ය, මෙහෙයුම් සහ වෙනත් පාලනයන් ක්‍රියාකාරීව යොදා ගෙන ඇත.

## මෙහෙයුම් අවදානම

අපගේ ප්‍රධාන බෝගය වන පොල් සමාගමෙහි ප්‍රමුඛ ආදායම් මාර්ගය වේ. ජාතික නිෂ්පාදනයෙන් 70%කට අධික ප්‍රමාණයක් දේශීය වශයෙන් පරිභෝජනය කෙරෙන අතර කර්මාන්ත අංශය සඳහා ඉතිරි වනුයේ 30%ක පමණ වූ ප්‍රමාණයකි. මෙම තත්ත්වය මගින් වෙළෙඳ පොළ උච්චාවචනයන් නිර්මාණය කෙරෙන අතර ඉහළ ඵලදා තත්ත්වයන් හැමවිටම පහළ වාර්ෂික පිරිවැටුමක් සඳහා හේතු වේ. උසස් තත්ත්වයේ පොල් නිෂ්පාදනය සහ ප්‍රතික්ෂේප වීම් අවම කිරීම මගින් කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන අධිකාරිය මගින් පවත්වනු ලබන පොල් වෙන්දේසි වලදී ගැනුම්කරුවන්ගේ ගෞරවයට පාත්‍ර වේ. වෙළෙඳ පොළ තුළ ඉහළ තරඟකාරිත්වයක් ඇති කිරීම උදෙසා සමාගම මගින් දේශීය ගැණුම්කාර පදනමක් ගොඩනගා ඇති අතර එමගින් අස්වැන්න අධික සමයන්හිදී අදාළ පොල් තොග අලෙවිය පහසු වී ඇත. පොල් ගබඩා කරන ස්ථාන වෙත පහසු පිවිසුමක් ලබාදීම, පොල් ලෙලි ගසන්නන් හට නේවාසික පහසුකම් ලබාදීම සහ වතු තුල අභ්‍යන්තර ප්‍රවාහන පහසුකම් සැපයීම මඟින් සමාගම එහි ගැණුම්කරුවන්ට හිතකාමී පරිසරයක් ඇති කිරීමට කටයුතු කර ඇත.

මේ වන විට නිරන්තරයෙන් උද්ගත වන තත්ත්වයක් බවට පත්ව ඇති අහිතකර කාලගුණ තත්ත්වයන් පොල්ද ඇතුළුව සියළු බෝග කෙරෙහි අයහපත් අයුරින් බලපා ඇත. දිගු නියගයන් සහ අධික වර්ෂාපතනයන්ද නියමාකාරයෙන් අස්වැන්න නෙළාගැනීමේ ක්‍රියාවලීන් කෙරෙහි බලපා ඇත. පසෙහි තෙතමනය පවත්වා ගනිමින් පස සංරක්ෂණය සඳහා අප විසින් පොල් ලෙලි වැලලීම, අගල් කැපීම හා කාබනික පොහොර භාවිතය වැනි කටයුතු ක්‍රියාත්මක කර ඇත. සියළු මේරූ රබර් වගාවන්ට වැසි ආවරණ යෙදීමටද කටයුතු කර ඇත.

## පලිබෝධ සහ රෝග

පොල් මයිටාවන් (Aceria guerreronis), පත්‍ර වලට හානි කරන කෘමීන් (Plessispa) සහ වැලිගම කොළ මැලවීමේ රෝගය (Weligama Wilt) යනාදී මෑත කාලයේදී වර්ධනය වූ රෝග සහ පලිබෝධ පැවති කෘමි, පලිබෝධ සහ රෝග කාණ්ඩ සමග එක්ව මනා පොල් වගාවන් ඇති කිරීම කෙරෙහි බලවත් තර්ජනයක් එල්ල කර ඇත. වැලිගම කොළ මැලවීමේ රෝගය පොල් වගාවට බරපතල ලෙස හානි පමුණුවන රෝගයක් බවට පත්ව ඇති අතර එහිදී අදාල වගාවන් ගලවා ඉවත්කිරීම හැර වෙනත් විකල්පයක් නොමැති වී ඇත. කෙසේවුවද පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මෙම රෝගය පැතිරීම අවම කිරීමෙහිලා ප්‍රසංශනීය කාර්යභාරයක් ඉටු කර ඇත. අප සමාගම අවම අවදානම් තත්ත්වයකට මුහුණපෑවද අප විසින් මෙම රෝගය හඳුනාගැනීම සඳහා අප සේවකයින් සතු දැනුම වර්ධනය සඳහා කටයුතු කර ඇත.

විලෝපික මයිටාවකු යොදාගනිමින් මයිටා උවදුර සාර්ථකව පාලනය කරනු ලැබ ඇත. අපගේ විද්‍යාගාරයේදී පොල් පර්යේෂණ ආයතනයෙහි මගපෙන්වීම යටතේ මෙම විලෝපික මයිටාවන් නිෂ්පාදනය කෙරේ. එම විලෝපික මයිටාවන් වෙනත් පොල් වගාකරුවන් වෙතද සාධාරණ මිලකට ලබාදීමට කටයුතු කර ඇත. පළපුරුදු ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ නිරන්තර අධීක්‍ෂණය තුල අපගේ වගාවන් රෝග හා පලිබෝධ වලින් ආරක්ෂා කරගැනීමට හැකි වී ඇත.

## බෝග ආරක්‍ෂාව

ගිනි ගැනීම් සහ ජල ගැලීම් වැනි ස්වාභාවික ආපදාවන් ගේ අවදානමට අමතරව පොල් බහුල වශයෙන් පරිභෝජනයට ගැනෙන බෝගයක් වශයෙන් නිරන්තරයෙන් සොරකම් කිරීමේ අවදානමට ලක් වේ. පලාත් වතුයායන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කිහිපයක් පුරා පැතිරුන කුඩා වතු කොටස් සමූහයකින් සමන්විත වීම නිසා මෙම අවදානම් තත්ත්වය තවත් ඉහළ ගොස් ඇත. මාසිකව පොල් නෙලන වපසරිය උපරිම කිරීමට මේවන විට කටයුතු කර ඇති අතර එය සමස්ථ පොල් නෙලන වපසරියෙන් 90% ක් පමණ වේ. ද්වි මාසිකව අස්වැන්න නෙලීමට සාපේක්‍ෂව පොල් වැටීමේ ප්‍රතිශතය මෙම ක්‍රමය තුල අඩුවීම හේතුවෙන් සොරකම් කිරීමේ අවදානම අඩුවී ඇත. තවද වැටවල් ශක්තිමත් කිරීම, වතු අධිකාරීවරුන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ අභ්‍යන්තර විගණන අංශය විසින් කරනු ලබන නිරන්තර අධීක්‍ෂණය තුල මෙම තත්ත්වය අවම කිරීම සඳහා කටයුතු කර ඇත. වැටුණු පොල් ඇහිලීම වෙනුවෙන් මුරකරුවන් වෙත දිරිදීමනා ලබාදීමද තවත් එක් උපායමාර්ග යකි.

## ශ්‍රම හිඟය

පොල් වගා කරුවන් පුහුණු ශ්‍රමය සොයා ගැනීම සම්බන්ධ බරපතල අර්බුදයකට මුහුණ පා ඇත. ශ්‍රමිකයින්ගේ හිඟය හේතුවෙන් එදිනෙදා කෘෂිකාර්මික කටයුතු සිදුකිරීම ද අසීරු තත්ත්වයකට පත්ව ඇත. තේ සහ රබර් මෙන් නොව පොල් වතුයායන් තුල නේවාසික ශ්‍රමික පිරිසක් නොමැති බැවින් අසල

## අවදානම් කළමනාකරණය

ගම්වල ශ්‍රමය මත රඳා පැවතීමට සිදුවේ. අප විසින් නිසි පරිදි අපගේ ශ්‍රම බලකාය තුලින් උපරිම දායකත්වයක් ලබාගැනිම සහ යාන්ත්‍රීකරණය තුල ප්‍රශස්ථ ප්‍රතිඵල නෙලා ගැනීමට කටයුතු යොදා ඇත.

විදුලිය, ජලය සහ නේවාසික පහසුකම් නොමිලේ ලබා දෙමින් ද ගෙවීම් සහ දිරිදීමනා ඉහළ නැංවීමෙන් ද සහන පොලී යටතේ ණය ලබා දෙමින් ද සේවකයින්ගේ අවශ්‍යතා ඉටු කර දීමෙන් ද මිත්‍රශීලී සහ විනය ගරුක සේවක පිරිසක් බිහි කර ගැනීමට සමාගම කටයුතු කරනු ලැබේ.

### ඉඩම් අත්පත් කර ගැනීමේ අවදානම

ජාතික අවශ්‍යතාවයන් සහ ව්‍යාස්ථාපිත නිශ්චයන් මත සමාගම සතු ඵලදායී ඉඩම් අත්පත් කර ගැනීමේ අවදානමට නිරාවරණය වී ඇත. මේ වනවිට, 1992 වර්ෂයේ සමාගම පිහිටුවීමේදී සමාගමට බාර දුන් ඉඩම් වලින් 20% කට ඩැඩි ප්‍රමාණයක් අහිමි වී ඇත.

### වෘත්තීය සමිති, සමාජ සහ පරිසර වෙනස්වීම්

කුරුණෑගල වැවිලි සමාගම කාර්මික සංහිඳියාවෙහි වැදගත්කම අවබෝධ කරගනිමින් ලංකා සේවක සංගමය සමඟ සාමූහික ගිවිසුමකට එළඹුනි. වැටුප්, ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවක වන්දි නිසි කලට ගෙවීම සහ සේවක ගැටළු වලට ප්‍රමුඛතාවය ලබාදීම වැනි කරුණු කෙරෙහි සමාගමේ නිරන්තර අවධානය යොමු කිරීම තුලින් කාර්මික සංහිඳියාව ශක්තිමත් කිරීමට සමාගම කටයුතු කර ඇත.

# සාමූහික පාලන ප්‍රකාශය

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකකම, ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හා වගකීම් සහගත බව යන ප්‍රතිපත්ති තුල ක්‍රියාකරනු ලබයි. මෙය සමාගම සහ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස් සමග ප්‍රබල සම්බන්ධතාවයක් ඇති කිරීම සඳහා හේතු වී ඇත. ව්‍යවස්ථාපිත අශ්‍යතාවයන් සහ ආයතනික ස්ථායිතාව මෙන්ම ව්‍යාපාරික වටිනාකම් වර්ධනයවන අයුරින් සකස්කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියාපටිපාටීන්, ක්‍රියා පිළිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරීම සඳහා හේතු වී ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යසාධනය සඳහා වගකිවයුතු වන්නාසේම අවසාන වශයෙන් ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටින්නේය.

## වගකීම

මූල්‍ය ප්‍රතිපත්තීන් හා උපායශීලි අරමුණු සකස් කිරීමටත් ඒවා ක්‍රියාවට නැංවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැඳීසිටී. සමාගමේ මූල්‍ය තොරතුරුවල විශ්වාසනීයත්වය සහ අභ්‍යන්තර පාලන පද්ධතීන්හි සාර්ථකත්වය සඳහාද අවසාන වගකීම දරන්නා වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

## සංයුතිය

සභාපතිතුමාගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් සත් දෙනෙකුගෙන් යුක්ත වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබයි. සමාගමේ උපායශීලී ක්‍රමෝපායන්, වාර්ෂික අය වැය, සියළු කාර්යන් වල ප්‍රගතිය, ප්‍රාග්ධන හා ප්‍රවර්තන වියදම් සමාලෝචනයට ලක්කිරීම මෙම රැස්වීම් වලදී සිදුකරනු ලබයි.

සෑම රැස්වීමක් පවැත්වීමටම සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හට ලබාදීමට කටයුතු කරනු ලැබේ. නව අධ්‍යක්ෂක මණ්ඩලය 2015 මාර්තු 13 වන දින පත්කරන ලදී.

මෙයට පෙර සිටි අධ්‍යක්ෂ මණ්ඩලය 2014 වසර තුලදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12ක් පවත්වා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගිත්වය පහත පරිදි වේ.

| | |
|---|---|
| ආචාර්ය සුනිල් ජයසේකර<br>සභාපති | 11/12 |
| පී. ජී. අමරකෝන් මහතා<br>විධායක අධ්‍යක්ෂ | 10/12 |
| ආර්. ඩබ්. එම්. ජේ. ආර්. පෙරේරා මහතා<br>ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 11/12 |
| ඒ. පී. කුරුම්බලපිටිය මහතා<br>අධ්‍යක්ෂ/මහා භාණ්ඩාගාර නියෝජිත | 12/12 |
| මහාචාර්ය ඩබ්. පී. ගාමිනී ද අල්විස් මහතා | 9/12 |
| ජී. වී. ඒ. ඩබ්. ඩී. ගමආරච්චි මහතා | 8/12 |
| ජේ. දේවපිරාන් මහතා | 9/12 |

## විගණන කමිටුව

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වෙයි. භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා එම විගණන කමිටුවේ සභාපතිත්වය දරයි. මෙම රැස්වීම් නිසියාකාරව පැවැත්වෙන අතරම ගරු සභාපති, විධායක අධ්‍යක්ෂ, ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහ පලාත් වතු අධිකාරිවරුන් මෙම රැස්වීම්වලට ආරාධිතව සහභාගි වේ. මෙම රැස්වීම් සම්බන්ධීකරණය විගණන කළමනාකරු විසින් සිදු කරයි. නව විගණන කමිටුව 2015 අප්‍රේල් 07 වන දින පත්කරන ලදී.

මෙයට පෙර සිටි විගණන කමිටුව 2014 වසර තුලදී විගණන කමිටු රැස්වීම් 04ක් පවත්වා ඇති අතර විගණන කමිටු සාමාජිකයින්ගේ සහභාගිත්වය පහත පරිදි වේ.

| | |
|---|---|
| ඒ. පී. කුරුම්බලපිටිය මහතා<br>අධ්‍යක්ෂ/මහා භාණ්ඩාගාර නියෝජිත | 4/4 |
| ජී. වී. ඒ. ඩබ්. ඩී. ගමආරච්චි මහතා | 3/4 |
| ජේ. දේවපිරාන් මහතා | 4/4 |

## නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලවීම

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සියළුම අවස්ථාවන්හිදී සාංගමික සංස්ථාපත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා බලපවත්වන අනෙකුත් නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට උත්සාහ ගනු ලබයි.

එමෙන්ම සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි පිළියෙල කරන බවටත් 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලවන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු වේ.



# මූල්‍ය වාර්තා



# අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් එහි අධ්‍යක්ෂවරුන් ලෙස ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි.

## පොදු හැඳින්වීම

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව 1982 අංක 17 සමාගම් පනත යටතේ සීමාසහිත පොදු සමාගමක් ලෙස පිහිටුවා ඇත. එය 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇති අතර නව ලියාපදිංචි අංක PB 1319 වේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කුරුණෑගල, දඹුල්ල පාරේ, අංක 80 දරණ ස්ථානයේ පිහිටා ඇත.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම තනි කොටස්කරුවකුගෙන් යුත් සමාගමක් වන අතර ශ්‍රී ලංකා ජනරජයේ භාණ්ඩාගාර ලේකම් එකම කොටස්කරු වේ.

## සමාගමේ ප්‍රධාන කටයුතු සහ ව්‍යාපාරයේ ස්වභාවය

අදාල වර්ෂයේදී සමාගමේ ප්‍රධාන කටයුතු ලෙස පොල්, රබර් සහ අනෙකුත් කෘෂි නිෂ්පාදන වගාකිරීම, නිෂ්පාදනය සහ විකිණීම සිදුකරණ ලදී. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වතුයාය 08 කින් සමන්විත වන අතර ඒවා කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ව්‍යාප්තව පවතියි. එම වතුයායන් නම්,

| | |
|---|---|
| අත්තනගල්ල | කටුගම්පල |
| දඹදෙණිය | කුරුණෑගල |
| දොඩම්ගස්ලන්ද | නාරම්මල |
| හිරියාල | මහයාය |

## අඛණ්ඩ පැවැත්ම

දුර දක්නා අනාගත කාලයක් සමාගමේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් පරිදි සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වේ. ඒ අනුව ගිණුම් වාර්තා අඛන්ඩ පැවැත්ම සංකල්පය යටතේ පිළියෙල කර ඇත.

## මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව

මෙහි පිටු අංක 50 සිට 87 දක්වා 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අත්සන් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් සහ විගණන වාර්තාව ඇතුළත් කර ඇත.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 56 සිට 67 දක්වා පිටුවල දැක්වේ. සමාගම විසින් පසුගිය වසරේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීමකින් තොරව එලෙසම මෙම වර්ෂයේදීද යොදාගෙන ඇත.

## ආදායම

2014 වසරේ සමාගමේ මුළු ආදායම රුපියල් මිලියන 576.79ක් විය (2013දී රුපියල් මිලියන 475.89කි). වසරේ අනෙකුත් මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 103.03කි (2013දී රුපියල් මිලියන 95.83). වසර තුළ ඉපයූ පොළී ආදායම රුපියල් මිලියන 31.34කි (2013දී රුපියල් මිලියන 44.34). මෙය ගිණුම්කරණ සටහන් අංක 05 යටතේ දක්වා ඇත.

## ප්‍රතිඵල හා විසර්ජනයන්

2014 වසර සඳහා සමාගමේ බදු පසු ලාභය රුපියල් මිලියන 214.24කි. (2013දී රුපියල් මිලියන 208.15) සමාගමේ මූල්‍ය ප්‍රතිඵල විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

| රුපියල් මිලියන | **2014** | 2013 |
|---|---|---|
| පොල්වලින් ලද ලාභය | **247.21** | 189.35 |
| රබර්වලින් ලද ලාභය/අලාභය | **(2.36)** | 13.99 |
| වෙනත් බෝගවලින් ලද ලාභය | **5.94** | 3.76 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | **103.03** | 95.83 |
| | **353.83** | 302.92 |
| පරිපාලන වියදම් | **(131.15)** | (109.25) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ලාභය | **222.68** | 193.67 |
| ශුද්ධ මූල්‍ය ආදායම | **-** | - |
| පොළී ආදායම | **31.34** | 44.34 |
| පොළී වියදම | **(26.01)** | (24.38) |
| | **19.96** | 5.34 |
| බදු පෙර ලාභය | **228.01** | 213.63 |
| ආදායම් බදු වියදම | **(13.78)** | (5.48) |
| වසරේ ලාභය | **214.24** | 208.15 |

## ප්‍රාග්ධන වියදම් හා ආයෝජන

2014 වසර තුළදී රුපියල් මිලියන 159.58ක් (2013දී රුපියල් මිලියන 186.70) ස්ථාවර වත්කම්වල ආයෝජනය කර ඇත. ඉන් රුපියල් මිලියන 82.38 (2013දී රුපියල් මිලියන 93.66) නොමේරූ වගාවන් සඳහා දරා ඇත.

## කෙටිකාලීන ආයෝජන

2014 දෙසැම්බර් 31 දිනට කෙටිකාලීන ආයෝජන වල වටිනාකම රුපියල් මිලියන 400ක් විය. (2013 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 326) මෙම ආයෝජන රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ලෙස පැවතිනි. (ලංකා බැංකුව රුපියල් මිලියන 65, මහජන බැංකුව රුපියල් මිලියන 175 සහ ඉතිරි කිරීමේ බැංකුව රුපියල් මිලියන 160)

## ස්කන්ධ ප්‍රාග්ධනය

කොටස් විකිණීමෙන් ලැබුණු සම්පූර්ණ මුදල් ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස දක්වා ඇත. 2014 දෙසැම්බර් 31 දිනට මුළු ස්කන්ධ ප්‍රාග්ධනය රුපියල් 200,000,010 කි. මෙය සාමාන්‍ය කොටස් 20,000,000 ක් සහ භාණ්ඩාගාර ලේකම් විසින් දරණ ස්වර්ණමය කොටස් 01 කින් සමන්විත වෙයි. අදාළ වර්ෂය තුළදී කිසිදු කොටස් නිකුත් කිරීමක් සිදු කර නැත.

## සංචිත

2014 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ලාභය රු. මිලියන 1043.15 කි. මීට අමතරව දැව සංචිත වශයෙන් රු. 203.48 ක්ද වෙනත් සංචිත ලෙස රු. මිලියන 6.94 ක් ද පැවතිණි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

වසර තුළ තනතුරු දැරූ අධ්‍යක්ෂවරුන්ගේ නම් පහතින් දැක්වේ.

*2014.01.01 සිට 2014.12.31*

| නම | තනතුර | පත්වීම් දිනය | ඉල්ලා අස් වූ දිනය |
|---|---|---|---|
| ආචාර්ය සුනිල් ජයසේකර | සභාපති | 24.09.2013 | 30.01.2015 |
| පී. ජී. අමරකෝන් මහතා | විධායක අධ්‍යක්ෂ | 24.09.2013 | 16.03.2015 |
| ආර්. ඩබ්. එම්. ජේ. ආර්. පෙරේරා මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 24.09.2013 | 12.03.2015 |
| ඒ. පී. කුරුම්බලපිටිය මහතා | අධ්‍යක්ෂ/ මහා භාණ්ඩාගාර නියෝජිත | 24.09.2013 | 05.03.2015 |
| මහාචාර්ය ඩබ්. පී. ගාමිනී ද අල්විස් මහතා | අධ්‍යක්ෂ | 24.09.2013 | 12.03.2015 |
| ජී.වී. ඒ. ඩබ්. ඩී. ගමආරච්චි මහතා | අධ්‍යක්ෂ | 24.09.2013 | 12.03.2015 |
| ජේ. දේවපිරාන් මහතා | අධ්‍යක්ෂ | 24.09.2013 | 28.01.2015 |

*වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය*

| නම | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|
| ඒ. එම්. පියසෝම උපාලි මහතා | සභාපති | 29.01.2015 |
| ඩී. එම්. බණ්ඩාරනායක මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 26.03.2015 |
| එච්. ඒ. එන්. සමන් කුමාර මහතා | අධ්‍යක්ෂ/ මහා භාණ්ඩාගාර නියෝජිත | 06.03.2015 |
| සුනිල් එස්. අලස් මහතා | අධ්‍යක්ෂ | 06.03.2015 |
| ඩී. පී. විජේසිංහ මහතා | අධ්‍යක්ෂ | 13.03.2015 |
| ඩබ්. එම්. ඩී. බී. අබේරත්න මහතා | අධ්‍යක්ෂ | 13.03.2015 |
| ඩබ්. ඒ. ඩී. ඩී. එම්. ප්‍රියන්ත මහතා | අධ්‍යක්ෂ | 13.03.2015 |

## අධ්‍යක්ෂවරුන් සමාගමේ ගනුදෙනු කෙරෙහි ඇති සම්බන්ධතාවය

සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය ඍජුව හෝ වක්‍රව හෝ සමාගමේ ගනුදෙනු කෙරෙහි කිසිදු ආකාරයකින් බලපෑමක් කර නොමැත.

## අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම

සමාගමේ කිසිඳු අධ්‍යක්ෂවරයෙකු හෝ ඔවුන්ගේ කලත්‍රයකු සමාග මේ කොටස් සඳහා හිමිකම් නොකියයි.

## විගණන කමිටුම

පහත අධ්‍යක්ෂවරුන් 2014 වසර තුළදී විගණන කමිටුවේ සේවය කර ඇත.

| | |
|---|---|
| ඒ. පී. කුරුම්බලපිටිය මහතා | අධ්‍යක්ෂ/ මහා භාණ්ඩාගාර නියෝජිත (2015.03.05 ඉල්ලා අස්විය) |
| ජී. වී. ඒ. ඩබ්. ඩී. ගමආරච්චි මහතා | අධ්‍යක්ෂ (2015.03.05 ඉල්ලා අස්විය) |
| ජේ. දේවපිරාන් මහතා | අධ්‍යක්ෂ (2015.01.28 ඉල්ලා අස්විය) |

# අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

## සේවා නියුක්තිය

සේවකයන් තෝරා ගැනීමේදී සමාගම වෙනස්කම් කෙරෙහි අවධානය යොමු නොකොට සමානාත්මතා සංකල්පය මත ක්‍රියා කිරීමට සැමවිටම කටයුතු කරයි. පුහුණුව, සංවර්ධනය සහ උසස්වීම් ලබාදීම ආදියේදී සැමවිටම පදනම් වන්නේ කුසලතාවයයි. එමෙන්ම ජාතිය, ආගම, දේශපාලනික මතවාද, ස්ත්‍රී පුරුෂභාවය, විවාහක අවිවාහක බව හෝ ශාරීරික දුබලතා පිළිබඳව වෙනස්කම් නොදක්වා සැමටම සමාන අවස්ථාවන් ලබාදීමට කටයුතු කරයි.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය උපරිම දැනුම අනුව සමාගම විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට ගෙවීමට නියමිත සියලු බදු සහ සමාගමේ සේවකයන් සඳහා ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් දන්නා ස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති බවට හෝ ගෙවීම් සිදුකිරීම සඳහා ප්‍රතිපාදන කර ඇති බවට හෝ අධ්‍යක්ෂකවරුන් සහතික වේ.

## මූල්‍ය වාර්තා ඉදිරිපත්කරන දිනට පසු සිදුවීම්

මූල්‍ය වාර්තා ඉදිරිපත්කරන දිනයේ සිට මෙම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන දින දක්වා ගිණුම් සටහන් අංක 28 හි අනාවරණය කර ඇති කරුණු හැර ගිණුම් ප්‍රකාශන කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇතිකරන වෙනත් කිසිදු සිදුවීමක් සිදුවී නොමැත.

## විගණකවරු

2014 වසරේ ගිණුම් දයානන්ද සමරවික්‍රම සහ සමාගම (වරලත් ගණකාධිකාරීවරු) විසින් විගණනය කර ඇත.

## වාර්ෂික වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩලය 2015 මාර්තු 30 දින මූල්‍ය වාර්තා අනුමත කර ඇත.

## වාර්ෂික මහා සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම 2015 ජූනි 26 දින ප.ව.12.30ට කුරුණෑගල, දඹුල්ල පාරේ, අංක 80 දරණ ස්ථානයේදී පැවැත්වේ.

වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම මෙයට අමුණා ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ

**ඒ. එම්. පියසෝම උපාලි**
සභාපති

**එච්. ඒ. එන්. සමන් කුමාර**
අධ්‍යක්ෂ/මහා භාණ්ඩාගාර නියෝජිත

**සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම**
ලේකම්වරු - කුරුණෑගල වැවිලි සමාගම
කුරුණෑගල - 2015 ජූනි 02 දින

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පහත දැක්වෙන ප්‍රකාශනයෙහි දක්වා ඇත. 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතා අනුව පිළියෙල කල මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ විගණකවරුන්ගේ වගකීම විගණකවරුන්ගේ වාර්තාවෙහි දක්වා ඇත.

## මූල්‍ය ප්‍රකාශයන් පහත දැක්වෙන ප්‍රකාශයන්ගෙන් සමන්විත වේ;

- මූල්‍ය වර්ෂය සඳහා සමාගමෙහි ලාභ/ අලාභ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිඹිබු වන අයුරින් සකස්කල විස්තීර්ණ ආදායම් ප්‍රකාශය.
- සමාගම් පනතෙහි අවශ්‍යතා වලට අනුකූලව මූල්‍ය වර්ෂය අවසානයේදී සමාගමෙහි මූල්‍ය තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු වන අයුරින් සකස් කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.

අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී පහත දැක්වෙන කරුණු තහවුරු කල යුතු වේ.

- සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඒවා අඛණ්ඩව හා සංගතභාවයෙන් යුතුව යොදාගැනීමටත් යම් ප්‍රමාණාත්මක බැහැරවීමක් සිදුවී ඇත්නම් ඒවා සවිස්තරාත්මක ලෙස අනාවරණය කිරීමට කටයුතු කර ඇති බව.
- අදාළ සියළුම ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇති බව.
- නිෂ්චයන් සහ ඇස්තමේන්තු සාධාරණ සහ විචක්ෂණශීලී ඒවා බව.
- සමාගමට සිය මෙහෙයුම් කටයුතු දුර දක්නා අනාගත කාල පරිච්ඡේදයක් තුල පවත්වා ගෙන යාමට අවශ්‍ය සම්පත් පවතින බවට අධ්‍යක්ෂක මණ්ඩල තහවුරු කරන අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම සංකල්පය යොදාගැනීම සාධාරණ බව.

සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව ප්‍රමාණවත් තරම් ගිණුම් වාර්තා පවත්වා ගෙන යාමටත්, සමාගමේ මූල්‍ය තත්ත්වය යහපත් මට්ටමක පවත්වාගෙන යාමටත්, මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව ඉදිරිපත් කිරීමටත් අධ්‍යක්ෂක මණ්ඩලය බැඳී සිටී.

සමාගම සතු වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා හා වෙනත් අක්‍රමිකතා හඳුනාගෙන ඒවා වැලැක්වීම පිණිස සුදුසු අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාම අධ්‍යක්ෂක වරුන්ගේ වගකීමකි.

සිය විගණන මතය ලබාදීම සඳහා විගණකවරුන් වෙත සියළු පරීක්ෂාවන් සඳහා අවසර ලබාදීමද අධ්‍යක්ෂවරුන්ගේ වගකීමකි.

සමාගම් පනත අනුව අධ්‍යක්ෂවරුන් විසින් සමාගමෙහි වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව අදාළ රැස්වීම පැවැත්වෙන දිනට අවම වශයෙන් වැඩ කරන දින 15 කට පෙරාතුව සියළුම කොටස් හිමිකරුවන් වෙත යැවිය යුතු වේ.

මෙම ප්‍රකාශනයෙහි දක්වා ඇති සියළු වගකීම් ඉටු කරනු ලැබ ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයෙහි මතය වේ.

## අනුකූලතා ප්‍රකාශය

අධ්‍යක්ෂවරුන් විසින් ස්වකීය උපරිම දැනුම අනුව සමාගම මගින් ගෙවිය යුතු සියළු බදු, තීරු බදු සහ සමාගම විසින් එහි සේවකයන් වෙත ගෙවිය යුතු සියළු ව්‍යවස්ථාපිත ගෙවීම් ගිණුම් වාර්තා ඉදිරිපත් කරන දින වන විට ගෙවනු ලැබ ඇති බව හෝ ගෙවීම සඳහා ගිණුම්තුල අවශ්‍ය වෙන්කිරීම් කර ඇතිබව හෝ තහවුරු කෙරේ.

අධ්‍යක්ෂවරුන්ගේ අණ පරිදි

**කෝර්පරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම**
ලේකම්වරු - කුරුණෑගල වැවිලි සමාගම

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව


*Dayananda Samarawickrema & Co.,*

**CHARTERED ACCOUNTANTS**

**Partners**
H.G. Dayananda FCA
K.G. Chandana Kumara ACA
**Consultant**
T.H. Dharmasena FCA, BA

No. 20/26, Station Lane, (Janatha Pola Road)
Nugegoda, Sri Lanka.
Tele : 2854614, 2809650, 2822940
Fax : 2820112
E-mail : dsandco@sltnet.lk


## කුරුණෑගල වැවිලි සමාගමෙහි කොටස් හිමිකරුවන් වෙත

### මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ වාර්තාව

කුරුණෑගල වැවිලි සමාගමේ 2014 දෙසැම්බර් මස 31 වැනි දිනට පිළියෙල කරන ඇති මූල්‍ය ප්‍රකාශයන් එනම්, එම දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එම දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය වන විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ගිණුම්සටහන් අප විසින් විගණනය කරන ලදී.

### මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ කළමනාකාරීත්වයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සමාගමේ අධ්‍යක්ෂ වරුන්ගේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන කළමනාකරණයේ නියෝජනයක් වේ. මෙම ප්‍රකාශය පිළියෙල කිරීමේදී වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ නිශ්චයන් කිරීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ක්‍රම තීරණය කිරීමද කළමනාකාරීත්වයේ වගකීමකී. මීට අමතරව වැරදි හා වංචා අවම වන ලෙස අභ්‍යන්තර පාලන ක්‍රමයන් ඇති කිරීමද ඒවා ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යාමද කළමනාකාරීත්වයේ වගකීමකී.

### විගණනයේ විෂය පථය සහ මතයේ පදනම

විගණකවරුන් ලෙස අපගේ වගකීම වන්නේ අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන ගැන මතයක් ප්‍රකාශ කිරීමයි. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව අපි අපගේ විගණනය කරගෙන ගියෙමු. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍යතාවයන්ගෙන් තොරදැයි සාධාරණ තහවුරුවක් ලබා ගැනීමේ අරමුණින් අප විසින් විගණනය සැලසුම් කර ඉටු කිරීම මෙම ප්‍රමිතීන් මගින් අවධාරණය කෙරේ.

මූල්‍ය ප්‍රකාශන වල අගයන් හා හෙළිදරව් කිරීම් තහවුරු කිරීමට නියැදි පදනමක් මත සාක්ෂි පරීක්ෂා කිරීම මූල්‍ය විගණනයට ඇතුළත් වේ. භාවිත කල ගිණුම්කරණ ප්‍රමිතීන් සහ කළමනාකරණය විසින් කරන ලද වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීම් මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම ඇගයීමකට ලක් කිරීම විගණනයට ඇතුළත් වේ. අපගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව අපගේ විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු හා පැහැදිලි කිරීම් අපි ලබා ගතිමු. එමනිසා අපගේ විගණනය අපගේ මතය සඳහා සාධාරණ පදනමක් වන්නේ යැයි අපි විශ්වාස කරමු.

### මතය

අපගේ මතය වන්නේ අපගේ විගණනයෙන් පෙනීයන අන්දමට 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමාගම නිසි පරිදි ගිණුම් පොත්පත් පවත්වන ලද අතර මූල්‍ය ප්‍රකාශන මගින් සමාගමේ ගණුදෙනු, ක්‍රියාකාරීත්වය හා තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දර්ශණයක් පෙන්නුම් කරන බවත් 2014 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වන ලාභය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ගණනය කර ඇති බවත්ය.

### නෛතික සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා පිළිබඳ ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශයන් 2007 අංක 07 151 (2) දරණ සමාගම් පනතේ විධිවිධාන වලටද අනුකූලව සකස් කර ඇති බව අපගේ මතයයි.



දයානන්ද සමරවික්‍රම සහ සමාගම
වරලත් ගණකාධිකාරීවරු

නුගේගොඩ
2015 මාර්තු මස 30 දින

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

| | සටහන | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| ආදායම් | 4 | 576,790,774 | 475,890,175 |
| විකුණුම් පිරිවැය | 5 | (325,990,679) | (268,796,818) |
| දළ ලාභය | | 250,800,095 | 207,093,357 |
| අනෙකුත් මෙහෙයුම් ආදයම් | 6 | 103,029,740 | 95,827,085 |
| පරිපාලන සහ පොදු වියදම් | 7 | (131,150,183) | (109,250,679) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ලාභය | | 222,679,652 | 193,669,763 |
| ශුද්ධ මූල්‍ය ආදායම්/ (වියදම්) | 8 | 5,335,281 | 19,959,222 |
| බදු පෙර ලාභය | | 228,014,933 | 213,628,985 |
| ආදායම් බදු වියදම | 9 | (13,776,911) | (5,483,047) |
| වර්ෂයේ ලාභය | | 214,238,022 | 208,145,938 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | | | |
| නිර්ණය කළ විශ්‍රාමික ප්‍රතිලාභ බැදීම් ආයුගණක ලෙස ගණනය කිරීමෙන් ලැබූ වාසිය/(අවාසිය) | | (683,093) | 783,904 |
| වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම | | 213,554,929 | 208,929,842 |
| කොටසක ඉපයුම | 10 | 10.71 | 10.41 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි කොටසක් වේ.

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2014 | 2013 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| බදු අයිතිය යටතේ ඇති හිස් ඉඩම් | 11 | **96,557,661** | 99,727,614 |
| නිශ්චල කල්බදු වත්කම් (හිස් ඉඩම් හැර) | 12 | **45,569,801** | 50,411,777 |
| ජෛව වත්කම් | 13A | **705,525,471** | 632,375,347 |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම් | 13B | **132,192,052** | 130,885,608 |
| දේපල, පිරියත හා උපකරණ | 14 | **268,154,134** | 225,018,509 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 15 | **5,529,152** | 4,848,097 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,253,528,271** | 1,143,266,952 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 16 | **43,373,473** | 41,909,937 |
| තැන්පතු සහ ඉදිරියට ගෙවීම් | | **5,549,623** | 4,529,765 |
| කෙටිකාලීන ව්‍යාපෘති මත කරන ලද ඉදිරියට ගෙවීම් | 17 | **12,847,143** | 10,263,971 |
| ආපසු ගෙවන ආදායම් බදු | | **6,829,501** | 7,571,822 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 18 | **56,792,077** | 68,063,660 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 15 | **5,557,270** | 5,099,968 |
| කෙටිකාලීන ආයෝජන | 19 | **400,000,000** | 326,000,000 |
| මුදල් හා මුදල් සමාන දෑ | 20 | **9,709,538** | 9,741,661 |
| **මුළු ජංගම වත්කම්** | | **540,658,625** | 473,180,784 |
| **මුළු වත්කම්** | | **1,794,186,896** | 1,616,447,736 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| ස්කන්ධ ප්‍රාග්ධනය | 21 | **200,000,010** | 200,000,010 |
| දෑව සංචිතය | | **203,478,239** | 183,160,698 |
| රඳවා ගත් ලාභ | | **1,043,150,677** | 889,230,196 |
| අනෙකුත් සංචිත | | **6,940,669** | 7,623,762 |
| **මුළු හිමිකම** | | **1,453,569,595** | 1,280,014,666 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැදීම් - පාරිතෝෂික | 22 | **124,548,410** | 124,782,559 |
| ශුද්ධ කල්බදු වගකීම | 23 | **67,779,021** | 71,344,225 |
| විලම්භිත බදු වගකීම | 24 | **65,321,092** | 55,944,676 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **257,648,523** | 252,071,460 |
| **ජංගම වගකීම්** | | | |
| ශුද්ධ කල්බදු වගකීම | 23 | **3,565,204** | 3,565,204 |
| ලද අත්තිකාරම් | 25 | **948,352** | 1,675,873 |
| වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 26 | **78,455,222** | 79,120,533 |
| **මුළු ජංගම වගකීම්** | | **82,968,778** | 84,361,610 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **1,794,186,896** | 1,616,447,736 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි කොටසක් වේ. වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

**පී. එම්. ඩී. ජී. ප්‍රේමතිලක**
මූල්‍ය කළමනාකරු
මූල්‍ය ප්‍රකාශයන් සැකසීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වගකීම වේ.
සී/ස කුරුණෑගල වැවිලි සමාගම සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කලේ

**ඒ. එම්. පියසෝම උපාලි**
සභාපති

**එච්. ජී. එන්. සමන් කුමාර**
අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත

කොළඹ
2015 මාර්තු 30

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

| | කොටස් ප්‍රාග්ධනය රු. | දැව සංචිතය රු. | රඳවාගත් ඉපැයුම් රු. | වෙනත් සංචිත රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| **2013.01.01 දිනට ශේෂය** | 200,000,010 | 148,832,548 | 755,412,408 | 6,839,858 | 1,111,084,824 |
| වර්ෂයේ ලාභය | | | 208,145,938 | | 208,145,938 |
| දැව සංචිතයට මාරු කිරීම | | 34,328,150 | (34,328,150) | | - |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | | | | 783,904 | 783,904 |
| **ගෙවූ ලාභාංශ - 2012** | | | (40,000,000) | - | (40,000,000) |
| 2013.12.31 දිනට ශේෂය | 200,000,010 | 183,160,698 | 889,230,196 | 7,623,762 | 1,280,014,666 |
| 2014.01.01 දිනට ශේෂය | **200,000,010** | **183,160,698** | **889,230,196** | **7,623,762** | **1,280,014,666** |
| වර්ෂයේ ලාභය | **-** | **-** | **214,238,022** | **-** | **214,238,022** |
| දැව සංචිතයට මාරු කිරීම | **-** | **20,317,541** | **(20,317,541)** | **-** | **-** |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | **-** | **-** | **-** | **(683,093)** | **(683,093)** |
| ගෙවූ ලාභාංශ - 2013 | **-** | **-** | **(40,000,000)** | **-** | **(40,000,000)** |
| 2014.12.31 දිනට ශේෂය | **200,000,010** | **203,478,239** | **1,043,150,677** | **6,940,669** | **1,453,569,595** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි කොටසක් වේ.

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් වූ මූල්‍ය ප්‍රවාහ | | |
| ආදායම් බදු පෙර ලාභය | **228,014,933** | 213,628,985 |
| ගැලපීම්, | | |
| ක්ෂය/ක්‍රමක්ෂය | **50,933,499** | 38,633,551 |
| කල්බදු ගිවිසුම මත පොලිය | **24,844,072** | 22,742,587 |
| තාවකාලික බැංකු ණය මත පොලී | **-** | 469,199 |
| සේවක ණය මත ක්‍රමක්ෂය | **1,162,966** | 1,165,986 |
| පාරිතෝෂික වෙන් කිරීම් | **24,114,591** | 23,593,586 |
| පොලී ආදායම | **(31,342,319)** | (44,336,994) |
| දේපල පිරියත හා උපකරණ ඉවත්කිරීම මත ලාභය/ (අලාභය) | **(1,209,025)** | 74,868 |
| ලියාහරින ලද නොනිමි වැඩ | **309,677** | - |
| ගෙවූ ආදායම් බදු | **(3,658,174)** | (6,820,059) |
| කාර්ය සාධන දිරිදීමනා සඳහා වෙන්කිරීම් | **28,779,734** | 27,429,989 |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම් වල අගය වෙනස්වීම මත ලාභ/අලාභ | **(20,317,541)** | (34,328,150) |
| ප්‍රසාද දීමනා සඳහා වෙන්කිරීම් | **12,319,147** | 8,614,940 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **313,951,560** | 250,868,488 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | **-** | |
| (වැඩිවීම්)/අඩුවීම් තොග | **(1,423,536)** | (4,592,709) |
| (වැඩිවීම්)/අඩුවීම් තැන්පතු සහ ඉදිරියට ගෙවීම් | **(1,019,858)** | 1,248,993 |
| (වැඩිවීම්)/අඩුවීම් වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | **3,792,538** | 16,944,631 |
| (වැඩිවීම්)/අඩුවීම් කෙටිකාලීන ආයෝජන මත ඉදිරියට ගෙවූ වියදම් | **(2,583,172)** | (7,775,843) |
| වැඩිවීම්/(අඩුවීම්) කලින් ලද කුලී | **(727,521)** | 1,471,246 |
| වැඩිවීම්/(අඩුවීම්) වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | **(5,760,038)** | (7,995,099) |
| පාරිතෝෂික ගෙවීම් | **(25,031,833)** | (20,640,018) |
| කාර්ය සාධන දිරිදීමනා ගෙවීම් | **(27,338,254)** | (22,765,896) |
| ප්‍රසාද දීමනා ගෙවීම් | **(8,665,902)** | (7,162,538) |
| දැව ගස් විකුණුම් වලින් ලද මුදල් | **19,011,097** | 29,332,700 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **264,205,081** | 228,933,956 |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම් තුළින් වූ මුදල් ප්‍රවාහ | | |
| දේ. පි. හා උ. මිලදී ගැනීම් | **(159,579,219)** | (186,700,542) |
| දේ. පි. හා උ. ඉවත් කිරීමෙන් ලද මුදල් | **1,231,250** | 1,578,214 |
| ලද පොලී | **37,658,398** | 40,522,256 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(120,689,571)** | (144,600,072) |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ | | |
| ගෙවූ කල්බදු පොලිය | **(28,409,276)** | (32,776,546) |
| තාවකාලික බැංකු ණය මත පොලී | **-** | (469,199) |
| සේවක ණය | **(8,071,500)** | (7,427,800) |
| සේවක ණය ආවරණය කර ගැනීම් | **6,933,143** | 6,422,291 |
| ගෙවූ ලාභාංශ | **(40,000,000)** | (40,000,000) |
| **මූල්‍ය ක්‍රියාකාරම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(69,547,633)** | (74,251,254) |
| | | |
| මුදල් හා මුදල් සමාන දෑ වල වැඩිවීම/අඩුවීම | **73,967,877** | 10,082,630 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | **335,741,661** | 325,659,031 |
| කාලච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ) | **409,709,538** | 335,741,661 |

| (සටහන අ)<br>2014.12.31 දිනෙන් අවසන් වූ කාල පරිච්ජේදය සඳහා මුදල් සහ මුදල් සමාන දෑ | **31.12.2014**<br>දිනට<br>රු. | 31.12.2013<br>දිනට<br>රු. |
|---|---|---|
| ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව | **65,000,000** | 40,000,000 |
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | **175,000,000** | 168,000,000 |
| ස්ථාවර තැන්පතු - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | **160,000,000** | 118,000,000 |
| භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනිම් | **4,000,000** | 7,000,000 |
| බැංකු මුදල් | **4,698,670** | 2,438,289 |
| අතැති මුදල් | **1,002,855** | 298,284 |
| තැපැල් මුද්දර | **8,013** | 5,088 |
| | **409,709,538** | 335,741,661 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි කොටසක් වේ.

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. පොදු ප්‍රතිපත්ති

### 1.1 නෛතික ස්වභාවය

සී/ස කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධි විධානයන්ට අනුකූලව 1982 අංක.17 දරණ සමාගම් පනත යටතේ පිහිට වූ සීමාසහිත සමාගමක් වන අතර එය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කුරුණෑගල දඹුල්ල පාරේ අංක 80 දරණ ස්ථානයේ පිහිටා ඇත.

සමාගමේ සියලු කොටස්වල අයිතිය මහා භාණ්ඩාගාරය සතුය.

### 1.2 මූලික ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරයෙහි ස්වභාවය

අදාළ වර්ෂයේදී සමාගමේ මූලික ක්‍රියාකාරකම් ලෙස පොල්, රබර් සහ අනෙකුත් කෘෂි නිෂ්පාදන වගාකිරීම, නිෂ්පාදනය සහ විකිණීම සිදුකරණ ලදී. කු. වැ. ස. වතුයාය 08 කින් සමන්විතව වන අතර ඒවා කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ව්‍යාප්තව පවතී. එම වතුයායන් නම්,

| | |
|---|---|
| අත්තනගල්ල | කටුගම්පල |
| දඹදෙණිය | කුරුණෑගල |
| දොඩම්ගස්ලන්ද | නාරම්මල |
| හිරියාල | මහයාය |

### 1.3 ප්‍රකාශයට පත්කිරීම සඳහා අනුමත කළ දිනය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා කුරුණෑගල වැවිලි සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු මස 30 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කෙරිණි.

## 2. මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශ, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කොට ඇත.

### 2.2 අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂවරුන් විසින් සමාගමෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තක්සේරුවක් සිදුකරන ලද අතර ව්‍යාපාර කටයුතු අත්හිටුවීමක් හෝ ඇවර කිරීමක් හෝ අභිලාෂයක් නොමැති බවට තහවුරු වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයන්හි දැක්වෙන පහත අයිතමයන් හැර සියළුම මූල්‍ය ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය හා උපචිත පදනම මත සකසන ලදී.

- හිස් බදු ඉඩම් ප්‍රත්‍යාගණනිත අගයට දක්වා ඇත. - සටහන 11
- පරිභෝජ්‍ය ජෛව වත්කම් විකිණුම් පිරිවැය අඩු කොට සාධාරණ අගය මත තක්සේරු කොට ඇත. - සටහන 13 (ආ)
- විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ආයුගණක තක්සේරුවක් මත හඳුනාගෙන ඇත. - සටහන 22
- ජෛව වත්කම් වලින් නෙලාගත් කෘෂිබෝග අස්වැන්න ශුද්ධ උපලබ්ධිත අගය මත තක්සේරු කොට ඇත. ශුද්ධ උපලබ්ධිත අගය, ඇස්තමේන්තු විකුණුම් මිලෙන් ඇස්තමේන්තුගත විකුණුම් වියදම් අඩුකිරීමෙන් ගණනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශයන්හි උද්ධමන සාධකයන් සඳහා කිසිදු ගැළපුමක් සිදුකොට නොමැත.

### 2.3 ව්‍යවහාරික සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශයන් සමාගමෙහි ව්‍යවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇත. සියළු මූල්‍ය අයිතමයන් ආසන්නතම රුපියලට වටයා ඇත.

### 2.4 ඇස්තමේන්තු භාවිතය සහ නිෂ්චයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වලට අදාළ නිෂ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් යොදා ගැනීම අවශ්‍ය වේ.

අදාළ නිෂ්චයන් සහ ඇස්තමේන්තු පූර්ව අත්දැකීම්, ප්‍රවණතා සහ වෙනත් සාධක මත පදනම් වේ. ඒ අනුව සැබෑ ප්‍රතිඵල, අදාළ නිෂ්චයන් සහ ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.

වලංගුභාවය තහවුරු කර ගැනීම උදෙසා අදාළ ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිරන්තර සමාලෝචනයට ලක්කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම අදාළ සංශෝධනය සිදුකරන කාලපරිච්ඡේදයේදී එය කාලපරිච්ඡේදයට හා ඉදිරියට බලපාන පරිදි හඳුනා ගැනේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත්, මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් ඇතිකරන අගයන් සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති ආශ්‍රිත නිශ්චයන් හා ඇස්තමේන්තු භාවිතා කළ අවස්ථා පහත දැක්වෙන සටහන් වල ඇතුළත් වේ.

සටහන 13 පරිභෝජ්‍ය ජෛව වත්කම්

සටහන 22 නිර්නය කළ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් - පාරිතෝෂික

සටහන 24 විලම්භිත බදුකරණය

### 2.5 සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන වර්ෂය සමග සැසඳීම සඳහා සහ වඩාත් සාධාරණ ඉදිරිපත් කිරීමක් උදෙසා පෙර වසර වල මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කිරීම් සහ වර්ගීකරණයන් සංශෝධනය කරනු ලැබ ඇත.

## 3. කැපී පෙනෙන ගිණුම්කරණ ප්‍රමිතීන්

මෙම මූල්‍ය ප්‍රකාශයන් සැකසීමේදී යොදා ගැනුනු මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

### 3.1 වත්කම් සහ ඒවායේ තක්සේරුකරණ පදනම

මූල්‍ය ප්‍රකාශයන්හි ජංගම වත්කම් වශයෙන් වර්ග කොට ඇත්තේ සමාගමෙහි සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි වන හෝ වාර්තා කරන දින සිට වසරක් ඇතුළත උපලබ්ධි වන වත්කම්ය. ජංගම වත්කම් හැර වෙනත් වත්කම් වනුයේ සමාගම විසින් වාර්තා කරන දින සිට වසරකට වඩා වැඩි කාලයක් පවත්වා ගෙන යාමට අදහස් කරන වත්කම් වේ.

### 3.1.1. දේපල පිරියත සහ උපකරණ

#### 3.1.1.1 හඳුනා ගැනීම සහ මිනුම් ගත කිරීම

දේපල පිරියත සහ උපකරණ දක්වනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂය වීම් සහ සමුච්චිත අපහායන අලාභ අඩු කිරීමෙන් අනුතුරුවය. මෙම අරමුණ සඳහා වූ පිරිවැය, අදාල වත්කම අපේක්ෂිත ක්‍රියාත්මක තත්ත්වයට හෝ භාවිතයට ගෙන ඒමට වැයවන සෘජු වියදම් ඇතුළත් කොට ඉදිරිපත් කරයි. ස්වයං නිර්මාණිත වත්කම්වල පිරිවැය, අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ වෙනත් සෘජු වියදම් වලින් යුක්ත වේ. මේ සඳහා පවතින වත්කම් ඉවත් කිරීමේ පිරිවැයද ඇතුළත් වේ.

නොනිමි ප්‍රාග්ධන වැඩ අදාල වත්කම පළමුවෙන් භාවිතා කරන මොහොතේදී නියමිත වත්කම් ගිණුම් වෙත මාරු කරයි.

දේපල පිරියත සහ උපකරණ ආයු කාලය වෙනස් වන අවස්ථාවන් වලදී ඒවා වෙනම අයිතම වශයෙන් ගණනය කරයි.

ස්ථිර ඉඩම් සංවර්ධන පිරිවැය වශයෙන් හැඳින්වෙන්නේ බිම් සැකසුම්, නව මාර්ග ඉදිකිරීම් සහ වෙනත් ප්‍රධාන පෙලේ යටිතල පහසුකම් සංවර්ධනයන්ය.

දේපල පිරියත සහ උපකරණ ඉවත් කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ අදාල දේපල සහ පිරියත වල ධාරණ වටිනාකම සහ ඒවා ඉවත් කිරීමෙන් ලැබෙන ආදායමෙහි අන්තරය වශයෙන් සැලකෙන අතර ඒවා විස්තීර්ණ ආදායම් ප්‍රකශනයෙහි වෙනත් ආදායම් යටතේ දැක්වේ.

#### 3.1.1.2 පසුකාලීන වියදම්

දේපල පිරියත සහ උපකරණ මත සිදුකරණ ලද වියදමක් නිසාවෙන් එම වත්කමින් මුලිකව තක්සේරු කරන ලද ප්‍රමාණයට වඩා අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා දෙනු ඇතැයි අපේක්ෂිත කල්හි එම වියදම ප්‍රාග්ධනිත කෙරේ. ප්‍රතිස්ථාපිත වත්කමෙහි පවතින වටිනාකම ඉවත් කරනු ලැබේ.

එදිනෙදා දරණ දේපල පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේ පිරිවැය විස්තීර්ණ මූල්‍ය ප්‍රකාශනයෙහි වියදම් වශයෙන් හඳුනා ගැනේ.

#### 3.1.1.3 වත්කමක වටිනාකම ඉවත් කිරීම

දේපල පිරියත සහ උපකරණ ඉවත් කිරීමේදී හෝ එමගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ තවදුරටත් නොලැබෙන කළ එහි පවතින වටිනාකම නොසලකා හැරේ. ආදාල ඉවත්කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ හඳුනාගැනේ.

### 3.1.1.4 ණය පිරිවැය

කිසියම් වත්කමක් අත්පත් කර ගැනීමේදී, ඉදිකිරීමේදී හෝ නිෂ්පාදනයේදී සෘජුව ගනුලබන ණයට අදාළ ණය පිරිවැය ආදාල වත්කම අපේක්ෂිත කාර්ය සඳහා යොදා ගන්නා තෙක් එම කාලයට අදාළ ණය පිරිවැය එම වත්කමේ කොටසක් වශයෙන් ප්‍රාග්ධනිත කෙරේ. ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණය පිරිවැය ප්‍රමාණය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 23 අනුව තීරණය කරයි.

### 3.1.1.5 ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය

ක්ෂය වීම් ගණනය කරනුයේ වත්කමක ක්ෂය කළ හැකි වටිනාකම මත පදනම් වේ. ක්ෂය වීම් එක් එක් වත්කමෙහි ඇස්තමේන්තු ගත ඵලදායී ජීව කාලය මත සරල මාර්ග ක්‍රමය යටතේ සිදුකරනු ලබයි.

බදු පදනමට ලබා ගත් වත්කම් බදු කාල පරිච්ඡේදය හෝ අදාළ වත්කම් වල ඵලදායී ජීව කාලය යන දෙකෙන් වඩාත් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ. ඉඩම් ක්ෂය නොකරයි.

ඇස්තමේන්තු ගත ඵලදායී ජීවකාලයන් පහත දැක්වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 40 පුරා |
| ළිං | අවුරුදු 40 පුරා |
| වැටවල් | අවුරුදු 03 පුරා |
| රථවාහන | අවුරුදු 05 පුරා |
| යන්ත්‍ර | අවුරුදු 13 1/3 පුරා |
| ගෘහ භාණ්ඩ | අවුරුදු 10 පුරා |
| උපකරණ | අවුරුදු 08 පුරා |
| පරිගණක | අවුරුදු 05 පුරා |

කිසියම් වත්කමක ක්ෂය වීම එය භාවිතා කරන පළමු වසරේ සිට ඇරඹෙන අතර ආදාල වත්කම විකිණීම සඳහා පවතින බවට වර්ග කල දිනයේදී හෝ වත්කමෙහි භාවිතය අතහරින දිනයේ දී අවසන් වේ. බදු පදනමට ලබා ගත් වත්කම් පහත දැක්වෙන කාලපරිච්ඡේදයන් පුරා ක්‍රමක්ෂය සිදු කෙරේ.

| | |
|---|---|
| හිස් ඉඩම් | අවුරුදු 53 පුරා |
| ගොඩනැගිලි | අවුරුදු 25 පුරා |
| යන්ත්‍ර | අවුරුදු 15 පුරා |
| මෝරු වගාවන් | අවුරුදු 30 පුරා |
| ඉඩම් සංවර්ධන පිරිවැය | අවුරුදු 30 පුරා |

### 3.1.1.6 බදු පදනමට ලබා ගත් වත්කම්

සමාගම මූල්‍ය කල්බදු පදනමට ලබාගත් වත්කම් වල අවදානම් සහ ප්‍රතිලාභ සමාගමට අයත්වන බැවින් ඒවා මුදලට මිලදී ගත් වත්කමක් සේ සලකා ප්‍රාග්ධන කර ඇත.

මූල්‍ය කල්බදු පදනමට ලබා ගත් වත්කම් බදු කාල පරිච්ඡේදය හෝ අදාළ වත්කම් වල ඵලදායී ජීව කාලය යන දෙකෙන් වඩාත් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ.

බදු හිමියා විසින් බදු කාලසීමාව තුල හිමිකාරිත්වයට අදාල අවදානම් සහ ප්‍රතිලාභ රඳවාගන්නා අවස්ථාවන්හි ඒවා මෙහෙයුම් කල් බදු වශයෙන් සැලකේ.

### 3.1.1.7 මූල්‍යමය නොවන වත්කම් වල අපහායනය

සමාගම් මගින් සෑම වාර්තා කරන දිනයකදීම වත්කමක අපහායනය වී ඇතිදැයි සළකා බැලේ. එවැනි හානි වීමක් පිළිබඳ සංඥාවක් පවතී නම් හෝ වාර්ෂික හානි වීම් පරික්ෂාවක් අවශ්‍ය වූ විටකදී සමාගම මගින් වත්කමෙහි ආවරණ වටිනාකම පිළිබඳ තක්සේරුවක් සිදු කරයි.

කිසියම් වත්කමක් මුදල් ප්‍රවාහයන් උත්පාදනය නොකරන්නේ නම්, අදාල වත්කමෙහි ආවරණය කරගත හැකි වටිනාකම එහි භාවිත වටිනාකමට වඩා වැඩිනම් සහ එහි සාධාරණ අගයෙන් විකිණීමේ පිරිවැය අඩුකොට එවැනි වත්කමක වටිනාකම තීරණය කෙරේ. වත්කමක ධාරණ වටිනාකම එහි ආවරණය කරගත හැකි වටිනාකම ඉක්මවා ඇතිවිටක අදාල වත්කම අපහායනය වූ බවට සැලකෙන අතර එහි වටිනාකම ආවරණය කරගත හැකි අගය දක්වා අඩු කරනු ඇත.

වත්කමක භාවිතා වටිනාකම තක්සේරු කිරීමේදි ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන් බදු පෙර වට්ටම් අනුපාතයන් යොදා ගනිමින් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් ගත කරනු ලබයි. විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ වටිනාකම තීරණය කිරීමේදී මෑත කාලීන ගණුදෙනු සැලකිල්ලට ගැනේ.

එවැනි ගනුදෙනු නොමැති විටක උචිත තක්සේරු ආකෘතියන් භාවිතා කරනු ලබයි.

අපහායන අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ. පූර්ව වශයෙන් හඳුනා අපහායනය අලාභයක් ආපසු හරවනු ලබන්නේ අදාල වත්කමෙහි ආවරණ වටිනාකම තීරණය කිරීමේදී යොදාගත් ඇස්තමේන්තු වල වෙනසක් සිදුවුවහොත් පමණි.

### 3.1.2 ජෛව වත්කම්

ජෛව වත්කම් මේරූ සහ නොමේරූ වත්කම් වශයෙන් වර්ග කෙරේ. මේරූ ජෛව වත්කම් යනු අස්වැන්න නෙළාගත හැකි තත්ත්වයට පත්වූ වගා වන අතර නොමේරූ ජෛව වත්කම් යනු තවමත් අස්වැන්න නෙළාගත හැකි තත්ත්වය පත් නොවූ වගාවන්ය.

ජෛව වත්කම් තවදුරටත් එලදරණ ජෛව වත්කම් සහ පරිභෝජ්‍ය ජෛව වත්කම් වශයෙන් වර්ග කරයි. එලදරණ ජෛව වත්කම් වලට විකිණීමට හෝ නෙලීමට අපේක්ෂා නොකරන පොල් සහ රබර් ගස් ඇතුලත් වේ. පරිභෝජය ජෛව වත්කම් වනුයේ තේක්ක, මහෝගනී, හල්මිල්ල වැනි වාණිජ වටිනාකමක් සහිත දැව වර්ග වේ.

#### 3.1.2.1 එලදරණ ජෛව වත්කම්

එලදරණ ජෛව වත්කම් මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය වීමේ හා අපහායනය අලාභයන් අඩු කිරීමෙන් අනුතුරුව වන අතර දේපල පිරියත සහ උපකරණ සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 අනුව එය සිදු කරයි.

වාණිජමය අස්වැන්න නෙළා ගැනීමේ තත්ත්වය තෙක් දරණු ලබන බිම් සැකසුම්, නව වගාවන්, නැවත වගාවන්, බෝග විවිධාංගීකරණයන් සහ පොහොර යෙදීම් වැනි පිරිවැය නොමේරූ වගා යටතේ වර්ග කරයි. මෙම නොමේරූ වගා පිරිවැය වැවිලි ඍජු පිරිවැය ඒවාට අදාල පොදු කාර්ය පිරිවැය සහ දිගුකාලීන ණය සඳහා වූ පොලී පිරිවැය යන පිරිවැයන්හි එකතුවන් ලෙස ගණනය කරනු ලබයි.

මේරූ එලදරණ ජෛව වත්කම්වල ප්‍රයෝජන කාලය අනුව ක්ෂය කරනු ලබයි.

| | |
|---|---|
| පොල් | අවුරුදු 50 පුරා |
| රබර් | අවුරුදු 20 පුරා |
| වෙනත් වැවිලි | අවුරුදු 20 පුරා |

#### 3.1.2.2 එලදරණ ජෛව වත්කම්වල පැළ සිටුවීමේ පිරිවැය

මේරූ වගාවල ඇති පුරප්පාඩු සිටුවීම සඳහා දරණු ලබන වියදම් මෙම ගණයට අයත් වේ. වගාවේ එලදායී ජීවිත කාලය වැඩිවීමට හෝ අස්වැන්න වැඩිවීමට හෝ පෙර තක්සේරු කරන ලද වගාවේ ප්‍රගතිය අභිබවා නිෂ්පාදනයේ ගුණාත්මක බව වැඩිවීමකට තුඩු දෙන ආකාරයෙන් පාළු සිටුවීමක් වෙනුවෙන් දරණු ලබන පිරිවැය ප්‍රාග්ධනය කරනය කර මේරූ වගාව ක්ෂය කරන පදනම් මතම ක්ෂය කිරීම කරනු ලබයි. ප්‍රාග්ධනය කරනු නොලබන පාළු සිටුවීමේ පිරිවැය එය දැරූ වර්ෂයේ වියදමක් ලෙස සලකා විස්තීර්ණ ආදායම ගිණුමට ලියාහරිනු ලබයි.

#### 3.1.2.3 පරිභෝජ්‍ය කළ හැකි ජෛව වත්කම්

පරිභෝජනය කල හැකි දැව ගස් හඳුනා ගැනීමේදී මිණුම් කරන අතර එක් එක් වාර්තා කරන කාල සීමාව අවසානයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 අනුව විකිණීමේ පිරිවැය අඩු කොට සාධාරණ අගයට ගණනය කරයි. දැව ගස්වල සාධාරණීය වටිනාකම ගණනය කරනු ලබන්නේ වට්ටම කළ මුදල් ප්‍රවාහ ක්‍රමය (DCF) යොදා ගනිමිනි.

නොමේරූ ගස්වල පිරිවැය සාධාරණ අගයට ආසන්න අගයක් ලෙස සලකා කටයුතු කරනු ලබයි.

| විචල්‍ය | අර්ථකථනය |
|---|---|
| මුදල් ඒකකය | ශ්‍රී ලංකා රුපියල් |
| දැව පරිමාව | විවිධ ප්‍රදේශයන් හි එක් එක් දැව විශේෂයන් හි ඇඩි බව උස සහ වර්ධනය සැලකිල්ලට ගනිමින් ඇස්තමේන්තු සිදු කරයි. |
| ආර්ථික එලදායි කාලය | සමාගමෙහි වන වගා සැලසුම අනුව එක් එක් දැව විශේෂයන් හි සාමාන්‍ය ආයු කාලය තීරණය කරයි. |
| විකුණුම් මිල | පවතින ශ්‍රී ලංකා වෙළෙඳ පොළ මිල අනුව ඇස්තමේන්තු සිදු කෙරේ. |
| වට්ටම් අනුපාතය | අනාගත මුදල් ප්‍රවාහයන් පහත දැක්වෙන වට්ටම් අනුපාතයන් අනුව වට්ටම් ගත කෙරේ:<br>දැව ගස් 14% |

3.1.2.4 හඳුනාගැනීම් හා මිනුම්

සමාගම් මගින් ජෛව වත්කම් හඳුනාගනු ලබන්නේ අදාල වත්කම මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත හිමිවන බවට තහවුරුවක් පවතින්නේ නම් සහ එහි පාලනයක් සමාගම සතුව පවතින්නේ නම් පමණි.

එලදරණ ජෛව විද්‍යාත්මක වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්ෂය වීම් සහ අපහායන අලාභ වීම් අඩු කිරීමෙන් පසු ගණනය කෙරේ.

පරිභෝජ්‍ය දැව ගස් මූලික හඳුනාගැනීමේදී එක් එක් වාර්තා කරන කාළ සීමාව අවසානයේදී මනිණු ලබන අතර ගිණුම්කරණ අංක 41 අනුව තක්සේරු කරයි.

3.1.3 මූල්‍යමය උපකරණ

3.1.3.1 මූල්‍යමය වත්කම්

3.1.3.1.1 මූලික හඳුනා ගැනීම සහ මිනුම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 යටතේ ලාභ අලාභ ඔස්සේ සධාරණ අගයට හඳුනාගනු ලබන මූල්‍යමය වත්කම්; ණය සහ ලැබිය යුතු මුදල් හෝ කල්පිරීම තෙක් තබාගත් ආයෝජන හෝ විකිණීමට ඇති මූල්‍යමය වත්කම් හෝ වශයෙන් යෝග්‍ය පරිදි වර්ගීකරණය කරනු ලබයි. යම් මූල්‍යමය වත්කමක වර්ගීකරණය එහි පළමු හඳුනාගැනිමේදීම තීරණය කරනු ලබයි.

සියළු මූල්‍යමය වත්කම් පළමු හඳුනාගැනිමේදී සාධාරණ අගයට හඳුනා ගැනේ. ලාභ අලාභ ඔස්සේ සධාරණ අගයට හඳුනාගනු නොලබන මූල්‍යමය වත්කමක් සම්බන්ධයෙන් වනවිට එයට ආදාල ගනුදෙනු පිරිවැයද එකතුකර එහි වටිනාකම තීරණය කරනු ලබයි.

මූලික හඳුනාගැනීමේදී, සියළුම මූල්‍ය වත්කම් සාධාරණ අගය මත හඳුනාගැනේ.

3.1.3.1.2 පසුකාලීන මිණුම්

මූල්‍ය වත්කම් වල පසුකාලීන මිනුම් පහත දැක්වෙන වර්ගීකරණයන් මත රදා පවතී.

**ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත වන මූල්‍යමය වත්කම්.**

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත හඳුනාගනු ලබන මූල්‍ය වත්කම් යටතට, විකිණීමේ පරමාර්ථයෙන් තබාගෙන ඇති මූල්‍ය වත්කම් සහ මූලික හඳුනාගැනීමේදීම ලාභ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනාගෙන වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් ඇතුළත් වේ. කිසියම් මූල්‍ය වත්කමක් විකිණීමේ අරමුණින් හෝ ප්‍රතිවිකිණීමේ අරමුණින් අත්පත් කර ගත්තේ නම් ඒවා විකිණීම සඳහා රඳවා ගත් මූල්‍යමය වත්කම් වශයෙන් වර්ග කරයි.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත හඳුනාගන්නා මූල්‍යමය වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට වාර්තා කරයි. එම වත්කම් වල සාධාරණ අගයේ සිදුවන වෙනස්වීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල මූල්‍ය පිරිවැය හෝ මූල්‍ය ආදායම් යටතේ හඳුනා ගනී.

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුල, ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත හඳුනාගන්නා මූල්‍යමය වත්කම් කිසිවක් දරා නොමැත.

**ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු මුදල් යනු ක්‍රියාකාරී වෙළඳපලක් තුල මිල තීරණය නොවන ස්ථිර හෝ නිශ්චිත ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව එම වත්කම් පසුව හඳුනාගනු ලබන්නේ, සඵල පොලී අනුපාත ක්‍රමය යටතේ ක්‍රමක්ෂය කරන ලද පිරිවැයෙන් අපාහන (හානිවූ) වටිනාකම අඩු කිරීමෙන් පසුව ලැබෙන වටිනාකමටය.

ක්‍රමක්ෂය කිරීමට යොදාගනු ලබන පිරිවැය එම වත්කම් අත්පත් කර ගැනීමේදී අදාල වූ අවමිල, අධිමිල සහ වෙනත් ගාස්තු හෝ පිරිවැයෙන් සැලකිල්ලට ගනිමින් තීරණය කරයි.

සඵල පොලී අනුපාත ක්‍රමය යටතේ හඳුනාගනු ලබන ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල මූල්‍ය ආදායම් යටතේ හඳුනාගැනේ. සමාගමේ මූල්‍ය වත්කම් යන්නට ණය සහ ලැබිය යුතු දෑ ලැබිය යුතු වෙළඳ ණය, තැන්පතු, අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු දෑ වලින් සහ මුදල් හා සමාන දෑ අයත් වේ.

**විකිණීමට ඇති මූල්‍ය ආයෝජන**

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන යන්නට ලාභ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනාගනු නොලබන හා වෙළඳපල තුල වෙළඳ ගණුදෙණු කිරිම සඳහා තබාගෙන සිටින මූල්‍ය ආයෝජන හැර අනෙකුත් මූල්‍ය ආයෝජන ඇතුළත් වේ.

මෙම කාණ්ඩය යටතට ගැනෙන ණය සුරැකුම් යනු ද්‍රවශීලතා අවශ්‍යතාවයන් වෙනුවෙන් හෝ වෙළඳපල තත්ත්වයන්ගේ වෙනස් වීමක් නිසා හෝ පමණක් විකිණීමට ලක් කරන නොඑසේ නම් අවිනිශ්චිත අනාගත කාලයක් රඳවා තබා ගන්නා ණය සුරැකුම්ය.

මුලික හඳුනාගැනීමෙන් පසුව විකිණීමට ඇති මූල්‍ය වත්කම් එම වත්කම් මූල්‍ය වත්කමක් ලෙස හඳුනා ගැනිම අතහරින අවස්ථාව දක්වා සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර උපලබ්ධි නොවූ ලාභ හා අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හඳුනාගෙන විකිණීමට ඇති මූල්‍ය ආයෝජන සංචිතයට මාරු කරයි. මූල්‍ය වත්කමක් ලෙස හඳුනාගැනීම අත්හරින අවස්ථාවේදී වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල මූල්‍ය ආදායම් හෝ වියදම් ලෙස නැවත වර්ගීකරණය කර හඳුනාගනු ලබන අතර එම වත්කමට අදාල වටිනාකම විකිණීමට ඇති ආයෝජන සංචිතයෙන් මාරු කිරීම සිදු කරනු ලබයි.

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන වලට අදාල පොලී ආදායම් සඵල පොලී අනුපාත ක්‍රමය යටතේ ගණනය කර විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනී.

### 3.1.3.1.3 හඳුනාගැනීමෙන් වැලකීම

කිසියම් මූල්‍යමය වත්කමක් (හෝ මූල්‍යමය වත්කමක කොටසක් හෝ සමාන ආකාරයේ මූල්‍යමය වත්කම් සමූහයක කොටසක් හෝ) පහත දැක්වෙන අවස්ථාවන්හිදී මූල්‍ය වත්කම් ලෙස හඳුනාගැනීමෙන් වැලකී සිටී.

- අදාල වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ හිමිකම කල් ඉකුත් වූ විට
- යම් මූල්‍ය වත්කමක් තවදුරටත් මූල්‍ය වත්කමක් ලෙස හඳුනා ගැනීම අවසන් කරනු ලබන්නේ එම වත්කමකින් ගලාඑන මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය සමාගම විසින් වෙනත් පාර්ශවයකට පවරා ඇති විටක හෝ පැවරුම් ගිවිසුමක් තුල යම් වත්කමකට අදාලව ලබාගත් මුදල් ප්‍රවාහ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශවයටම ගෙවීමේ වගකීමක් ඇතැයි උපකල්පනය කරන විටක හෝ සහ (අ) යම් වත්කමක අවදානම සහ ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනත් පාර්ශවයකට පවරා ඇති විටක හෝ (ආ) යම් වත්කමක අවදානම සහ ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනත් පාර්ශවයකට පවරා නැතත් එම වත්කමෙහි පාලන හැකියාව පවරා ඇති විටක.

### 3.1.3.1.4 මූල්‍යමය වත්කම් හානි වීම

සමාගම් මගින් එක් එක් වාර්තා කරන දිනයන්හි දී මූල්‍යමය වත්කම් හානි වීම පිළිබඳ භෞතික සාක්ෂියක් පවතීදැයි පරික්ෂා කෙරේ. කිසියම් වත්කමක මුලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවූ සිදුවීමකදී හානි වීමක් පිළිබඳ සාක්ෂියක් හඳුනාගතහොත් පමණක් මූල්‍යමය වත්කමක් හානියට පත්බවට නිර්ණය කෙරේ.

2013 දෙසැම්බර් 31 සහ 2014 දෙසැම්බර් 31 අතර අවසන් වූ වසර සඳහා සමාගම් මගින් මූල්‍යමය වත්කම් සම්බන්ධව කිසිදු හානි වීමේ අලාභයක් හඳුනා නොගැනුනි.

### 3.1.3.2 මූල්‍යමය වගකීම්

### 3.1.3.2.1 මුලික හඳුනා ගැනීම් සහ මිණුම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 හි විෂය පථය තුළ හඳුනාගනු ලබන මූල්‍ය වගකීම්, මූල්‍ය වගකීම් ලෙස හඳුනා ගනු ලබන අතර එය ලාභ අලාභ ඔස්සේ සාධාරණ අගයට වාර්තා කරනු ලබයි.

යම් මූල්‍ය වගකීමක් පළමු හඳුනාගැනීමේදීම එහි වර්ගීකරණය නිර්ණය කරනු ලබයි. ඕනෑම මූල්‍ය වගකීමක් පළමු හඳුනාගැනීමේදී සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර එය ණයක් සම්බන්ධයෙන් වන විට එය අත්පත් කර ගැනීමට හෝ එවැනි මූල්‍ය වගකීමක් නිකුත් කිරීමට හෝ දරණු ලබන පිරිවැයද එයට එකතු කර මුළු වගකීමේ වටිනාකම ගණනය කරනු ලබයි.

සමාගමේ මූල්‍ය වගකීම් යන්නට, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ, බැංකු අයිරා, ණය සහ විකිණීම තබාගෙන ඇති මූල්‍ය වගකීම් ඇතුළත් වේ. විකිණීමට

තබාගෙන ඇති මූල්‍ය වගකීම් යනු ඉතා ආසන්න කාලයක් තුල විකිණීමේ බලාපොරොත්තුවෙන් තබාගෙන ඇති මූල්‍ය වගකීමය. විකිණීමට ඇති මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් පැන නගින ලාභ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගනු ලබයි. යම් මූල්‍ය වගකීමක් සම්බන්ධයෙන් වන පළමු හඳුනාගත් වටිනාකමින් ඔබ්බට ගොස් එය ලාභ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනා නොගනී.

ණය සම්බන්ධයෙන් වන විට පළමු හඳුනාගැනීමෙන් පසුව මූල්‍ය පිරිවැයක් සහිත මූල්‍ය වගකීම් (පොලී වියදමක් ඇති) සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට හඳුනා ගනී. මෙම වගකීම් සම්බන්ධයෙන් සඵල පොලී අනුපාත ක්‍රමය ඔස්සේ හෝ හානිවීම් මත හෝ හඳුනාගනු ලබන ලාභ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගනී.

ක්‍රමක්ෂය කරනු ලබන පිරිවැය, අත්පත්කර ගැනීමේදී අදාල වූ අවමිල හෝ අධිමිල සහ ගාස්තු හෝ පිරිවැය යන කාරණා කෙරෙහි අවධානය යොමු කරමින් ගණනය කරනු ලබයි. සඵල පොලී අනුපාත ක්‍රමය තුළ වූ ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනා ගැනේ.

#### 3.1.3.2.2 හඳුනා ගැනීම අවසන් කිරීම

යම් මූල්‍ය වගකීමක් යටතේ ඇති බැඳියාව ගෙවා අවසන් කර ඇති විටක හෝ අහෝසි වී ඇති විටක හෝ කල් ඉකුත් වී ඇති විටක හෝ එම මූල්‍ය වගකීම තවදුරටත් මූල්‍ය වගකීමක් වශයෙන් හඳුනා නොගනී.

### 3.1.3.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම.

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් එකිනෙකට හිලව් කිරීම කළ හැක්කේ හඳුනාගත් වටිනාකම් එකිනෙකට හිලව් කිරීමට බලාත්මක නීතිමය අයිතියක් වර්තමානයේ පවතින්නේ නම් සහ මෙම වත්කම් හා වගකීම් ශුද්ධ වටිනාකමට හිලව් කිරීමට හෝ මූල්‍ය වත්කම උබලබ්ධිකර ඒත් සමගම මූල්‍ය වගකීම ගෙවා අවසන් කිරීමට හෝ අභිප්‍රායක් ඇත්නම් පමණි.

### 3.1.3.4 මූල්‍ය අවදානම් කළමනාකරණය

#### ණය අවදානම

ණය අවදානම යනු කිසියම් ගනුදෙනුකරුවෙකු හෝ ප්‍රති පාර්ශවයක් මගින් සිය ගිවිසුම් ගත වගකීම් ඉටු කිරීමට අපොහොසත් වීමෙන් සමාගමට අත්වන මූල්‍යම අලාභය වන අතර මෙය මූලිකවම සමාගම වෙත ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් සහ ආයෝජන සුරැකුම් ආශ්‍රිතව උද්ගත වේ.

හානිකරණය සඳහා සමාගම යම් ඉඩදීමක් (ප්‍රතිපාදනයක්) තබා ඇති අතර ඒ තුලින් වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් ඇතිවිය හැකි අලාභයේ තක්සේරු වටිනාකම නිරූපණය වේ.

#### ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් යොදා ගනිමින් ස්වකීය මූල්‍යමය වගකීම් ඉටු කිරීමේදී සමාගමක් විසින් මුහුණ දෙන අවදානම වේ. සමාගමක් මගින් ද්‍රවශීලතාවය කළමනාකරණය යනු සාමාන්‍ය හෝ ආතතික තත්ත්වයන්හිදී එළඹෙන වගකීම් ඉටු කිරීම සඳහා හැම විටම ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වා ගැනීමය.

#### පොලී අනුපාත අවදානම

වෙළෙඳ පොළ පොලී අනුපාතයන් වෙනස් වීමේ අවදානමට සමාගම මූලිකවම ලක් වනුයේ පාවෙන පොලී අනුපාතයක් සහිත දිගුකාලීන ණය ඇති විටකය. මෙම අවදානම කළමනාකරණය කිරීම සඳහා පාවෙන සහ ස්ථාවර පොලී අනුපාත වලින් යුත් සමතුලිත ආයෝජන සම්මිශ්‍රණයක් පවත්වා ගැනීමට සමාගම කටයුතු කරනු ලබයි.

### 3.1.4 තොග

#### 3.1.4.1 ජෛව වත්කම් වලින් නෙලාගත් කෘෂි නිෂ්පාදන අස්වැන්න

වාර්තා කරන දිනට ඇති නෙලාගත් කෘෂි නිෂ්පාදන, එම කෘෂි නිෂ්පාදන වාර්තා කරන දිනයත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන දිනයත් අතර විකිණී ඇති විටෙක එම විකුණුම් මිලෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙන් පසු ලැබෙන වටිනාකමට තක්සේරු කර ඇත. මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරන දින වනවිටත් විකුණුම් ගිවිසුම් සඳහා එළැඹී නොමැති තොග, ඇස්තමේන්තුගත ශුද්ධ විකුණුම් මිලක් යටතේ ඇස්තමේන්තු කර ඇත.

පොල් සඳහා අස්ථාවර වෙළෙඳ පොළ තත්ත්වයක් පවතින අවස්ථාවක එම පොල් තොග කොප්පරා බවට පරිවර්තනය කිරීමෙන් පසු ලැබෙන ශුද්ධ උපලබ්ධි අගයට ඇස්තමේන්තු කරනු ලබයි.

### 3.1.4.2 වැඩි දුර සැකසූ කෘෂි නිෂ්පාදන

වැඩිදුර සකසන ලද කෘෂි නිෂ්පාදන වල පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකම අනුව තක්සේරු කෙරේ. ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු අදාල තොග සමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුල විකිණීමෙන් ලැබීමට අපේක්ෂිත මිලෙන් අපේක්ෂිත විකුණුම් වියදම අඩු කොට ලැබෙන අගය වේ.

### 3.1.4.3 යෙදවුම් අමුද්‍රව්‍ය, පරිභෝජනය කළහැකි දෑ සහ අමතර කොටස්

මේවා පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් (FIFO) පදනම මත ගණනය කෙරේ.

### 3.1.4.4 පැළතවාන්

පැළතවාන් පිරිවැය සඳහා ඍජු අමුද්‍රව්‍ය, ඍජු ශ්‍රම්‍ය සහ වෙනත් පොදු කාර්යය පිරිවැය ඇතුළත් වේ.

### 3.1.5 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ, මුදල් ශේෂයන්, ඉල්ලුම් තැන්පතු සහ කඩිනමින් මුදල් බවට පත්කරගත හැකි ද්‍රවශීල ආයෝජනයන්ගෙන් සමන්විත වෙයි.

## 3.2 වගකීම් සහ වෙන්කිරීම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වගකීම් යටතේ දක්වා ඇත්තේ වාර්තා කරන දිනයෙන් වසරක් ඇතුලත ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් වනුයේ වාර්තා කරන දිනයෙන් වසරකට පසු ගෙවියයුතු ගෙවීම් වේ.

### 3.2.1 සේව්‍ය ප්‍රතිලාභ

### 3.2.1.1 නිර්ණය කළ අනිවාර්යදායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල්

අදාල නීති රීති හා රෙගුලාසිවලට අනුව සියළුම සේවකයන් ඉහත සඳහන් අරමුදල්වල දායකත්ව හිමිකම සඳහා සුදුසුකම් ලබයි. සමාගම විසින් සෑම සේවකයකුගේම දල පාරිශ්‍රමිකයෙන් ගණනය කරනු ලැබූ 12% ක ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලට හෝ වතු කාර්ය සංගමයට හෝ ලංකා වැවිලි කරුවන්ගේ අර්ථසාධක සමිතියට හෝ ගෙවනු ලබයි. එමෙන්ම සෑම සේවකයකුගේම දල පාරිශ්‍රමිකයෙන් ගණනය කරනු ලැබූ 3% ක ප්‍රමාණයක් සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල සඳහා සමාගම විසින් ගෙවනු ලබයි.

### 3.2.1.2 නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි "විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය" සඳහන් ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභක්‍රමය යොදාගෙන පාරිතෝෂික ගණනය කිරීම සිදුකර ඇත. කෙසේ වුවද 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා පනත අනුව මෙම ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ ඇති සේවකයන් පමණි. එම බැඳීම සඳහා බාහිර ප්‍රතිපාදන සම්පාදනයක් සිදුනොවන අතර එය ආයු ගණනය ලෙස ගණනය කර නැත.

කෙසේ වුවද 2013.01.24 පවත්වන ලද අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී සමාගමෙහි පවති පාරිතෝෂික ගෙවීම් ක්‍රමවේදය වෙනස් කිරීමට තීරණය කෙරුණු අතර විශ්‍රාම ලබා ගන්නා සේවකයන් වෙත සම්පූර්ණ කරණ ලද වසරක් සඳහා අර්ධ මාසික වැටුපක් ගෙවීම වෙනුවට 2013.01.24 ගනු ලැබූ නව තීරණය අනුව පහත පරිදි පාරිතෝෂික ගෙවීමට කටයුතු කරයි.

- වසර 10කට අඩු නමුත් වසර 5 හෝ ඊට වැඩි සේවාකාලයක් සම්පූර්ණ කල සේවකයින් වෙත සම්පූර්ණ කරන ලද එක් වසරක් සඳහා අර්ධ මාසික වැටුපක් ගෙවනු ලැබේ.
- වසර 10කට වැඩි සේවාකාලයක් සම්පූර්ණ කල සේවකයින් වෙත සම්පූර්ණ කරණ ලද එක් වසරක් සඳහා මාසික වැටුපක් ගෙවනු ලැබේ.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ තීරණය පරිදි සමාගම මගින් පාරිතෝෂික සම්බන්ධ සිය වගකීම් ඉටුකිරීම සඳහා අභ්‍යන්තර අරමුදලක් ස්ථාපනය කර ඇත.

නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා භාවිත කරන ලද මූලික උපකල්පන සටහන් අංක 22 හි දක්වා ඇත.

## 3.3 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍යයන්

අසම්භාව්‍යයන් යනු අතීත සිදුවීමක් මත හට ගෙන ඇති නමුත් ආයතනයේ පාලනයෙන් පරිබාහිර වූ අනාගත අවිනිශ්චිත සිදුවීමක, සිදුවීම හෝ සිදුනොවීම මත ඇතිවිය හැකි වත්කමක් හෝ වගකීමකි.

සියලූ ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාවයන් සටහන 27 හි දක්වා ඇත.

## 3.4 විලම්බිත ආදායම

### 3.4.1 ප්‍රදාන සහ ආධාර

ප්‍රදාන සහ ආධාර හඳුනාගැනෙනුයේ අදාල ප්‍රදානය හිමි වන බවට සහතික වීමක් සහ ඒ සඳහා අවශ්‍ය කොන්දේසි සපුරාලිය හැකි බවට තහවුරුවීමෙන් පසුව පමණි. කිසියම් ප්‍රදානයක් වත්කමක් සමග සම්බන්ධ වන විට අදාලවත්කමේ පිරිවැයෙන් ප්‍රදාන ලෙස ලැබෙන වටිනාකම අඩුකරණු ලැබේ.

## 3.5 විස්තීර්ණ අදායම් ප්‍රකාශය

විස්තීර්ණ අදායම් ප්‍රකාශය එලිදැක්වීම සඳහා වියදම් ක්‍රියාත්මක වන ක්‍රමය වඩාත් සාධාරණ බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි අවශ්‍යතාවන්ට අනුකූලව එම ක්‍රමය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම සඳහා යොදාගෙන ඇත.

### 3.5.1 අදායම් හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒම ස්ථීර ලෙස තහවුරු වීම, ආදායම සහ ඊට අදාල වියදම විශ්වාසනීයව හා සාධාරණ ලෙස මැනිය හැකි වීම යන කාරණා දෙකම සංතෘප්ත වන අවස්ථාවක දී පමණක් එම අර්ථික ප්‍රතිලාභය ආදායමක් ලෙස හඳුනාගැනීමට කටයුතු කරනු ලබයි.

ලැබුනු සහ ලැබිය යුතු වටිනාකම්වල සාධාරණ අගය සැලකිල්ලට ගෙන ආදායම තීරණය කරනු ලබන අතර එහිදී වෙළඳ වට්ටම්, විකුණුම් බදු අඩු කර ශුද්ධ වටිනාකමට ආදායම හඳුනා ගනී. ඊට අමතරව සමාගම තුල සිදුවන අන්තර් විකුණුම් ගනුදෙණු වල වටිනාකම ආදායම් හඳුනා ගැනීමේදී බැහැර කරනු ලබයි.

#### 3.5.1.1 භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගෙන ඇත්තේ ක්‍රියාත්මක විකුණුම් එකගතාවයන් සම්බන්ධ සාක්ෂි පාදකකොට ගනිමින් සහ ගැනුම්කරුවෙකු වෙත හිමිකාරිත්වය සම්බන්ධයෙන් සිදුවන ප්‍රතිලාභ සහ අවදානම් සැලකිල්ලට ගනිමිනි. ආදායම ඉන්වොයිස් වටිනාකමට හඳුනාගනු ලබයි.

#### 3.5.1.2 පොලී ආදායම

අයකර ගැනීම සැකසහිත නොවේනම් පොලී ආදායම උපචිත වශයෙන් හඳුනාගැනේ.

#### 3.5.1.3 ඉවත් කිරීම් වලින් ලැබෙන ලාභ හෝ අලාභ

දේපල පිරියත සහ උපකරණ ඉවත්කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ අදාල දේපල පිරියත සහ උපකරණ වල ධාරණ අගය සහ ශුද්ධ විකුණුම් ආදායම සංසන්දනය කිරීමෙන් නිර්ණය කරන අතර ඒවා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් යටතේ දැක්වේ.

### 3.5.2 වියදම් හඳුනාගැනීම

#### 3.5.2.1 මෙහෙයුම් වියදම්

දේපල පිරියත සහ උපකරණ එදිනෙදා නඩත්තු කිරීමේදී වැයවන සියලූ වියදම් වසර සඳහා වන විස්තීර ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කෙරේ. මූල්‍ය නොවන වත්කම්, මන්දගාමී සංසරණයක් සහිත තොග, ප්‍රමාණය ඉක්මවා වැඩුනු පැළතවාන් ඇතුලූ දේපල පිරියත සහ උපකරණ සම්බන්ධ සියලූ වගකීම් සහ ක්ෂයවීම් සඳහා වෙන් කිරීම් සිදුකර ඇත.

#### 3.5.2.2 මූල්‍ය පිරිවැය

මූල්‍ය පිරිවැය සඳහා පොලී වියදම් සහ කල් බදු යටතේ සිදුකල ගෙවීම් ඇතුළත් වේ. වත්කම් අත්පත් කරගැනීම්, සුදුසුකම්ලත් වත්කම් නිෂ්පාදනය හෝ ඉදිකිරීමට හෝ අදාල මූල්‍ය පිරිවැය හැර අනෙකුත් මූල්‍ය වියදම් සඵල පොලී අනුපාතික ක්‍රමය යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

මෙහෙයුම් කල්බදු යටතේ ගෙවනු ලබන පොලී සරල මාර්ග ක්‍රමය යටතේ බදු කාලසීමාව පුරා ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ.

#### 3.5.2.3 බදු වියදම

ආදායම් බදු වියදම වර්තමාන සහ විලම්භීත බදු වලින් සමන්විත වේ. ආදායම් බදු වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. භාවිතා නොකරන ලද බදු අලාභයන්, බදු ණය සහ අඩුකල හැකි තාවකාලික වෙනස් වීම් සඳහා විලම්භිත බදු වත්කමක් හඳුනාගැනේ. විලම්භීත බදු වත්කම් එක් එක් වාර්තා කරන දිනයේදී විමර්ෂණය කරන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ තවදුරටත් යතාකරණය නොවන්නේනම් එහි වටිනාකම අඩුකරනු ලැබේ.

### 3.6 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය යටතේ පිළියෙල කරනු ලබයි. බදු වාරික ගෙවීම, ලාභාංශ ගෙවීම සහ ප්‍රදාන හා ආධාර ලැබීම් මූල්‍ය ක්‍රියාකරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් ලෙසද ලැබූ පොලී හා ලාභාංශ ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් ලෙසද වර්ගීකරණය කර ඇත.

### 3.5.2.3.1 ප්‍රවර්තන බද්ධ

ප්‍රවර්තන වර්ෂයේ සහ සංසන්දනාත්මක වර්ෂයේ (පෙර වර්ෂයේ) වර්තමාන බදු වියදම, 2006 අංක 10 දරණ ආදායම් බදු පනත සහ ඊට අදාලව පසුව නිකුත් කර ඇති සංශෝධන වලට අනුකූලව ගණනය කරනු ලබයි. ඒ අනුව අදාල වර්ෂයේ බදු වන ආදායමට එරෙහිව දේශීය ආදායම් බදු කොමසාරිස් වෙත ගෙවූ හෝ ගෙවිය යුතු බද්ධ වර්තමාන බදු වියදම ලෙස හඳුනා ගැනේ.

### 3.5.2.3.2 විලම්භිත බදුකරණය

වත්කම් සහ වගකීම් වල ධාරණ අගය ලෙස බදුකරණයේදී හඳුනාගනු ලබන අගය සහ එම වත්කම් සහ වගකීම්වල ධාරණ අගය සහ මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන ඇති අගය අතර තාවකාලික වෙනස විලම්භිත බදුකරණයේදී 'වගකීම් ක්‍රමය' යටතේ හඳුනා ගැනේ.

පහත දැක්වෙන තාවකාලික වෙනස්වීම් වෙනුවෙන් විලම්භිත බදු හඳුනා නොගනී.

- බදුමය හෝ ගිණුම්කරණමය ලාභයක් ඇති නොවන වත්කම් හා වගකීම් වල මූලික හඳුනාගැනීම්. මෙය ව්‍යාපාර ඒකාබද්ධ කිරීම් සඳහා අදාල නොවේ.
- දුර දක්නා අනාගත කාලයක් තුල ප්‍රතිවර්ත නොවන උප සමාගමක් හෝ බද්ධ ව්‍යාපාරයක් වෙනුවෙන් කරන ලද ආයෝජන සම්බන්ධ වෙනස්කම්,
- මීට අමතරව මූලිකව හඳුනාගනු ලබන කීර්තිනාමයකට අදාල තාවකාලික වෙනස්වීම් ද විලම්භිත බදුකරණයේදී හඳුනා නොගනී.

විලම්භිත බදු ගණනය කිරීම තාවකාලික වෙනස්වීම් ප්‍රතිවර්ත වීමේදී අදාල වන බදු අනුපාත යටතේ සිදු කරනු ලබයි. භාවිතා නොකරන ලද බදු අලාභයන්, බදු බැරකම් සහ අඩු කල හැකි තාවකාලික වෙනස්කම්, විලම්භිත බදු වත්කම් ලෙස හඳුනාගැනේ. කෙසේ වෙතත්, මෙම විලම්භිත බදු වත්කමක් හඳුනාගනු ලබන්නේ එය උපලබ්ධි කර ගත හැකි බදු වන ලාභයක් දුර දක්නා අනාගත කාලයක් තුල ඇති විය හැකි බව විශ්වාසනීයව තහවුරු වන්නේ නම් පමණි. විලම්භිත බදු වත්කම් සෑම වාර්තා කරන දිනකදීම සමාලෝචනය කරන අතර එය අනාගතයේ උපලබ්ධි වන බදු ප්‍රතිලාභයේ ප්‍රමාණය දක්වා අඩු කිරීමට කටයුතු කරයි.

ප්‍රවර්තන බදු වත්කම් සහ බදු වගකීම් එකිනෙකට හිලව් කිරීමට හැකි බලාත්මක නීතිමය අයිතියක් පවතින්නේ නම් හෝ විලම්භිත බද්ධ එකම ඒකකයක් සහ අධිකාරියක් වෙනුවෙන් වන විටක හෝ විලම්භිත බදු වත්කම්, විලම්භිත බදු වගකීමට හිලව් කිරීම සිදුකරනු ලබයි.

විලම්භිත බදුකරණයට අදාල තොරතුරු ගිණුම්කරණ සටහන් අංක 24 සහ 09 හි දක්වා ඇත.

### 3.7 කොටසක ඉපැයුම

කොටසක ඉපැයුම, සාමාන්‍ය කොටස්කරුවන්ට හිමි වාර්ෂික ලාභය වසර සඳහා වූ සාමාන්‍ය කොටස් වල බරතැබූ සාමාන්‍යයෙන් බෙදීමෙන් ගණනය කරනු ලබයි.

### 3.8 වාර්තා කරන දිනට පසු සිදුවීම්

වාර්තා කරන දිනට පසු සිදුවීම් යනු මූල්‍ය ප්‍රකාශන වාර්තා කරන දිනය හා මූල්‍ය වාර්තා නිකුත් කිරීම සඳහා බලය ලත් දිනය අතර සිදුවන හිතකර හෝ අහිතකර සිදුවීම්ය.

වාර්තා කරන දිනට පසු සිදුවූ සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කිරීමට හෝ අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට හෝ කටයුතු කර ඇත.

# ගිණුම්කරණ සටහන්

| | | 2014 | 2013 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **4** | **ආදායම්** | | |
| | පොල් (සටහන් 4.1) | **514,176,778** | 402,365,395 |
| | රබර් | **39,698,357** | 62,405,810 |
| | රඹුටන් | **4,209,286** | 3,072,425 |
| | ගම්මිරිස් | **3,189,240** | 1,499,150 |
| | කජු | **4,330,443** | 1,018,656 |
| | කුරුඳු | **376,950** | 871,474 |
| | විසිතුරු පත්‍ර සහ පැළ | **4,558,466** | - |
| | වෙනත් (සටහන් 4.2) | **6,251,254** | 4,657,265 |
| | | **576,790,774** | 475,890,175 |

| | | | |
|---|---|---|---|
| **4.1** | **පොල් ආදායම** | | |
| | ගෙඩි පොල් | **444,456,824** | 342,821,037 |
| | බීජ පොල් | **41,655,519** | 48,465,111 |
| | පොල් තෙල් | **23,330,346** | 11,061,380 |
| | කොප්පරා | **4,734,089** | 17,867 |
| | | **514,176,778** | 402,365,395 |

**4.2 වෙනත් ආදායම්**

ඉහත වෙනත් ලෙස දක්වා ඇති ආදායම් තුල අඹ, මඤ්ඤොක්කා, පේර, කිරි වැනි මාර්ග වලින් උපයාගත් ආදායම් ඇතුළත් වේ.

**5 විකුණුම් පිරිවැය**

| | | | |
|---|---|---|---|
| | පොල් | **266,963,038** | 213,015,395 |
| | රබර් | **42,054,702** | 48,417,543 |
| | රඹුටන් | **1,155,416** | 668,693 |
| | ගම්මිරිස් | **427,462** | 387,097 |
| | කජු | **1,846,843** | 961,129 |
| | කුරුඳු | **151,673** | 573,612 |
| | විසිතුරු පත්‍ර සහ පැළ | **8,658,404** | - |
| | වෙනත් | **4,733,141** | 4,773,349 |
| | | **325,990,679** | 268,796,818 |

| | | 2014 | 2013 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **6** | **අනෙකුත් මෙහෙයුම් ආදායම්** | | |
| | පොල් ගස් විකුණුම් | **29,081,400** | 12,622,984 |
| | රබර් ගස් විකුණුම් | **8,778,518** | 5,631,860 |
| | වටිනාකම වෙනස්වීම මත ලාභ/අලාභ - පාරිභෝජ්‍ය ජෛව වත්කම් | **20,317,541** | 34,328,150 |
| | පොල් ලෙලි විකුණුම් | **25,190,659** | 22,000,033 |
| | අයකරන ලද ප්‍රමාද ගාස්තු | **7,286,474** | 5,018,553 |
| | කුලී සහ පහසුකම් ගාස්තු ආදායම | **3,168,662** | 4,588,872 |
| | දේ පි. උපකරණ විකිණීම/ඉවත්කිරීම මත ලාභ/අලාභ | **1,209,025** | (74,868) |
| | ලියා හැරීම | **1,424,089** | 1,834,728 |
| | ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ ලාභය/ (අලාභය) (සටහන් 6.1) | **-** | 262,342 |
| | වෙනත් ආදායම් | **6,573,372** | 9,614,431 |
| | | **103,029,740** | 95,827,085 |

**6.1** **ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ ලාභය/(අලාභය)**

ට්‍රැක්ටර් මධ්‍යස්ථානය, කළමනාකරණයේ තීරණයන් අනුව වියදම් ඒකකයන් ලෙස හඳුනාගෙන ඇති අතර එහි වියදම් පරිපාලන හා පොදු වියදම් යටතේ දක්වා ඇත.

**7** **පරිපාලන හා පොදු වියදම්**

| | 2014 | 2013 |
|---|---|---|
| වැටුප් වේතන සහ ඒ ආශ්‍රිත වියදම් | **79,439,748** | 67,216,624 |
| නඩත්තු සහ අලුත්වැඩියා වියදම් | **14,153,358** | 12,493,403 |
| අනෙකුත් පරිපාලන වියදම් | **37,557,077** | 29,540,652 |
| | **131,150,183** | 109,250,679 |
| **මෙහෙයුම් කටයුතුවලින් වූ ලාභ ගණනය කිරීමේදී** | | |
| පහත වියදම් අඩුකර ඇත. | | |
| අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | **4,047,756** | 4,210,036 |
| ව්‍යවස්ථාපිත විගණනයට අදාල විගණන ගාස්තු | **635,000** | 590,000 |
| කාර්ය සාධන දිරිදීමනා | **28,779,734** | 27,429,989 |
| ප්‍රසාද දීමනා | **12,319,147** | 8,614,940 |
| පරිත්‍යාග සහ සාමූහික සමාජීය වගකීම් වෙනුවෙන් කල වියදම් | **4,564,825** | 1,993,996 |
| ක්ෂය/ක්‍රමක්ෂය | | |
| බදු අයිතිය යටතේ ඇති භිස් ඉඩම් | **3,169,953** | 3,169,953 |
| නිශ්චල කල්බදු වත්කම් (හිස් ඉඩම් හැර) | **4,841,976** | 4,841,976 |
| ඵලදරණ ජෛව වත්කම් | **9,205,466** | 8,228,002 |
| දේපල, පිරියත හා උපකරණ | **33,716,104** | 22,393,615 |
| පුද්ගල පිරිවැය | | |
| වැටුප්, වේතන, සේ. අ. අ. හා සේ. භා. අ. | **229,054,334** | 206,683,002 |
| නිර්ණය කල ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික | **24,114,591** | 23,593,586 |

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|

## 8 ශුද්ධ මූල්‍ය ආදායම/ වියදම

### 8.1 පොලී ආදායම්

| | | |
|---|---|---|
| ස්ථාවර තැන්පතු මත පොලී | **28,878,489** | 41,252,290 |
| භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මිලදී ගැනීම් මත පොලී (සටහන් 8.1.1) | **748,532** | 1,445,447 |
| සේවක ණය මත පොලී | **552,332** | 473,271 |
| කලින් ගෙවූ සේවක ප්‍රතිලාභ | **1,162,966** | 1,165,986 |
| | **31,342,319** | 44,336,994 |

### 8.2 පොලී වියදම්

| | | |
|---|---|---|
| කල්බදු පොලී | **24,844,072** | 22,742,587 |
| තාවකාලික බැංකු ණය පොලී | **-** | 469,199 |
| සේවක ණය ක්‍රමක්ෂයවීම් | **1,162,966** | 1,165,986 |
| | **26,007,038** | 24,377,772 |
| | **5,335,281** | 19,959,222 |

### 8.1.1 ද්විතීක වෙළඳ පොළ ගණුදෙනු සම්බන්ධ රඳවා ගැනීම් බදු මත ව්‍යවස්ථාපිත ණය

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ ජේද 137 මගින් කිසියම් සමාගමක් රාජ්‍ය සුරැකුම් ආශ්‍රිත ද්විතීය වෙළෙඳ පොළ ගණුදෙනු සිදු කිරීම මගින් පොලී ආදායමක් උපයයිනම් කාල්පනික රඳවාගත් බද්ද ආදාල බදු වර්ෂයේදී සමාගමේ ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් බවට පත් වේ.

ඒ අනුව වසර 2014 දී රජයේ සුරැකුම් සම්බන්ධ ද්විතීය වෙළෙඳ පොළ ගණුදෙනු වලින් උපයා ගත් ශුද්ධ පොලී ආදායම, මූල්‍ය ප්‍රකාශයන්හි දළ පොලී ආදයමක් ලෙසට හඳුනාගැනිම සඳහා ශුද්ධ පොලී ආදායමෙන් 1/9 වන රුපියල් 74,853/= ක කාල්පනික රඳවාගත් බද්ද එකතු කර දක්වා ඇත.

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |

## 9 ආදායම් බදු වියදම්

### 9.1 ප්‍රවර්තන බදු වියදම

2006 අංක 10 දරණ ආදායම් පනතේ 48 (ඒ) වගන්තිය 2011 අංක 22 දරණ ආදායම් බදු පනතෙහි 16 වන වගන්තියෙන් සංශෝදනය කරඇති අතර ඒ අනුව කෘෂිකාර්මික කටයුත්තක් තුලින් ඉපැයූ ලාභ සහ ආදායම් එම පනතේ පළමු උපලේඛණයට අනුව 10% බදු අනුපාතයට යටත් වේ. අනෙකුත් ලාභ සාමාන්‍ය අනුපාතය යටතේ බද්දට යටත්වේ

| | 2014 | 2013 |
|---|---|---|
| ප්‍රවර්තන ආදායම් බදු වියදම් ( සටහන 9.2 ) | 4,400,495 | 1,146,157 |
| පෙර වසරේ ආදායම් බදු ඌණ/ (අධි) වෙන්කිරීම් | - | (430,205) |
| විලම්භිත බදු වියදම | 9,376,416 | 4,767,095 |
| | 13,776,911 | 5,483,047 |

### 9.2 ගිණුම්කරණ ලාභය සහ බදුවන ලාභය සැසඳීම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2014 | 2013 |
|---|---|---|
| බදුවලට පෙර ගිණුම්කරණ ලාභය | 228,014,933 | 213,628,982 |
| අනෙකුත් ප්‍රභවයන් ගෙන් ලද ආදායම් හා බද්දෙන් නිදහස් ආදායම් | (76,393,750) | (77,424,290) |
| | 151,621,183 | 136,204,692 |
| අඩු කිරීමට ඉඩ නොදෙන අයිතමයන්ගේ එකතුව | 81,892,433 | 66,810,551 |
| අඩු කිරීමට ඉඩ දෙන අයිතමයන්ගේ එකතුව | (152,967,150) | (176,237,586) |
| ගලපන ලද ව්‍යාපාර ලාභය | 80,546,466 | 26,777,657 |
| | | |
| අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම | 30,179,353 | 43,171,008 |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | 110,725,819 | 69,948,665 |
| සුදුසුකම් ලද ගෙවීම් | (66,720,873) | (58,487,095) |
| බදු අයකළ හැකි ආදායම | 44,004,947 | 11,461,570 |
| | | |
| කෘෂිකාර්මික ක්‍රියාකාරකම් මත බද්ද 10% | 4,400,495 | 1,146,157 |
| වෙනත් ආදායම් මත බද්ද 28% | - | - |
| | | |
| වාර්ෂික ලාභය මත ආදායම් බද්ද | 4,400,495 | 1,146,157 |

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |

## 9.3 විලම්භිත බදු වියදම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සහ බදුකරණයේදී, වත්කම් හා වගකීම් වල ශුද්ධ ධාරණ අගය ලෙස යොදාගන්නා වටිනාකම් වල තාවකාලික වෙනසක් පවතින අතර එම තාවකාලික වෙනස සඳහා වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්භිත බදු වගකීම ගණනය කරනු ලබයි. එය සටහන් අංක 24 දක්වා ඇත. විලම්භිත බදු වගකීමෙහි ඇතිවන්නා වූ වෙනස වසර තුලදී මූල්‍ය ප්‍රකාශයන්හි හඳුනා ගැනේ.

| විලම්භිත බදු වියදම්/ ආදායම් | 2014 | 2013 |
|---|---|---|
| බදු කරණයේදි යොදාගන්නා තීව්‍ර ක්ෂය කිරීම් | **(2,046,489)** | (2,414,803) |
| මේරූ සහ නොමේරූ වගා ක්‍රමක්ෂය | **(7,315,012)** | (8,407,163) |
| බොල් හා අඩමාණ ණය සඳහා වෙන්කිරීම් | **8,500** | 155,787 |
| නිර්නය කල සේවක ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික | **(23,415)** | 5,899,084 |
| | **(9,376,416)** | (4,767,095) |

## 10 කොටසක ඉපැයුම

කොටසක ඉපැයුම, සාමාන්‍ය කොටස්කරුවන්ට හිමි වාර්ෂික ලාභය වසර සඳහා වූ සාමාන්‍ය කොටස් වල බරතැබූ සාමන්‍යයෙන් බෙදීමෙන් ගණනය කරනු ලබයි.

## 10.1 මූලික කොටසක ඉපයීම

| | 2014 | 2013 |
|---|---|---|
| සාමාන්‍ය කොටස්කරුවන්ට හිමි ලාභය (රු.) | **214,238,022** | 208,145,938 |
| බර තබන ලද සාමාන්‍ය කොටස් ගණන | **20,000,001** | 20,000,001 |
| කොටසක ඉපැයුම (රු. ශත) | **10.71** | 10.41 |

## 10.2 පහත හෙලන ලද කොටසක ඉපැයුම්

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුලදී කිසිදු අවස්ථාවක සාමාන්‍ය කොටස් වල මිල පහළයාමක් ඇති වී නැත. එම නිසා පහත හෙලන ලද කොටසක ඉපැයුමද උක්ත ගණනය කර ඇති කොටසක මූලික ඉපැයුමටම සමාන වේ.

## 11 බදු අයිතිය යටතේ ඇති හිස් ඉඩම්

**11.1** වරලත් ගණකාධිකරණ ආයතනයේ කඩිනම් වැඩ පැවරුම් බලකායෙන් ලබා ගත් රීතින් අනුව යමින් සමාගම පිහිට වූ 1992 ජූලි 18 දින සිට  ක්‍රියාත්මක වන පරිදි සියළුම වතුවල බදු අයිතීන්හි වටිනාකම සමාගමේ පොත් වලට ඇතුලත් කරන ලදී. මෙම කාර්ය සඳහා 1995 මාර්තු 08 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම හිස් බදු ඉඩම්, තක්සේරු විශේෂඥ ඩී.ආර්. වික්‍රමසිංහ මහතා විසින් සමාගම පිහිටුවීමට පෙර ඊට ආසන්නයේ ඊට පෙර මෙම බදු ඉඩම් සඳහා ලබා දී තිබූ වටිනාකම ප්‍රත්‍යාගණනය කළ යුතු බවට තීරණය කර ඇත. මෙම ඉඩම් වල බදු අයිතිය ලෙස 1992 ජූනි 18 දින ශේෂ පත්‍රයට ගනු ලැබූ ප්‍රත්‍යාගණන වටිනාකම රුපියල් 168,007,552 විය. එම වත්කම් වල ධාරණ අගය සටහන අංක 11.3 හි දැක්වා ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS - SLFRS)  බලාත්මක කිරීමත් සමගම 2012 දෙසැම්බර් 19 වන දින බදු අයිතිය යටතේ ඇති ඉඩම් සම්බන්ධයෙන් නිකුත් කරන ලද 'බදු අයිතිය යටතේ ඇති ඉඩම් සම්බන්ධව නිර්දේශිත භාවිතයන් පිළිබඳ ප්‍රකාශය' (SORP) මගින් මීට පෙර කඩිනම් වැඩ පැවරිලි බලකාය (UITF) විසින් නිකුත් කර තිබූ ඊට අදාල නියමයන් අහෝසි කර ඇත.

එම ප්‍රකාශයට අනුව බදු පදනම යටතේ ඇති ඉඩම් තවදුරටත් ප්‍රත්‍යාගණනය කිරීමට ඉඩ දෙනු නොලබයි.

**11.2** ජනවසම සතුව පැවති වතු 13 ක් සමාගමට බාර දුන් නමුදු ඉන් වතු 05 ක පමණක් බදු ගිවිසුම් සම්පුර්ණ කර ඇති අතර ඉතිරි වතු 08 හි (දඹදෙණිය, දොඩම්ගස්ලන්ද, හිරියාල, කටුගම්පල, කුරුණෑගල, මහයාය, නාරම්මල සහ වාරියපොල) බදු ගිවිසුම් සම්පුර්ණ කළ යුතුව ඇත. මෙම බදු ගිවිසුම් ජූනි 18 දින සිට ක්‍රියාත්මක වන පරිදි සකස් කර ඇත. බදු ගිවිසුම් සම්පූර්ණ නොවූ වතු වෙනුවෙන් සමාගම හා ජනවසම අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත. මෙය ජනවසම හා සමාගම අතර ඇති වලංගු ගිවිසුමක් ලෙස ක්‍රියාකරයි.

### 11.3 බදු අයිතිය යටතේ ඇති හිස් ඉඩම් (වසර 53)

| පිරිවැය ශේෂය 31.12.2014 රු. | සමුච්චිත ක්‍රමක්ෂය 01.01.2014 රු. | වාර්ෂික ක්‍රමක්ෂය රු. | සමුච්චිත ක්‍රමක්ෂය 31.12.2014 රු. | ධාරණ අගය **31.12.2014** දිනට රු. | ධාරණ අගය 31.12.2013 දිනට රු. |
|---|---|---|---|---|---|
| 168,007,552 | 68,279,938 | 3,169,953 | 71,449,891 | **96,557,661** | 99,727,614 |

## 12 නිශ්චල බදු දේපළ (හිස් ඉඩම් හැර)

සටහන 11හි විස්තර කර ඇති පරිදි, ජනවසමෙන් බාර දුන් සියළුම වතුවල බදු ගිවිසුම් සම්පූර්ණ වී නොමැති වුවත් වරලත් ගණකාධිකාරි ආයතනයේ කඩිනම් වැඩ පැවිරිලි බලකායේ නියමයන්ට අනුකූලව, මූල්‍ය කල් බදු යටතේ ඇති වතුවල සියළුම වත්කම් 1992 ජූනි 18 වන දින සිට බලපාන පරිදි සමාගමේ පොත් වල ඇතුළත් කර ඇත. මෙම කාර්ය සඳහා එම වත්කම් සමාගමේ පොත්වල වාර්තා කළ යුත්තේ, එම වත්කම් ජනවසම පොත් වල පෙන්වන පොත් අගයටය යන්න 1995 මාර්තු මස 8 වැනි දින අධ්‍යක්ෂමණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

මෙම වත්කම් 1992 ජූනි 18 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පහත දැක්වෙන පරිදි සටහන්  කර ඇති අතර පහත පරිදි ක්ෂයවීමට ලක් කොට ඇත.

**ප්‍රත්‍යාගණනිත අගය**

| | | රු. |
|---|---|---|
| ඉඩම් සංවර්ධන පිරිවැය | වසර 30 | 1,123,305 |
| ගොඩනැගිලි | වසර 25 | 22,130,873 |
| යන්ත්‍රෝපකරණ | වසර 15 | 34,841 |
| මේරූ වගාවන් | වසර 30 | 43,001,122 |
| නොමේරූ වගාවන් | | 90,647,222 |
| | | 156,937,363 |

## ගිණුම්කරණ සටහන්

එම වත්කම්වල ඉදිරියට ගෙන ආ ශේෂයන් පහත පරිදි වේ.

| ප්‍රත්‍යාගණනිත අගය | 01.01.2014 දිනට ශේෂය | මාරු කිරීම් | එකතු කිරීම් (ඉවත් කිරීම්) | **31.12.2014 දිනට ශේෂය** |
|---|---|---|---|---|
| ඉඩම් සංවර්ධන පිරිවැය | 1,123,305 | - | - | **1,123,305** |
| ගොඩනැගිලි | 17,693,752 | - | - | **17,693,752** |
| යන්ත්‍රෝපකරණ | 34,841 | - | - | **34,841** |
| මේරූ වගාවන් | 122,903,503 | - | - | **122,903,503** |
| | 141,755,401 | - | - | **141,755,401** |

| ක්‍රමක්ෂය | 01.01.2014 දිනට ශේෂය | මාරු කිරීම් | වසරට ආදාල ක්ෂය වීම් | **31.12.2014 දිනට ශේෂය** |
|---|---|---|---|---|
| ඉඩම් සංවර්ධන පිරිවැය | 806,522 | - | 37,444 | **843,966** |
| ගොඩනැගිලි | 15,244,744 | - | 707,750 | **15,952,494** |
| යන්ත්‍රෝපකරණ | 34,841 | - | - | **34,841** |
| මේරූ වගාවන් | 75,257,517 | - | 4,096,782 | **79,354,299** |
| | 91,343,624 | - | 4,841,976 | **96,185,600** |

| ධාරණ අගය | 01.01.2014 දිනට ශේෂය | **31.12.2014 දිනට ශේෂය** |
|---|---|---|
| ඉඩම් සංවර්ධන පිරිවැය | 316,783 | **279,339** |
| ගොඩනැගිලි | 2,449,008 | **1,741,258** |
| යන්ත්‍රෝපකරණ | - | **-** |
| මේරූ වගාවන් | 47,645,986 | **43,549,204** |
| | 50,411,777 | **45,569,801** |

ධාරණ අගය

ජනවසම මගින් බාර දුන් වතුවල ඒ වනවිට පැවිති නොමේරූ වගාවන් සඳහා කර තිබූ ප්‍රාග්ධන ආයෝජන වියදම් 1992.06.18 දිනට වූ ප්‍රත්‍යාගණනිත අගයට "නොමේරූ වගාවන්" යටතේ පෙන්වා ඇත. ඉන් අනතුරුව මෙම වගාවන් ඵලදරණ තුරූ දරන ලද ප්‍රාග්ධන ආයෝජන වියදම් සටහන අංක 13 අ හි දක්වා ඇත. මෙම වගාවන් ඵලදරණ/පරිණත වගාවන් තත්ත්වයට පත් වූ විට එම වගාවන් එම තත්ත්වයට ගෙන ඒම දක්වා දරණ ලද සටහන අංක 13 අ හි "නොමේරූ වගාවන්" ගණය යටතේ පෙන්වා ඇති අමතර පිරිවැය එම සටහන යටතේ "මේරූ වගාවන්" ගණයට මාරු කර ඇත. ඊට අනුරූපිතව මෙම සටහන් (අංක 13 අ හි) "නොමේරූ වගාවන්" යටතේ එම වගාවන් සම්බන්ධයෙන් වන යම් පිරිවැයක් වෙතොත් එය මෙම සටහනේම "මේරූ වගාවන්" යටතට මාරු කිරීම සිදු කර ඇත.

## 13 අ ඵලදරණ ජෛව වත්කම්

ආරම්භයේ සිටම දිගුකාලීන වගාවන් සඳහා කරන ලද ප්‍රාග්ධන වියදම් සම්බන්ධ විස්තර පහත වේ. බදු ගිවිසුම යටතේ අත්පත් කර ගත් වත්කම් (වගාවන්ද ඇතුලත්ව) සටහන් අංක 11 සහ 12 ඇතුළත් කර ඇත. ජනවසමින් බදු පදනම යටතේ සමාගමට පැවරුන "නොමේරූ වගාවන්" වෙනුවෙන් ඉන්පසුව දරණ ලද ආයෝජන වියදම් මෙම සටහන යටතේ පෙන්වා ඇත. මෙම වගාවන් අත්වූ දිනයේ සිට ඵලදරණ තෙක් දරණ ලද "නොමේරූ වගාවන්" යටතේ ඇති අතිරේක ආයෝජන වියදම් ප්‍රමාණය මෙම වගාවන් ඵලදරණ/ පරිනත තත්ත්වයට පත්වීමේදී "මේරූ වගාවන්" යටතට මාරුකර ඇත. ඊට අනුරූපිතව සටහන් අංක 12 හි (ජනවසමෙන් බද්දට ගත් නිශ්චල වත්කම්) "නොමේරූ වගාවන්" යටතේ එම වගාවන්ට අදාල පිරිවැයක් වේනම් එය එම සටහනෙහි "මේරූ වගාවන්" යටතට මාරුකිරීම සිදුකර ඇත.

| | නොමේරූ ජෛව වත්කම් | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| පිරිවැය | පොල් රු. | රබර් රු. | කජු රු. | කුරුඳු රු. | රඹුටන් රු. | වෙනත් රු. | එකතුව රු. |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 277,127,744 | 34,647,705 | 12,054,746 | 2,564,139 | 1,701,101 | 18,492,646 | 346,588,081 |
| වර්ෂය තුළ එකතු වීම් | 64,134,947 | 10,924,628 | 430,492 | 1,942,275 | 272,865 | 4,672,607 | 82,377,814 |
| වර්ෂය තුළ මාරුකිරීම් | (1,477,510) | - | (1,461,156) | - | (361,429) | (4,616,586) | (7,916,681) |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | | | | | | | - |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **339,785,181** | **45,572,333** | **11,024,082** | **4,506,414** | **1,612,537** | **18,548,667** | **421,049,214** |

| | මේරූ ජෛව වත්කම් | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| පිරිවැය | පොල් වසර 50 රු. | රබර් වසර 20 රු. | කජු වසර 20 රු. | කුරුඳු වසර 20 රු. | රඹුටන් වසර 20 රු. | වෙනත් රු. | එකතුව රු. |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 290,453,686 | 50,471,818 | 7,043,903 | 2,468,600 | 1,565,354 | 5,655,251 | 357,658,611 |
| වර්ෂය තුළ එකතු වීම් | 1,477,510 | - | 1,461,156 | - | 361,429 | 4,616,586 | 7,916,681 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | (77,233) | - | - | - | (77,233) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **291,931,196** | **50,471,818** | **8,427,826** | **2,468,600** | **1,926,783** | **10,271,837** | **365,498,060** |
| | | | | | | | |
| **ක්‍රමක්ෂය** | | | | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 45,918,404 | 22,239,377 | 932,964 | 1,596,410 | 357,421 | 826,769 | 71,871,345 |
| වර්ෂය සඳහා අය කිරීම් | 5,809,074 | 2,523,591 | 352,197 | 123,430 | 114,411 | 282,763 | 9,205,466 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | (55,008) | - | - | - | (55,008) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **51,727,478** | **24,762,968** | **1,230,153** | **1,719,840** | **471,832** | **1,109,532** | **81,021,803** |
| | | | | | | | |
| 31.12.2013 දිනට ධාරණ අගය | 244,535,282 | 28,232,441 | 6,110,939 | 872,190 | 1,207,933 | 4,828,482 | 285,787,266 |
| **31.12.2014 දිනට ධාරණ අගය** | **240,203,718** | **25,708,850** | **7,197,673** | **748,760** | **1,454,951** | **9,162,305** | **284,476,257** |
| | | | | | | | |
| **මුළු ඵලදරණ ජෛව වත්කම්** | | | | | | | |
| 31.12.2013 දිනට ධාරණ අගය | 521,663,026 | 62,880,146 | 18,165,685 | 3,436,329 | 2,909,034 | 23,321,128 | 632,375,347 |
| **31.12.2014 දිනට ධාරණ අගය** | **579,988,899** | **71,281,183** | **18,221,755** | **5,255,174** | **3,067,488** | **27,710,972** | **705,525,471** |

## 13 ආ පාරිභෝජ්‍ය ජෛව වත්කම් - දැව ගස්

| | 31.12.2014<br>රු. | 31.12.2013<br>රු. |
|---|---|---|
| ජනවාරි 1 වැනි දිනට ශේෂය | **130,885,608** | 125,890,158 |
| වටිනාකම අඩු වැඩි වීම තුල හඳුනාගත් ලාභ හෝ අලාභ | **20,317,541** | 34,328,150 |
| දැව ගස් හෙලීම නිසාවූ වටිනාකමේ අඩුවීම | **(19,011,097)** | (29,332,700) |
| දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය | **132,192,052** | 130,885,608 |

ජෛව වත්කම් පරිවර්තනය මූල්‍යමය වටිනාකමක් දක්වා වර්ධනය වී නොමැති විට නොමේරූ දැව ගස් සඳහා වන පිරිවැය දළ සාධාරණ අගයක් වශයෙන් සැළකේ.

වට්ටම්කළ මුදල් ප්‍රවාහ ක්‍රමවේදය යොදාගනිමින් ආරියතිලක ඇසෝෂියේට්ස් ආයතනය මගින් අදාළ තක්සේරුකරණය සිදුකෙරිණි. දැව ගස් වල සාධාරණ අගය නිශ්චය කිරීමේදී සියළු වතු ආවරණය කරමින් භෞතික නිශ්චය කිරීමක් සිදුකරන ලදී.

**තක්සේරුකරණයේදී යොදා ගැනුනු මූලික උපකල්පන**

1 වන සංවර්ධන සැලසුමට අනුව වැවිලි කළමනාකරණ හා අධීක්ෂණ අංශයේ (PMMD) සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ගස් හෙලීම අනුමත කෙරේ.

2 වියදම් අඩු කිරීමෙන් පසු ලැබෙන ශුද්ධ විකුණුම් මිල ගණනය කිරීම සඳහා යොදාගෙන ඇත.

3 වට්ටම් අනුපාතය 14%කි.

ශුද්ධ වර්තමාන වටිනාකම් මත පදනම් බාහිර තක්සේරුකරණය දැව ගස් වල දිගු කාලීන හානිවීම සැලකිල්ලට ගෙන ඇත. විචල්‍යන්ගේ වෙනස්වීම හේතුවෙන් සාධාරණ අගය මත ජෛව වත්කම් තක්සේරුකිරීමේදී පවතින ඒ හා බැඳුනු අස්ථාවරත්වය හේතුවෙන් ඒවායේ පවතින වටිනාකම සත්‍ය වටිනාකමෙන් වෙනස් විය හැක.

සමාගම සිය දැව ගස් සම්බන්ධයන් පහත දැක්වෙන අවදානම් වලට නිරාවරණය වේ.

**නියාමන සහ පාරිසරික අවදානම්**

සමාගම ශ්‍රී ලංකාවේ නීතිරීති හා රෙගුලාසි වලට යටත් වේ. දේශීය පාරිසරික සහ වෙනත් නීතිරීති වලට අනුකූලව කටයුතු කිරීම සඳහා සමාගම පාරිසරික ප්‍රතිපත්ති සහ ක්‍රියාදාමයන් පිහිටුවා ඇත. පාරිසරික අවදානම් හඳුනාගැනීම සඳහා කළමනාකාරීත්වය මගින් නිරන්තර විමර්ශනයන් සිදුකෙරේ.

**සැපයුම් සහ ඉල්ලුම් අවදානම**

දැව වල අලෙවි පරිමාවන් සහ මිල උච්චාවචනයන් සම්බන්ධ අවදනාම් වලට සමාගම නිරාවරණය වේ. හැකි අවස්ථාවන්හිදී සමාගම මගින් සිය නිෂ්පාදන පරිමාව වෙළෙඳපොල ඉල්ලුම සහ සැපයුමට අනුව සකසමින් මෙම අවදානම කළමනාකරණය කරයි. සමාගමෙහි මිල ව්‍යුහය වෙළෙඳ පොළ මිල හා සමගාමී වන බවට සහ අපේක්ෂිත නිෂ්පාදන පරිමාව වෙළෙඳපොල ඉල්ලුමට සරිලන පරිදි පවතින බව තහවුරු කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් විශ්ලේෂණාත්මක අධ්‍යනයන් සිදුකරනු ලබයි.

**දේශගුණ සහ වෙනත් අවදානම්**

සමාගමෙහි දැව ගස් කාලගුණ වෙනස්වීම්, රෝග සහ වෙනත් ස්වභාවික ආපදාවන්ගේ අවදානමට ලක් වේ.

## 14 දේපළ පිරියත හා උපකරණ

සමාගම ආරම්භ කල 1992 ජූනි 18 වැනි දින, ගැසට් නිවේදනය මඟින් සමාගම වත පැවරූ වත්කම් හා ඉන්පසුව කරන ලද එකතු කිරීම් ඉවත් කිරීම් පහත දැක්වේ. බදු පදනම යටතේ බාරගත් වත්කම් ගිණුම් සටහන් අංක 11 සහ 12 හි දක්වා ඇත.

| | ඉඩම් අත්පත්කර ගැනීම් | ඉඩම් සංවර්ධන පිරිවැය | ගොඩනැගිලි | ළිං | වැටවල් | මෝටර් රථ | යන්ත්‍ර සූත්‍ර | ලී බඩු හා සවිකිරීම් | උපකරණ | පරිගණක උපකරණ | පරිගණක මෘදුකාංග | නොනිමි වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වත්කම්වල ආයු කාලය (වසර) | | | 40 | 40 | 3 | 5 | $13\,^1/_3$ | 10 | 8 | 5 | 5 | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පිරිවැය | | | | | | | | | | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 8,123,564 | 2,746,569 | 57,580,938 | 5,103,895 | 26,105,388 | 132,348,053 | 785,609 | 9,023,742 | 12,017,427 | 2,560,300 | - | 35,065,036 | 291,460,521 |
| වර්ෂය තුළ එකතුවීම් | - | 881,154 | 34,754,192 | 83,220 | 12,144,580 | 9,519,123 | 1,064,000 | 1,957,014 | 1,897,776 | 747,625 | 220,000 | 13,932,721 | 77,201,405 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - | (1,549,931) | (1,285,500) | - | - | (40,000) | - | - | (309,677) | (3,185,108) |
| වර්ෂය තුළ මාරු කිරීම් | - | - | 33,484,420 | - | - | - | - | - | - | - | - | (33,484,420) | - |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **8,123,564** | **3,627,723** | **125,819,550** | **5,187,115** | **36,700,037** | **140,581,676** | **1,849,609** | **10,980,756** | **13,875,203** | **3,307,925** | **220,000** | **15,203,660** | **365,476,818** |
| සමුච්චිත ක්ෂය වෙන්කිරීම් | | | | | | | | | | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | - | - | 3,151,881 | 753,717 | 7,009,269 | 47,367,571 | - | 1,922,227 | 4,634,496 | 1,602,851 | - | - | 66,442,012 |
| වර්ෂය සඳහා අයකිරීම් | - | - | 1,438,226 | 127,597 | 8,185,154 | 21,451,389 | 58,921 | 890,857 | 1,282,764 | 281,196 | - | - | 33,716,104 |
| වර්ෂය තුළ ඉවත්කිරීම් | - | - | - | - | (1,549,931) | (1,285,500) | - | - | - | - | - | - | (2,835,431) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **-** | **4,590,107** | **881,314** | **13,644,492** | **67,533,460** | **58,921** | **2,813,084** | **5,917,260** | **1,884,047** | **-** | **-** | **97,322,685** |
| ධාරණ අගය | | | | | | | | | | | | | |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 8,123,564 | 2,746,569 | 54,429,057 | 4,350,178 | 19,096,119 | 84,980,482 | 785,609 | 7,101,515 | 7,382,931 | 957,449 | - | 35,065,036 | 225,018,509 |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **8,123,564** | **3,627,723** | **121,229,443** | **4,305,801** | **23,055,545** | **73,048,216** | **1,790,688** | **8,167,672** | **7,957,943** | **1,423,878** | **220,000** | **15,203,660** | **268,154,134** |

පොල්අත්තාපිටිය නමින් හඳුන්වන ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති හෙක්ටයාර 1.416 ක විශාලත්වයෙන් යුතු භූමිය කුරුණෑගල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පවරා ගෙන 1987 ජූලි 15 දින ජනවසමට බාර දුන් ඉඩමක් වුවද නෛතික හිමිකම් අයිතිය ජනවසමට පැවරී නැති හෙයින් එහි අයිතිය තවමත් රජය සතුව පවතී. ඉඩම අත්පත් කර ගැනීම හේතු කොට ගෙන ඉඩමේ මුල් හිමිකරු වන එච්. එල්. ද මෙල් සමාගමට ගෙවිය යුතු වන්දි මුදල් නොගෙවීම හේතු කොට ගෙන මුල් හිමිකරු අභියාචනාධිකරණයේ පැවරූ නඩුවේ තීන්දුවට අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ ඉඩමේ අයිතිය කුරුණෑගල වැවිලි සමාගමට පැවරීමේ යෝජිත එකඟත්වයක් හා එම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඉල්ලීම අනුව ප්‍රාදේශීය ලේකම් - කුරුණෑගල මඟින් එච්. එල්. ද මෙල් සමාගමට ගෙවන ලද රුපියල් මිලියන 3.5 ක වන්දි මුදල "ඉඩම් අත්පත් කර ගැනීම් - ප්‍රධාන කාර්යාල භූමිය" යටතේ ඇතුළත් කර ඇත. වන්දි වශයෙන් ලැබිය යුතු රුපියල් මිලියන 3.5 ක මුදල වසර 18 ක කාලයක් නොගෙවා ප්‍රමාද වීම හේතු කොට ගෙන ඒ මත ගණනය කරන ලද නෛතික පොලිය වන රු. 4,623,564.00 ද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීමට අනුව මෙම ගෙවීමට සමාගම එකඟ විය. ඒ අනුව මෙම ඉඩම අත්පත් කර ගැනීම සඳහා සමාගම දරණ සම්පූර්ණ මුදල රු. 8,123,564.00 ක් වේ. ගෙවූ සම්පූර්ණ මුදලම ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැය යටතේ දක්වා ඇත. නමුත් මෙම ඉඩමේ නෛතික අයිතිය සමාගම වෙත පැවරීම තවමත් සිදු වී නොමැත.

| | | | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|---|---|
| | | | රු. | රු. |

## 15 වෙනත් මූල්‍යමය වත්කම්

| | | | | |
|---|---|---|---|---|
| | ජංගම නොවන වත්කම් | | | |
| | සේවකයන් සඳහා දුන් ණය | 15.1 | **5,232,250** | 4,366,450 |
| | පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ | 15.2 | **296,902** | 481,647 |
| | | | **5,529,152** | 4,848,097 |
| | ජංගම වත්කම් | | | |
| | සේවකයන් සඳහා දුන් ණය | 15.1 | **4,834,481** | 4,187,149 |
| | පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ | 15.2 | **722,789** | 912,819 |
| | | | **5,557,270** | 5,099,968 |

## 15.1 සේවකයන් සඳහා දුන් ණය

| | | | |
|---|---|---|---|
| | | රු. | Rs. |
| | වර්ෂය ආරම්භක දිනට ශේෂය | **9,948,065** | 8,942,555 |
| | වර්ෂය තුළ ප්‍රදානය කළ ණය | **8,071,500** | 7,427,800 |
| | වර්ෂය තුළ අයකරගත් ණය | **(6,933,143)** | (6,422,291) |
| | | **11,086,422** | 9,948,064 |
| | පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ වලට මාරු කිරීම් | **(1,019,691)** | (1,394,466) |
| | වර්ෂය අවසන් දිනට ශේෂය | **10,066,731** | 8,553,598 |
| | ජංගම නොවන වත්කම් | **5,232,250** | 4,366,450 |
| | ජංගම වත්කම් | **4,834,481** | 4,187,149 |
| | | **10,066,731** | 8,553,599 |

## 15.2 පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ

| | | | |
|---|---|---|---|
| | වර්ෂය ආරම්භක දිනට ශේෂය | **1,394,466** | 1,149,659 |
| | වර්ෂය තුළ එකතු වීම් | **788,191** | 1,410,793 |
| | ක්‍රමක්ෂය | **(1,162,966)** | (1,165,986) |
| | වර්ෂය අවසන් දිනට ශේෂය | **1,019,691** | 1,394,466 |
| | ජංගම නොවන වත්කම් | **296,902** | 481,647 |
| | ජංගම වත්කම් | **722,789** | 912,819 |
| | | **1,019,691** | 1,394,466 |

5%ක සහනදායි වාර්ෂික පොලී පදනමක් මත සමාගම සේවකයින්ට ණය ලබා දෙනු ලබයි. පළමු ගිණුම් ගත කිරීමේදීම එම ණය සාධාරණ අගයකට ගිණුම්ගත කරනු ලැබේ. සේවකයින්ට දෙනු ලබන ණය වලට අදාල සාධාරණ අගය ගණනය කරනු ලබන්නේ අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහය වර්තමාන වෙළෙඳපොල පොලී අනුපාතයෙන් වට්ටම් කිරීමෙනි. සේවකයින්ට ලබා දෙන ණය වලට අදාලව පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ ලෙස හඳුනාගනු ලබන්නේ ණය වල පිරිවැය සහ ගණනය කරන ලැබූ සාධාරණ අගය අතර වෙනසයි.

සේවකයින් වෙත ලබාදෙන ලද ණය සුරක්ෂිත වන අතර පහත දැක්වෙන අනුපාත අනුව පොලිය අය කෙරේ.

| | **31.12.2014**<br>රු. | 31.12.2013<br>රු. |
|---|---|---|
| ආපදා ණය | | |
| කුරුණෑගල වැවිලි සමාගම | **5%** | 5% |
| වෙළෙඳ පොළ පොලී අනුපාතය | **12%** | 20% |

## 16 තොග

| | | |
|---|---|---|
| නිෂ්පාදිත තොග | **25,276,212** | 25,909,936 |
| අමතර කොටස් හා පාරිභෝජ්‍ය දෑ | **7,447,110** | 9,199,581 |
| යෙදවුම් අමුද්‍රව්‍ය | **6,619,387** | 4,748,123 |
| පවතින පැළතවාන් | **2,702,082** | 1,053,111 |
| පශු සම්පත් | **460,182** | 600,051 |
| අනෙකුත් තොග | **868,500** | 399,135 |
| | **43,373,473** | 41,909,937 |

## 17 කෙටිකාලීන ව්‍යාපෘතීන් සඳහා ඉදිරියට ගෙවූ වියදම්

| | | |
|---|---|---|
| විසිතුරු පත්‍ර සහ පැළ ව්‍යාපෘතිය - අත්තනගල්ල | **12,512,380** | 9,399,286 |
| අන්නාසි | **191,378** | 504,324 |
| මඤ්ඤොක්කා | **103,177** | - |
| වෙනත් | **40,208** | 360,361 |
| | **12,847,143** | 10,263,971 |

| | | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|---|
| | | රු. | රු. |

## 18 වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

| | | | |
|---|---|---|---|
| | වෙළෙඳ ණයගැතියෝ | 45,662,620 | 51,943,982 |
| | අනෙකුත් ලැබිය යුතු දෑ | | |
| | ලැබිය යුතු පොලී | 7,951,946 | 15,430,991 |
| | සුළු ණයගැතියෝ | 3,225,732 | 733,533 |
| | සේවක ණය | 1,673,310 | 1,591,688 |
| | | 58,513,608 | 69,700,194 |
| | බොල් හා අඩමාණ ණය සඳහා වෙන් කිරීම් | (1,721,531) | (1,636,534) |
| | | 56,792,077 | 68,063,660 |

## 19 කෙටි කාලීන ආයෝජකයන්

| | | | |
|---|---|---|---|
| | ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව | 65,000,000 | 40,000,000 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 45,000,000 | 38,000,000 |
| | ස්ථාවර තැන්පතු - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 160,000,000 | 118,000,000 |
| | විශ්‍රාම පාරිතෝෂික අරමුදල - මහජන බැංකුව | 130,000,000 | 130,000,000 |
| | | 400,000,000 | 326,000,000 |

## 20 මුදල් හා මුදල්වලට සමාන දෑ

| | | | |
|---|---|---|---|
| | අතැති මුදල් | 1,002,855 | 298,284 |
| | බැංකු මුදල් | 4,698,670 | 2,438,289 |
| | භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මිලදී ගැනිම | 4,000,000 | 7,000,000 |
| | තැපැල් හා මුද්දර | 8,013 | 5,088 |
| | | 9,709,538 | 9,741,661 |

## 21 ස්කන්ධ ප්‍රාග්ධනය

| | | | |
|---|---|---|---|
| | නිකුත් කල සහ සම්පූර්ණයෙන් ගෙවා නිමකල | | |
| | රු. 10/= සාමාන්‍ය කොටස් 20,000,000 | 200,000,000 | 200,000,000 |
| | රු. 10/= ස්වර්ණමය කොටස් 01 (සටහන 21.1) | 10 | 10 |
| | | 200,000,010 | 200,000,010 |

## 21.1 ස්වර්ණමය කොටස්කරු

ස්වර්ණමය කොටසෙහි හිමිකාරත්වය වර්තමානයේදී භාණ්ඩාගාර ලේකම්වරයා විසින් දරණු ලබන අතර එහි අයිතිය සෘජුව ශ්‍රී ලංකා රජය මගින් හෝ 100% රජයේ හිමිකාරීත්වය සහිත පොදු සමාගමක් මගින් හෝ දැරිය හැකිය. සාමාන්‍ය කොටස්කරුවන්ට ඇති හිමිකම් වලට අමතරව විශේෂ හිමිකම් ස්වර්ණමය කොටස්කරු සතුව වේ.

| | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|
| | රු. | රු. |

## 22 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් - පාරිතෝෂික

| | | |
|---|---|---|
| වර්ෂ ආරම්භක දිනට ශේෂය | **124,782,559** | 122,612,895 |
| වර්ෂය තුළ අයකිරීම් | **24,797,684** | 22,809,682 |
| වර්ෂය තුළ කල ගෙවීම් සහ ගෙවිය යුතු ගිණුමට මාරුකිරීම් | **(25,031,833)** | (20,640,018) |
| වර්ෂය අවසාන දිනට ශේෂය | **124,548,410** | 124,782,559 |

2014 දෙසැම්බර් 31 දිනය ආයුගණක තක්සේරුකරු විසින් නිකුත් කළ ආයුගණක වාර්තාව අනුව, ගිවිසුම්ගත විශ්‍රාමික ප්‍රතිලාභවල වර්තමාන ආයුගණක අගය රු. 124,548,410/= කි. වසර 05 ක අවම සේවා කාලය සපුරා ඇති නමුත් වසර 10ට අඩු සේවා කාලයක් සහිත දෛනික වැටුප් ලබන සේවකයින් සඳහා සම්පූර්ණ කරන ලද සෑම වසරක් සඳහාම දින 14ක වැටුපක් සහ මාසික වැටුප් ලබන සේවකයන් හට සම්පූර්ණ කරන ලද සෑම වසරක් සඳහාම අවසාන වරට ලැබූ මාසික වැටුපෙන් භාගයක් හෝ වසර 10ට වැඩි සේවා කාලයක් සහිත සේවකයින් සඳහා දින 28ක වැටුප හෝ එක් මාසයක වැටුප මත පදනම්ව සම්පූර්ණ කරන ලද සෑම සේවා වසරක් සඳහාම සමාගම පාරිතෝෂික ලබාදෙන්නේනම්, එම වගකීම රු. 132,757,680/= වනු ඇත. මේ නිසා වාර්තා කරන දිනට රු. 8,209,270/= ක අසම්භාව්‍ය බැරකමක් පවතින අතර එය සමාගමේ අඛණ්ඩතාවය අවසන් වන්නේනම් පමණක් උද්ගතවනු ඇත.

ප්‍රතිලාභ අගය කිරීම සඳහා ආයුගණකයින් භාවිතා කළ ඇගයීමේ ක්‍රමය වන්නේ "සේවක ප්‍රතිලාභ" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 විසින් නිර්දේශ කළ ක්‍රමය වන "යෝජිත ඒකක ණය ක්‍රමයයි." විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම පිළිබඳ ආයුගණක ඇගයීම 2014 දෙසැම්බර් 31 දින සීමිත ආයුගණක හා කළමනාකරණ උපදේශක සමාගම විසින් සිදුකරන ලදී.

## 22.1 වසර තුල විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම වෙනස් වූ ආකාරය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| පොලී පිරිවැය | **12,478,256** | 11,332,296 |
| වත්මන් සේවා පිරිවැය | **11,636,335** | 12,261,290 |
| පුද්ගලික පිරිවැය එකතුව (සටහන 07) | **24,114,591** | 23,593,586 |
| කඩිනමින් හඳුනාගත් ශුද්ධ (ලාභ)/ අලාභ | **683,093** | (783,904) |
| විස්තීර්ණ ආදායම තුල හඳුනාගත් මුළු වියදම | **683,093** | (783,904) |
| | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගත් වියදම | **24,797,684** | 22,809,682 |

## 22.2 ඇක්චූරියල් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් පුද්ගලික සමාගම මගින යොදාගැනුනු ප්‍රධාන උපකල්පන

### 22.2.1 මූල්‍යමය උපකල්පන

| | | |
|---|---|---|
| පොලී අනුපාතය | | 10% වාර්ෂික ( 2013 - 10% ) |
| වැටුප් වැඩිවීමේ අනුපාතය | වතු කාර්ය මණ්ඩලය | වාර්ෂික වැඩිවීම 2%, ඊළඟ වැටුප් වැඩිවීම 01/06/2015 |
| | විධායක නිලධාරින් | වාර්ෂික වැඩිවීම 2%, ඊළඟ වැටුප් වැඩිවීම 01/06/2015 |
| | විධායක නොවන නිලධාරින් | වාර්ෂික වැඩිවීම 3%, ඊළඟ වැටුප් වැඩිවීම 01/06/2015 |
| | දෛනික වැටුප් ලබන සේවකයන් | වාර්ෂික වැඩිවීම 9%, ඊළඟ වැටුප් වැඩිවීම 01/06/2015 |

### 22.2.2 ප්‍රජා ව්‍යාප්ති උපකල්පන

ඉහත දක්වන ලද මූල්‍යමය උපකල්පන වලට අමතරව මාතෘත්වය, ඉවත් වීම්, ආබාධිත තත්ත්වයන් සහ විශ්‍රාම ගැනීමේ වයස වැනි ප්‍රජා ව්‍යාප්ති උපකල්පන ද මෙහිදී භාවිත කෙරිණි. සමාගමෙහි පාරිතෝෂික වගකීම ඇස්තමේන්තු කිරීම සඳහා ලන්ඩන් ඇක්චූරියස් ආයතනය මගින් නිකුත් කරන ලද A 67/70, වගුව භාවිත කර ඇත.

| | | |
|---|---|---|
| **විශ්‍රාම ලැබීමේ වයස** | පුරුෂ/ස්ත්‍රී | අවුරුදු 60 |

ඉහත සඳහන් රු 25,031,833 ක වටිනාකම තුල සඳහා පාරිතෝෂික ගෙවීම් ලෙස කරන ලද රු. 23,545,160 ක් සහ ගෙවිය යුතු ගිණුමට මාරු කරන ලද රු. 1,486,673 ක් ඇතුළත් වේ.

සමාගම මගින් එහි අඛණ්ඩ පැවැත්ම තහවුරු කෙරෙනු ඇත . පාරිතෝෂික වගකීම සඳහා අරමුදල් සම්පාදනය සම්පූර්ණයෙන්ම අභ්‍යන්තරව සිදුකෙරේ.

| | | **31.12.2014** | 31.12.2013 |
|---|---|---|---|
| | | **රු.** | රු. |
| **23** | **බදු හිමියන් සඳහා ඇති ශුද්ධ වගකීම්** | | |
| | දළ කල්බදු වගකීම | **249,405,031** | 257,591,031 |
| | අඩු කළා: අනාගත කාලපරිච්ඡේදය සඳහා ආදාල පොලී වියදම | **(140,763,418)** | (145,384,214) |
| | ශුද්ධ කල්බදු වගකීම | **108,641,613** | 112,206,817 |
| | අඩු කළා : නිදහස් කරන ලද ඉඩම් වල වටිනාකම | **(37,297,388)** | (37,297,388) |
| | | **71,344,225** | 74,909,429 |

| | 31.12.2014<br>රු. | 31.12.2013<br>රු. |
|---|---|---|
| **අ) වසර 5 කට පසු ගෙවිය යුතු (උපචිත)** | | |
| දළ වගකීම් | **208,475,031** | 216,661,031 |
| අඩු කළා: අනාගත කාලපරිච්ඡේදය සඳහා ආදාල පොලී වියදම | **(117,659,438)** | (122,280,234) |
| ශුද්ධ වගකීම් | **90,815,593** | 94,380,797 |
| අඩු කළා : නිදහස් කරන ලද ඉඩම් වල වටිනාකම | **(37,297,388)** | (37,297,388) |
| | **53,518,205** | 57,083,409 |
| **ආ) වසර 2 සිට 5 දක්වා ගෙවිය යුතු (උපචිත)** | | |
| දළ වගකීම් | **32,744,000** | 32,744,000 |
| අඩු කළා: අනාගත කාලපරිච්ඡේදය සඳහා ආදාල පොලී වියදම | **(18,483,184)** | (18,483,184) |
| ශුද්ධ වගකීම් | **14,260,816** | 14,260,816 |
| **ඇ) වසරක් තුළ ගෙවිය යුතු (උපචිත)** | | |
| දළ වගකීම් | **8,186,000** | 8,186,000 |
| අඩු කළා: අනාගත කාලපරිච්ඡේදය සඳහා ආදාල පොලී වියදම | **(4,620,796)** | (4,620,796) |
| ශුද්ධ වගකීම් | **3,565,204** | 3,565,204 |
| | **71,344,225** | 74,909,429 |

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හදිසි වැඩ පැවරුම් බලකාය මගින් ඉඩම් බදු දීම් වලට අදාලව නිකුත් කර ඇති රීතීන්ට අනුව, බදු හිමියාට ඇති වගකීම/ බැඳීම කොටස් දෙකකින් සමන්විතය. එනම් බදු වාරික වල වාර්තමාන අගය සහ විලම්භනය කළ පොලී ප්‍රමාණයයි. ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීම සඳහා 4% වට්ටම් අනුපාතය යොදා ගෙන ඇත. ගෙවන ලද බදු වාරික වල වටිනාකම (විචල්‍ය බදු කුලී ප්‍රමාණය හැර) බදු කරුට ඇති දළ වාරික වගකීමෙන් අඩු කර ඇති අතර පොලී ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයට වියදමක් සේ ගලපා ඇත.

ඉඩම් බදු ගිවිසුම 1996 ජූනි 18 වන දින සිට බලපාන පරිදි සංශෝධනය කිරීමත් සමඟ ඊට පෙර එක් වතුයායක් වෙනුවෙන් ගෙවූ රු. 500/- ක නාමික බදු කුලියෙහි විශාල වැඩිවීමක් සිදු විය. ප්‍රථමයෙන්ම, 1996 ජූනි 18 සිට 1997 ජූනි 17 දක්වා වන වර්ෂය සඳහා සංශෝධිත පදනම යටතේ බදු කුලී ගෙවූ අතර එය රුපියල් 8,186,000/- විය. මෙම අගය වාර්ෂිකව දළ දේශිය නිෂ්පාදන අවධමනකයෙන් ඉහළ යන අතර එය විචල්‍ය බදු කුලියක ස්වභාවය ගනු ලබයි.

2045 ජූනි 18 වන දිනෙන් අවසන් වන තුරු එළඹෙන සෑම මාස 12 කට වරක්ම ගෙවිය යුතු බදු ප්‍රමාණය වන්නේ පෙර වර්ෂයේ දළ දේශීය නිෂ්පාදන අවධමනකය ගැලපූ ප්‍රවර්ථන වර්ෂයේ අවසන් කාර්තු දෙකෙහි බදු වාරික වල වටිනාකමට ප්‍රවර්ථක වර්ෂයේ දළ දේශිය නිෂ්පාදන අවධමනය ගැලපූ ඉදිරි වර්ෂයේ ප්‍රථම කාර්තු දෙකෙහි බදු වාරික වල වටිනාකමට එකතු කිරීමෙනි. ප්‍රවර්ථන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුල රුපියල් 24,844,072/- ක් බදු පොලී වියදම් ලෙස අඩුකර ඇති අතර එහි ස්ථාවර බදු වාරික තුල අන්තර්ගත පොලී ප්‍රමාණය සහ විචල්‍ය බදු පොලී ප්‍රමාණයක් අන්තර්ගත වේ.

සමාගම රජයේ නිර්දේශ මත රජය වෙනුවෙන් පොල් වගා කිරීමේ මණ්ඩලයට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට, දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරියට සහ වෙනත් පාර්ශවයන් වෙත නිදහස් කරණ ලද ඉඩම් වල වටිනාකම, එම ඉඩම් ජනවසමින් පවරා ගත් වටිනාකමට ගණනය කර ඇති අතර එහි වටිනාකම රු. 37,297,388/- කි. බදුකරුට ඇති වගකීම, මෙම නිදහස් කරන ලද ඉඩම්ද ඇතුලත්ව ජනවසමින් බාර දුන් සමස්ථ වත්කම් සඳහා ගණනය කර ඇති හෙයින්ද මේ වන විට මෙම ඉඩම් සමාගම සතුව නොමැති හෙයින්ද නිදහස් කරන ලද ඉඩම් වල වටිනාකම බදුකරුට ඇති වගකීමෙන් අඩු කර දක්වයි. කෙසේ වුවත් මෙම අඩු කිරීම සඳහා රාජ්‍ය බල අධිකාරියකින් එකඟත්වයක් ලබා දී නොමැත.

| | | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|---|
| | | රු. | රු. |

## 24 විලම්භිත බදු වගකීම

| | | | |
|---|---|---|---|
| | වර්ෂ ආරම්භක දිනට ශේෂය | **55,944,676** | 51,177,581 |
| | වසරතුළ අයකිරීම් | **9,376,416** | 4,767,095 |
| | වර්ෂය අවසාන දිනට ශේෂය | **65,321,092** | 55,944,676 |

### 24.1 හඳුනාගත් විලම්භිත බදු වත්කම් සහ වගකීම්

පහත දැක්වෙන තාවකාලික වෙනස්වීම් ඇතිකරන්නාවූ මූලයන්ට එරෙහිව විලම්භිත බදු වත්කම් සහ වගකීම් හඳුනාගෙන ඇත.

බදුවන/ අඩුකළ හැකි තාවකාලික වෙනස්වීම්:

| | | | |
|---|---|---|---|
| | මේරූ ජෛව වත්කම් | **(705,525,471)** | (632,375,347) |
| | දේපළ පිරියත හා උපකරණ | **(73,955,397)** | (53,490,509) |
| | අඩමාණ ණය ගැතියන් සඳහා වෙන් කිරීම් | **1,721,531** | 1,636,534 |
| | විශ්‍රාම පාරිතෝෂික | **124,548,410** | 124,782,559 |
| | | **(653,210,927)** | (559,446,763) |
| | ආදාල බදු අනුපාතය | **10%** | 10% |
| | ශුද්ධ විලම්භිත බදු වගකීම් | **(65,321,092)** | (55,944,676) |

සමාගම, මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට රුපියල් 12,626,944/- ක විලම්භිත බදු වත්කමක් හඳුනාගෙන ඇත. මෙම බදු වත්කම අනාගතයේදී ඇතිවන්නා වූ බදුවන ලාභයට එරෙහිව උපලබ්ධි වන බව කළමනාකරණයෙහි විශ්වාසයයි. එමෙන්ම විලම්භිත බදු බැරකම අනාගතයේදී පනවන බදු ප්‍රතිශතයට එරෙහිව ප්‍රත්‍යාගණනය කරනු ලබයි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 වන දිනට විලම්භිත බදු බැරකම ප්‍රතිශෝධනය කරමින් නැවත අගය කරන ලද අතර එහි වටිනාකම රු. 77,948,087/- කි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 වන දිනට ශුද්ධ විලම්භිත බදු බැරකම රු. 65,321,092/-කි.

**ඉදිරියට බලපවත්වන බදු අනුපාතය**

බදු උපදේශකයින්ගේ අදහස අනුව සමාගම මගින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු මගින් උපයන ලද ලාභය 'කෘෂිකාර්මික' කටයුතු වලින් ලද ලාභය වශයෙන් සැලකිය හැකි අතර එය 2011/04/01 දිනෙන් ඇරඹෙන තක්සේරු වසරේ සිට 10%ක ආදායම් බද්දකට යටත් වනු ඇත.

## 25 අත්තිකාරම් ලැබීම්

| | | | |
|---|---|---|---|
| | බදු කුලී සඳහා | **512,427** | 669,719 |
| | විසිතුරු පත්‍ර හා පැළ සැපයීම සඳහා | **323,925** | 1,006,154 |
| | රක්ෂණ වන්දි ලැබීම - ගිනි රක්ෂණ වන්දි | **112,000** | - |
| | | **948,352** | 1,675,873 |

| | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|
| | රු. | රු. |

## 26 වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

| | | |
|---|---|---|
| ගෙවිය යුතු වෙළෙඳ ණය | **1,225,072** | 1,750,133 |
| ගෙවිය යුතු ප්‍රසාද මුදල | **12,468,154** | 8,814,909 |
| ගෙවිය යුතු කාර්ය සාධන දිරිදීමනා | **28,820,099** | 27,378,619 |
| නිවාඩු පඩි සඳහා වෙන් කිරීම් | **5,192,290** | 4,555,416 |
| ආපසු ගෙවන ටෙන්ඩර්, ආරක්ෂක සහ රඳවා ගැනීමේ තැන්පතු | **10,190,906** | 9,586,253 |
| උපචිත වියදම්ද ඇතුළුව වෙනත් ණය හිමියෝ | **20,558,701** | 27,035,203 |
| | **78,455,222** | 79,120,533 |

## 27 ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනය වන විට සමාගම සතුව කිසිදු ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීමක් නොපැවතිණි.

## 28 වාර්තා කරන දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපීම් කිරීමට හෝ අනාවරණය කිරීමට හෝ අවශ්‍ය වන ආකාරයේ කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් වාර්තා කරන දිනයෙන් පසු සිදුවී නොමැත.

## 29 මූල්‍යමය අවදානම් කළමනාකරණය

**විමර්ශනය**

සිය මූල්‍යමය උපකරණ භාවිතයේදී සමාගම පහත දැක්වෙන අවදානම් වලට නිරාවරණය විය.

* ණය අවදානම

* ද්‍රවශීලතා අවදානම

* වෙළෙඳ පොළ අවදානම් (මුදල් ඒකක අවදානම සහ පොලී අනුපාත අවදානමද ඇතුළුව)

මෙම සටහන මගින් ඉහත එක් එක් අවදානම සඳහා සමාගමෙහි ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු සහ අවදානම් මැනීම සහ කළමනාකරණය වෙනුවෙන් වන සමාගමෙහි අරමුණු ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග දැක්වේ.

**අවදානම් කළමනාකරණ ආකෘතික රාමුව**

මෙය ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන සමස්ථ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. සමාගමෙහි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන්, සමාගම මුහුණ දෙන අවදානම් හඳුනාගැනීම, විශ්ලේෂණය හා ඒ තුලින් අවදානම් සීමා ඇති කිරීම හා පාලනය තහවුරු කරයි

**ණය අවදානම**

ණය අවදානම යනු කිසියම් ගනුදෙනුකරුවෙකු හෝ ප්‍රති පාර්ශවයක් මගින් සිය ගිවිසුම් ගත වගකීම් ඉටු කිරීමට අපොහොසත් වීමෙන් සමාගමට අත්වන මූල්‍යමය අලාභය වන අතර මෙය මූලිකවම සමාගම වෙත ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් සහ ආයෝජන සුරැකුම් ආශ්‍රිතව උද්ගත වේ.

මූල්‍යමය වත්කම් වල පවතින වටිනාකම මගින් උපරිම ණය අවදානම් නිරාවරණය නියෝජනය කෙරේ. වාර්තා කරන දිනයේදී උපරිම ණය අවදානම් නිරාවරණය පහත දැක්වෙන පරිදි වේ.

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| **ණය සහ ලැබිය යුතු දෑ** | | |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | **56,792,077** | 68,063,660 |
| කෙටි කාලීන ආයෝජන | **400,000,000** | 326,000,000 |
| මුදල් හා මුදල් සමාන දෑ | **9,709,538** | 9,741,661 |
| | **466,501,615** | 403,805,321 |

**ද්‍රවශීලතා අවදානම**

ද්‍රවශීලතා අවදානම යනු සමාගම මගින් මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් යොදා ගනිමින් පියවනු ලබන මූල්‍යමය වගකීම් පියවා දැමීමට නොහැකි තත්ත්වයක් ඇතිවීමේ අවදානමයි. මෙම අවදානම කළමනාකරණය යනු සාමාන්‍ය හෝ අසීරු තත්ත්වයන්හිදී සමාගමට සිය වගකීම් පියවීම් සඳහා වන ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වා ගැනීමයි.

ද්‍රවශීලතා අවදානම මගහරවා ගැනීම සඳහා මෙහෙයුම් ක්‍රියා කාරකම් තුලින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහය සමීපව අධීක්ෂණය කරමින් මුදල් සහ මුදල් සමාන දෑ මට්ටම ප්‍රමාණාත්මකව පවත්වා ගැනිමට හා මූල්‍ය ආයතන මගින් ආරක්ෂිත ණය පහසුකම් ලබා ගැනිමට කටයුතු කරයි.

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| ව්‍යුත්පන්න නොවන මූල්‍යමය වගකීම් | | |
| බදු හිමියන්ගේ ශුද්ධ වගකීම් | **71,344,225** | 74,909,429 |
| වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | **78,455,222** | 79,120,533 |
| | **149,799,447** | 154,029,962 |

**වෙළෙඳ පොළ අවදානම**

වෙළෙඳ පොළ අවදානම යනු විදේශ විනිමය අනුපාත, පොලී අනුපාත සහ වෙළෙඳ පොළ මිල ගණන් වෙනස්වීමේ අවදානමයි. එමගින් සමාගමෙහි අදායම හෝ රඳවාගත් මූල්‍යමය උපකරණයන්හි වටිනා කම වෙනස්විම කෙරෙහි බලපෑම් ඇතිවිය හැක. වෙළෙඳ පොළ අවදනානම කළමනාකරණයේ අරමුණ වන්නේ අවදානම පාලනය කරමින් ආදායම උපරිම කරගැනීමයි

**පොලී අනුපාත අවදානම**

මෙමගින් හැඳින්වෙන්නේ වෙළෙඳ පොළ පොලී අනුපාතයන් වෙනස්වීම හේතුවෙන් මූල්‍යමය උපරණයන්හි අනාගත මුදල් ප්‍රවාහ උච්චාවචනය වීමේ අවදානමයි. වෙළෙඳ පොළ පොලී අනුපාතයන් වෙනස් වීමේ අවදානමට සමාගම ලක් වනුයේ මූලිකව සමාගමෙහි දිගු කාලීන ණය වගකීම සහ පාවෙන පොලී අනුපාතයන් සහිත අයෝජනයන්ය.

කෙසේවුවද වාර්තා කරන දිනය වන විට සමාගම සතුව දිගුකාලීන පාවෙන අනුපාත සහිත ණය ගැනීම් හෝ තැන්පතු නොපැවතිණි.

# දස වසරක සාරාංශය

| | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | **2014** |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පොල් | | | | | | | | | | |
| නිෂ්පාදනය (ගෙඩි) | 11,368,921 | 15,914,656 | 15,404,540 | 15,010,322 | 17,309,128 | 15,474,602 | 15,543,555 | 18,103,053 | 13,000,150 | **16,701,797** |
| ශුද්ධ විකුණුම් සාමාන්‍ය (ගෙඩි 1000 කට) | 11,868 | 10,150 | 16,099 | 20,387 | 16,896 | 22,904 | 25,680 | 22,327 | 30,926 | **30,647** |
| නිෂ්පාදන පිරිවැය (ගෙඩි 1000 කට) | 7,935 | 7,780 | 9,005 | 11,691 | 9,627 | 12,364 | 12,872 | 13,531 | 16,386 | **15,984** |
| | | | | | | | | | | |
| රබර් | | | | | | | | | | |
| නිෂ්පාදන (කි. ග්‍රෑ.) | 135,441 | 180,142 | 203,034 | 207,512 | 202,680 | 200,778 | 227,977 | 209,898 | 188,934 | **157,474** |
| නිෂ්පාදන පිරිවැය (කි. ග්‍රෑ. 1 කට) | 130 | 185 | 214 | 222 | 183 | 348 | 457 | 371 | 330 | **252** |
| ලාභය (කි. ග්‍රෑ. 1 කට) | 115 | 113 | 132 | 156 | 149 | 185 | 200 | 213 | 256 | **267** |
| | | | | | | | | | | |
| ඉපයුම් උද්ධෘතයන් | | | | | | | | | | |
| ආදායම | | | | | | | | | | |
| පොල් | 134,922,847 | 161,539,826 | 247,991,075 | 306,021,001 | 292,448,058 | 354,436,203 | 399,151,639 | 404,191,573 | 402,365,395 | **514,176,778** |
| රබර් | 17,587,575 | 33,326,923 | 43,497,656 | 46,103,417 | 36,999,577 | 69,911,163 | 104,284,153 | 77,964,363 | 62,405,810 | **39,698,357** |
| වෙනත් | 1,308,866 | 1,752,429 | 2,055,309 | 8,171,751 | 8,023,084 | 6,417,504 | 6,450,097 | 9,663,550 | 11,118,970 | **22,915,639** |
| | 153,819,288 | 196,619,178 | 293,544,040 | 360,296,169 | 337,470,719 | 430,764,870 | 509,885,889 | 491,819,486 | 475,890,175 | **576,790,774** |
| | | | | | | | | | | |
| විකුණුම පිරිවැය | | | | | | | | | | |
| පොල් | (90,213,955) | (123,814,515) | (138,723,789) | (175,492,646) | (166,631,038) | (191,322,313) | (200,075,494) | (244,948,017) | (213,015,395) | **(266,963,038)** |
| රබර් | (15,598,550) | (20,385,806) | (26,817,758) | (32,341,535) | (30,296,350) | (37,072,837) | (45,615,137) | (44,646,298) | (48,417,543) | **(42,054,702)** |
| වෙනත් | (1,178,728) | (1,857,713) | (3,824,407) | (8,070,797) | (8,377,449) | (6,879,815) | (6,762,242) | (7,688,806) | (7,363,880) | **(16,972,939)** |
| | (106,991,233) | (146,058,034) | (169,365,954) | (215,904,978) | (205,304,837) | (235,274,965) | (252,452,873) | (297,283,121) | (268,796,818) | **(325,990,679)** |
| දළ ලාභය | 46,828,055 | 50,561,144 | 124,178,086 | 144,391,191 | 132,165,882 | 195,489,905 | 257,433,016 | 194,536,365 | 207,093,357 | **250,800,095** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 17,763,828 | 23,977,560 | 28,456,198 | 36,529,836 | 55,808,066 | 41,112,867 | 63,714,382 | 89,353,353 | 95,827,085 | **103,029,740** |
| පරිපාලන හා පොදු වියදම් | (30,619,580) | (35,595,006) | (55,657,826) | (69,506,682) | (72,962,545) | (73,440,475) | (89,787,664) | (107,147,020) | (109,250,679) | **(131,150,183)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ලාභය** | 33,972,303 | 38,943,698 | 96,976,458 | 111,414,346 | 115,011,403 | 163,162,297 | 231,359,734 | 176,742,698 | 193,669,763 | **222,679,652** |
| | | | | | | | | | | |
| පොලී ආදායම | - | 376,774 | 3,373,863 | 9,236,529 | 11,386,989 | 18,103,874 | 22,232,991 | 38,200,820 | 44,336,994 | **31,342,319** |
| පොලී වියදම | (14,215,915) | (16,027,368) | (18,326,367) | (20,464,060) | (23,602,575) | (26,737,125) | (28,429,380) | (21,892,306) | (24,377,772) | **(26,007,038)** |
| ශුද්ධ මූල්‍ය ආදායම/ (වියදම) | (14,215,915) | (15,650,594) | (14,952,504) | (11,227,531) | (12,215,586) | (8,633,251) | (6,196,389) | 16,308,514 | 19,959,222 | **5,335,281** |
| | | | | | | | | | | |
| බදු පෙර ලාභය | 19,756,388 | 23,293,104 | 82,023,954 | 100,186,815 | 102,795,817 | 154,529,046 | 225,163,345 | 193,051,212 | 213,628,985 | **228,014,933** |
| | | | | | | | | | | |
| ආදායම් බදු වියදම | - | - | (371,632) | (3,269,984) | (7,693,412) | (13,058,661) | (33,126,698) | (15,784,867) | (5,483,047) | **(13,776,911)** |
| | | | | | | | | | | |
| **වර්ෂය සඳහා ලාභය** | 19,756,388 | 23,293,104 | 81,652,322 | 96,916,831 | 95,102,405 | 141,470,386 | 192,036,647 | 177,266,345 | 208,145,938 | **214,238,022** |
| | | | | | | | | | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | - | - | - | - | 6,839,858 | 783,904 | **(683,093)** |
| | | | | | | | | | | |
| වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම | 19,756,388 | 23,293,104 | 81,652,322 | 96,916,831 | 95,102,405 | 141,470,386 | 192,036,647 | 184,106,203 | 208,929,842 | **213,554,929** |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ උද්ධෘතයන්** | | | | | | | | | | |
| **වත්කම්** | | | | | | | | | | |
| ජංගම නොවන වත්කම් | 496,514,530 | 524,408,813 | 563,810,934 | 596,585,296 | 624,315,272 | 692,832,173 | 857,362,895 | 991,947,684 | 1,143,266,952 | **1,253,528,271** |
| ජංගම වත්කම් | 46,018,142 | 72,423,762 | 108,220,975 | 177,926,604 | 240,573,754 | 354,097,893 | 476,633,700 | 459,074,756 | 473,180,784 | **540,658,625** |
| මුළු වත්කම් | 542,532,672 | 596,832,575 | 672,031,909 | 774,511,900 | 864,889,026 | 1,046,930,066 | 1,333,996,595 | 1,451,022,440 | 1,616,447,736 | **1,794,186,896** |
| **හිමිකම් හා වගකීම්** | | | | | | | | | | |
| ප්‍රාග්ධනය සහ සංචිත | | | | | | | | | | |
| ස්කන්ධ ප්‍රාග්ධනය | 200,000,010 | 200,000,010 | 200,000,010 | 200,000,010 | 200,000,010 | 200,000,010 | 200,000,010 | 200,000,010 | 200,000,010 | **200,000,010** |
| රඳවාගත් ඉපැයුම් | 113,754,106 | 137,047,210 | 218,699,532 | 305,616,363 | 381,161,381 | 522,631,767 | 644,668,414 | 755,412,408 | 889,230,196 | **1,043,150,677** |
| දැව සංචිත | - | - | - | - | - | - | 111,428,668 | 148,832,548 | 183,160,698 | **203,478,239** |
| වෙනත් සංචිත | - | - | - | - | - | - | - | 6,839,858 | 7,623,762 | **6,940,669** |
| මුළු හිමිකම | 313,754,116 | 337,047,220 | 418,699,542 | 505,616,373 | 581,161,391 | 722,631,777 | 956,097,092 | 1,111,084,824 | 1,280,014,666 | **1,453,569,595** |
| **වගකීම්** | | | | | | | | | | |
| ජංගම නොවන වගකීම් | 149,220,602 | 152,857,977 | 161,196,724 | 165,570,260 | 168,709,437 | 179,951,047 | 201,441,218 | 248,699,905 | 252,071,460 | **257,648,523** |
| ජංගම වගකීම් | 79,557,954 | 106,927,378 | 92,135,643 | 103,325,267 | 115,018,198 | 144,347,242 | 176,458,285 | 91,237,711 | 84,361,610 | **82,968,778** |
| මුළු වගකීම් | 228,778,556 | 259,785,355 | 253,332,367 | 268,895,527 | 283,727,635 | 324,298,289 | 377,899,503 | 339,937,616 | 336,433,070 | **340,617,301** |
| මුළු හිමිකම හා වගකීම | 542,532,672 | 596,832,575 | 672,031,909 | 774,511,900 | 864,889,026 | 1,046,930,066 | 1,333,996,595 | 1,451,022,440 | 1,616,447,736 | **1,794,186,896** |
| **මුදල් ප්‍රවාහ පිළිබඳ උද්ධෘතයන්** | | | | | | | | | | |
| වර්ෂ ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ | (6,730,864) | 8,157,250 | 26,078,378 | 48,112,932 | 74,595,894 | 162,149,036 | 274,978,693 | 321,380,740 | 325,659,031 | **335,741,661** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ | 62,412,220 | 70,174,487 | 106,019,826 | 82,236,880 | 170,228,691 | 206,895,556 | 196,643,897 | 203,658,090 | 228,933,956 | **264,205,081** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ** | | | | | | | | | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල | 49,888 | 433,737 | 2,549,106 | 2,184,984 | 13,580,463 | 14,467,425 | 25,662,626 | 35,036,688 | 42,100,470 | **38,889,648** |
| දේපල පිරියත උපකරණ අත්පත් කර ගැනීම් | (31,780,800) | (37,014,222) | (55,705,246) | (53,012,978) | (52,461,092) | (92,326,212) | (81,628,173) | (164,809,564) | (186,700,542) | **159,579,219** |
| | (31,730,912) | (36,580,485) | (53,156,140) | (50,827,994) | (38,880,629) | (77,858,787) | (55,965,547) | (129,772,876) | (144,600,072) | **(120,689,571)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ** | | | | | | | | | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් | 1,782,355 | 257,088 | 264,960 | 316,700 | 1,371,410 | 1,569,447 | 1,099,614 | 4,290,173 | 6,422,291 | **6,933,143** |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලට යෙදූ මුදල් | (17,575,549) | (15,929,962) | (31,094,092) | (5,242,624) | (45,166,329) | (17,776,559) | (95,375,917) | (73,897,096) | (80,673,545) | **76,480,776** |
| | (15,793,194) | (15,672,874) | (30,829,132) | (4,925,924) | (43,794,919) | (16,207,112) | (94,276,303) | (69,606,923) | (74,251,254) | **(69,547,633)** |
| **වර්ෂ අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ** | 8,157,250 | 26,078,378 | 48,112,932 | 74,595,894 | 162,149,036 | 274,978,693 | 321,380,740 | 325,659,031 | 335,741,661 | **409,709,538** |
| ලාභාංශ | - | - | 10,000,000 | 20,000,000 | 30,000,000 | 40,000,000 | 50,000,000 | 40,000,000 | 40,000,000 | **45,000,000** |
| දළ ලාභ ආන්තිකය | 30% | 26% | 42% | 40% | 39% | 45% | 50% | 40% | 44% | **43%** |
| ශුද්ධ ලාභ ආන්තිකය | 13% | 12% | 28% | 27% | 28% | 33% | 38% | 36% | 44% | **37%** |
| ප්‍රාග්ධන ඉපැයුම් අනුපාතය | 7% | 7% | 22% | 21% | 18% | 22% | 25% | 20% | 20% | **18%** |
| ජංගම වත්කම් අනුපාතය | 0.58 | 0.68 | 1.17 | 1.72 | 2.09 | 2.45 | 2.70 | 5.03 | 5.61 | **6.52** |
| කොටසක ඉපයුම | 0.99 | 1.16 | 4.08 | 4.85 | 4.76 | 7.07 | 9.60 | 9.21 | 10.41 | **10.71** |
| කොටසක ශුද්ධ වත්කම | 15.69 | 16.85 | 20.93 | 25.28 | 29.06 | 36.13 | 47.80 | 55.55 | 64.00 | **72.68** |

# වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය

පහත සඳහන් අරමුණු වෙනුවෙන් කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2015 ජූනි මස 26 වැනි සිකුරාදා දින ප.ව. 12.30ට කුරුණෑගල, දඹුල්ල පාර, අංක 80 දරණ ස්ථානයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කර සිටිමු.

1. අධ්‍යක්ෂක මණ්ඩලයේ සහ විගණකවරුන්ගේ වාර්තාව සමඟින් 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සහ සම්මත කිරීම.

2. 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ විගණකවරුන් වශයෙන් දයානන්ද සමරවික්‍රම සහ සමාගම (වරලත් ගණකාධිකාරිවරු) නැවත පත්කර ගැනීම.

3. 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන ලාභයෙන් රුපියල් 45,000,000ක අවසන් ලාභාංශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම.

4. වෙනත් කරුණු.

කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ නියෝගය පරිදි

**සී/ස. කෝර්පරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම**
ලේකම්වරු

2015 ජූනි මස 02 දින

රැස්වීමට සහභාගිවී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් සහිත කොටස්හිමියෙකුට ඔහු/ඇය වෙනුවෙන් රැස්වීමට සහභාගිවී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නියෝජිතයෙක් පත්කිරීමට හිමිකම ඇත. එම නියෝජිතයා සමාගමේ සාමාජිකයෙක් වීම අවශ්‍ය නැත. මෙම අරමුණ සඳහා භාවිතා කිරීමට පෙරකලාසි ආකෘති පත්‍රයක් අමුණා ඇත.

# පෙරකලාසි අයදුම්පත

පහත අත්සන් තබන ..................................................................................................................................................

පදිංචි ..................................................................................................................................................

මම/අපි, කුරුණෑගල වැවිලි සමාගමේ සාමාජික/සාමාජිකයින් වන,

ජේ.එම්.පියසෝම උපාලි මහතා හෝ

ඩී.පී.විජේසිංහ මහතා හෝ

ඩබ්.ජේ.ඩී.ඩී.එම්. ප්‍රියන්ත මහතා හෝ

ඩබ්.එම්.ඩී.බී.අබේරත්න මහතා හෝ

එච්.ජේ.එන්. සමන් කුමාර මහතා හෝ

සුනිල් එස්. අලස් මහතා හෝ

ඩී.එම්. බණ්ඩාරනායක මහතා හෝ

..................................................................................................................................................

යන අය 2015 ජූනි මස 26 වැනි සිකුරාදා දින ප.ව. 12.30ට පවත්වනු ලබන සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේදී මා/අප නියෝජනය කිරීම සඳහා මාගේ/අපගේ නියෝජිතයා ලෙස සහ මා/අප වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පත්කර සිටිමි/සිටිමු.

කරුණාකර යෝජනා අංකය ඉදිරියෙන් 'X' සළකුණ යොදා ඔබගේ වරණය සඳහන් කරන්න.

| | | පක්ෂ | විපක්ෂ |
|---|---|---|---|
| 1 | අධ්‍යක්‍ෂක මණ්ඩලයේ සහ විගණකවරුන්ගේ වාර්තාව සමඟින් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සහ සම්මත කිරීම. | ☐ | ☐ |
| 2 | 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ විගණකවරුන් වශයෙන් දයානන්ද සමරවික්‍රම සහ සමාගම (වරලත් ගණකාධිකාරීවරු) නැවත පත්කර ගැනීම. | ☐ | ☐ |
| 3 | 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන ලාභයෙන් රුපියල් 45,000,000ක අවසන් ලාභාංශයක් ප්‍රකාශයට පත්කිරීම. | ☐ | ☐ |
| 4 | වෙනත් කරුණු. | ☐ | ☐ |

2015...................මස.........................වන මෙදින අත්සන් කරන ලදී.

......................................................

අත්සන

කොටස්හිමියාගේ ජාතික හැඳුනුම්පත්/ගමන්බලපත්‍ර/සමාගම් ලි.ප. අංකය.

# පෙරකලාසි අයදුම්පත

**සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

1 පෙරකලාසි අයදුම් පත නිසි පරිදි සම්පූර්ණ කර සපයා ඇති නියමිත ස්ථානයේ අත්සන් තැබීමට සහ දිනය සඳහන් කිරීමට කටයුතු කරන්න.

2 පෙරකලාසි අයදුම් පත ඇටෝර්නි බලය හිමි පුද්ගලයකු විසින් අත්සන් තබා ඇත්නම් සහ එය සමාගමෙහි දැනටමත් ලියාපදිංචි වී නොමැතිනම් පෙරකලාසි අයදුම් පත සමඟ එම ඇටෝර්නි බලපත්‍රයද ඉදිරිපත් කළ යුතු වේ.

3 සම්පූර්ණ කරන ලද පෙරකලාසි අයදුම් පත රැස්වීම පැවැත්වීමට පැය 48 කට පෙර කොළඹ 7, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, අංක 47 දරණ ස්ථානයේ තැන්පත් කළ යුතු වේ.

# ආයතනික තොරතුරු

## සමාගමේ නම

කුරුණෑගල වැවිලි සමාගම

## ලියාපදිංචි කාර්යාලය

අංක 80, දඹුල්ල පාර, කුරුණෑගල.
දුරකථන අංකය: 037 2223133
ෆැක්ස්: 037 2229618
විද්‍යුත් ලිපිනය: kurunegalaplt@sltnet.lk

## සංස්ථාපනය කළ දිනය

1992 ජූනි 18 දින

## සමාගම් ලියාපදිංචි අංකය

PB 1319

## නෛතික තත්ත්වය

පූර්ණ රාජ්‍ය අයිතිය යටතේ ඇති සීමාසහිත පොදු සමාගමකි.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ අණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ පිහිටවූ සීමාසහිත සමාගමක් වන අතර, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියා පදිංචි කර ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| ඒ. එම්. පියසෝම උපාලි මහතා | සභාපති |
| ඩී. එම්. බණ්ඩාරනායක මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| එච්. ඒ. එන්. සමන් කුමාර මහතා | අධ්‍යක්ෂ/<br>මහා භාණ්ඩාගාර නියෝජිත |
| සුනිල් එස් අලස් මහතා | අධ්‍යක්ෂ |
| ඩී. පී. විජේසිංහ මහතා | අධ්‍යක්ෂ |
| ඩබ්. එම්. ඩී. බී. අබේරත්න මහතා | අධ්‍යක්ෂ |
| ඩබ්. ඒ. ඩී. ඩී. එම්. ප්‍රියන්ත මහතා | අධ්‍යක්ෂ |

## බාහිර විගණකවරු

දයානන්ද සමරවික්‍රම සහ සමාගම
වරලත් ගණකාධිකාරිවරු
අංක 20/26, දුම්රියපොළ පටුමග, නුගේගොඩ.
දුරකථනය: 0112 854614, 0112 809650
ෆැක්ස්: 0112 820112
විද්‍යුත් ලිපිනය: dsandco@sltnet.lk

## බැංකුකරුවන්

ලංකා බැංකුව
මහජන බැංකුව
ජාතික ඉතිරි කිරීමේ බැංකුව

## ලේකම්වරු

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම
අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස,
කොළඹ 07.
දුරකථනය: 0112 695782
ෆැක්ස්: 0112 695410

REDWORKS
Designed & produced by REDWORKS
Photography by Studio Times

**කුරුණෑගල වැවිලි සමාගම**
අංක 80, දඹුල්ල පාර, කුරුණෑගල, ශ්‍රී ලංකාව
දුරකථන අංකය: 037 2223133, 037 2223191 ෆැක්ස්: 037 2229618 විද්‍යුත් ලිපිනය: kurunegalaplt@sltnet.lk